ඔව්. මම අද පරන පාර වැහුවා.	Yes. Today I closed the old road.
හෙට අලුත් පාර ඉවර කරන්න පුලුවනි.	Tomorrow I can finish the new road.

MENDIS

බංඩාට සල්ලි හිඟ නම් කියන්න ඕන.	You must tell (us) if you are short of money, Banda.
සුමානෙ ඉවර වෙන කං ඉන්න ඕන නෑ.	You needn't wait till the week is over.
ඇඩ්වාන්ස් එක	the advance
ඕන නම් ඇඩ්වාන්ස් එකක් දෙන්න පුලුවනි.	If necessary I can give you an advance.

BANDA

හොඳය්, මහත්තයා.	Yes, sir.

MENDIS

අලුත් පාරට ගල් ඕන නම් අතනින් ගන්න.	If you need stones for the new road take (them) from there.
හොඳට	well
පාර හොඳට හදන්න ඕන.	You must make the road well
ලොරිය	the truck
ලොරිය ගෙනියන්න තියෙනවා, නේ.	We have to take the truck (on it), don't we?

ඇහෙනවා	hear
ඇහුනා	heard
ඇහුනා ද?	Okay? (Did you hear?)

BANDA

හොඳයි, මහත්තයා.	Yes, sir.

Grammar

1. NEW NOUNS

Class 1

ඇඩ්වාන්ස් එක	'the advance'

Class 2

බංගලාව	'the bungalow'; gen. බංගලාවෙ ; pl. බංගලා, is the residence of a well-to-do person. This word is used for much larger structures than the English "bungalow."
ගෙඩිය	'the fruit, nut'; gen. ගෙඩියෙ ; pl. ගෙඩි
ලොරිය	'the truck'; gen. ලොරියෙ ; pl. ලොරි
ගහ	'the tree'; gen. ගහේ ; pl. ගස්
ගඟ	'the river'; gen. ගඟේ ; pl. ගඟවල් or ගංගා
වැට	'the fence'; gen. වැටේ ; pl. වැටවල්
අයින	'the edge, bank'; gen. අයිනෙ ; pl. අයින්

Class 4

ඊයෙ	'yesterday' (no plural)

Other Nouns

පොල්	'coconuts' (plural only)
දර	'firewood' (plural only)

2. NEW VERBS

ශුද්ධ කරනවා	'clean, clean up'
කපනවා	'cut'
කඩනවා	'pick, break (in two)'
සෝදනවා	'wash' Some people may say හෝදනවා
අදිනවා	'draw'
බඳිනවා	'tie up, build'
වැටෙනවා	'fall'
ඇහෙනවා	'hear'

3. PAST TENSE

Verbs can be divided into three regular classes depending on the formation of the past tense. These classes may be recognized on the basis of the last vowel in the present tense stem. Those verbs with a stem ending in -ə or -a will be called Class 1, those with a stem ending in -ī, Class 2, and those with a stem ending in -e, Class 3.

There is a change in the stem of the past by comparison with the present stem that applies to all the regular classes. If certain vowels occur in non-final position in the present stem, then these are replaced by other vowels in the past stem for all three classes, as follows:

In the present stem:		Replacement in the past stem:
a	is replaced by	æ
o	is replaced by	e
ə	is replaced by	e
u	is replaced by	i

If the vowel of the present stem is long, the vowel of the past stem will be the same replacement as above, but also long.

Any other vowel that occurs in the present stem will remain in the past stem.

3.1 Class 1

Class 1 verbs are characterized by their stems ending in vowel -ə, or in -a if h precedes: wahanəwa 'close'. Besides the vowel replacement mentioned above, Class 1 verbs change the final -ə to -uw to form the past stem. Thus the present stem බල- (balə-) has the past stem බැලුව්- (bæluw-). To this past stem -a is added to form the simple past and -e to form the emphatic past. Thus, බැලුවා, බැලුවෙ . Those verbs which end in -yə or -wə, such as කියනවා, කියවනවා are an exception. They change -yə- or -wə- to -ww-. Thus, present stem කිය- (kiyə-), past stem කිව්ව්- (kiww-); present stem කියව- (kiyəwə-); past stem කියෙව්ව්- (kiyeww-).

The verbs of Class 1 that you have met so far are:

Simple		Emphatic	
Present	Past	Present	Past
කියනවා	කිව්වා	කියන්නෙ	කිව්වෙ
නවත්තනවා	නැවැත්තුවා	නවත්තන්නෙ	නැවැත්තුවෙ
එලවනවා	එලෙව්වා	එලවන්නෙ	එලෙව්වෙ
කරනවා	කෙරුවා	කරන්නෙ	කෙරුවෙ
කියවනවා	කියෙව්වා	කියවන්නෙ	කියෙව්වෙ
නටනවා	නැටුවා	නටන්නෙ	නැටුවෙ
බලනවා	බැලුවා	බලන්නෙ	බැලුවෙ
එවනවා	එව්වා	එවන්නෙ	එව්වෙ
අහනවා	ඇහුවා	අහන්නෙ	ඇහුවෙ
වහනවා	වැහුවා	වහන්නෙ	වැහුවෙ

3.2 Class 2

Verbs of Class 2 are characterized by a stem ending in -i. The only verb of this class that has occurred earlier is වහිනවා 'rain'. Two others occur for the first time in this lesson: අදිනවා 'draw, pull', බඳිනවා 'tie up, build'.

Class 2 verbs form their -wi, -nnaŋ and verbal adjective forms in the same way as the verbs of the other classes we have met. That is:

1. The stem-final vowel is lengthened for the -wi form: අදීවි, බඳීවි, වහීවි.
2. The -nnaŋ ending is added to the present tense stem: අදින්නම්, බඳින්නම්.
3. The verbal adjective ending -nə is added to the present tense stem: අදින, බඳින, වහින.

Class 2 verbs form the past tense stem as follows: The non-final stem vowels are replaced as for Class 1, the -i of the present stem is dropped, and the resulting final consonant is doubled. Hence අදි (adi-) becomes ඇද්ද (ædd-). When the final consonant is -m̆b, -n̆d, -n̆D or -n̆g, it becomes -mb, -nd, -nD, or-ng respectively. -h doubles as -ss. Thus:

Simple		Emphatic	
Present	Past	Present	Past
අදිනවා	ඇද්දා	අදින්නෙ	ඇද්දෙ
බඳිනවා	බැන්දා	බඳින්නෙ	බැන්දෙ
වහිනවා	වැස්සා	වහින්නෙ	වැස්සෙ

3.3. Class 3

Class 3 is characterized by the present stem ending in -e. Besides the vowel replacement discussed above, the -e of the present stem is changed to -un to produce the past stem: තේරෙ (teere-) becomes තේරුන් (teerun-). To this stem -a and -e are added to form the simple past and emphatic past respectively.

The verbs of this class you have met so far are:

Simple		Emphatic	
Present	Past	Present	Past
තේරෙනවා	තේරුනා	තේරෙන්නෙ	තේරුනෙ
වැටෙනවා	වැටුනා	වැටෙන්නෙ	වැටුනෙ
ඇහෙනවා	ඇහුනා	ඇහෙන්නෙ	ඇහුනෙ

3.4 The past tense forms of irregular verbs have to be learned as they occur. Those which have occurred so far are:

Simple		Emphatic	
Present	Past	Present	Past
ඉන්නවා	උන්නා	ඉන්නෙ	උන්නෙ
එනවා	ආවා	එන්නෙ	ආවෙ
ගන්නවා	ගත්තා	ගන්නෙ	ගත්තෙ
ගෙනියනවා	ගෙනිච්චා	ගෙනියන්නෙ	ගෙනිච්චෙ

ගෙවදිනවා	ගෙවදුනා	ගෙවද්න්නෙ	ගෙවදුනේ
ගේනවා	ගෙනාවා	ගේන්නෙ	ගෙනාවෙ
ත්යෙනවා	ත්උනා	ත්යෙන්නෙ	තිඋනෙ
දෙනවා	දුන්නා	දෙන්නෙ	දුන්නෙ
නවතිනවා	නැවතුනා	නවතින්නෙ	නැවතුනෙ
බොනවා	බීව්වා	බොන්නෙ	බීව්වෙ
යනවා	ගියා	යන්නෙ	ග්යේ
වෙනවා	උනා	වෙන්නෙ	උනේ
වහිනවා	වැස්සා	වහින්නෙ	වැස්සෙ
දානවා	දැම්මා	දාන්නෙ	දැම්මෙ

3.5 As mentioned in Lesson 15, verbs formed with වෙනවා , කරනවා and ගන්නවා have the same past tense (and other) forms as the basic verbs themselves. Thus:

Simple		Emphatic	
Present	Past	Present	Past
සුද්ද කරනවා	සුද්ද කෙරුවා	සුද්ද කරන්නෙ	සුද්ද කෙරුවෙ
බලා ගන්නවා	බලා ගත්තා	බලා ගන්නෙ	බලා ගත්තෙ
හම්බ වෙනවා	හම්බ උනා	හම්බ වෙන්නෙ	හම්බ උනේ

Note that whatever precedes වෙනවා , කරනවා or ගන්නවා does not change in form. When new verbs of this kind are introduced, they will be listed under the class of the verb on which they are formed. Although those with වෙනවා and ගන්නවා are thus irregular, tense forms will not be given for them, since they will be predictable from the forms of වෙනවා and ගන්නවා

4. යනවා AND එනවා WITH THE GENITIVE CASE

Place names that are not formed with -එක and a small number of specific expressions such as ගෙදර and ඉස්කෝලෙ are used in the genitive case with the verbs යනවා and එනවා . When so used, the implication is that the person intends to stay for some period of time although the period may be relatively short. When these expressions are used with the dative case the implication is that the person is going to the place for some specific purpose that does not involve staying there. With other expressions, only the dative case may be used and there is no contrast of this sort.

මේ බස් එක කොළඹට යනවා.	This bus is going to Colombo.
මම කොළඹ යනවා.	I am going to Colombo.
මම ඉස්කෝලෙ යනවා	I am going to school.
මම ඉස්කෝලෙට යනවා.	I am going to school (to pick up my brother).

5. හම්බ වෙනවා

5.1 හම්බ වෙනවා may be an equivalent of the English verb 'to meet'. It may have the subject in the direct or the dative case. With the subject in the dative case it implies accidental or unplanned meeting, and with the subject in the direct case it implies that the meeting is arranged or for some particular person.

මට සඳුදා මහත්තයා හම්බ උනා.	I met the master on Monday (without planning to do so).
මම සඳුදා මහත්තයා හම්බ උනා.	I met the master on Monday (either by previous arrangement or intention).

5.2 හම්බ වෙනවා may also be an equivalent of the English 'to get, receive'. It then has the subject in the dative case and the object in the direct case.

මට සල්ලි හම්බ උනා.	I got (received) (some) money.

5.3 හම්බ වෙනවා has the same form as වෙනවා . Hence
හම්බ උනා 'met, got,' etc.

6. ADVERBS

Some adjectives form adverbs by the addition of -ට. Those that you have met so far are:

Adjective		Adverb	
හොඳ	good	හොඳට	well
සැර	strong	සැරට	strongly
රස	tasty	රසට	tastily
සුවඳ	fragrant	සුවඳට	fragrantly

Note that those that end in -i and -u take ය and ව respectively before -ට.

පොඩි	small	පොඩියට	in a small way
ලේසි	easy	ලේසියට	easily, in an easy manner
අමාරු	difficult	අමාරුවට	in a difficult manner, with difficulty

Exercises

A. Substitute orally:

1. ගල් ඕන නම් ....ගේන්න.

from Colombo
from that place over there
from Matale
from the estate
from Kandy

2. සල්ලි හිග නම් ....කියන්න.

the lady
the master
me
him
that gentleman over there
Banda

3. මම අද ....

built the fence
picked coconuts
cleaned up the bungalow
worked
looked after the estate
closed the road
drove the car
learned some Sinhalese
washed the car
went to the bungalow

4. මම අද ....

didn't go to the bungalow
didn't go home
didn't work
didn't give the money
didn't finish the work on the road
didn't build the fence
didn't wash the car
didn't cut the firewood
didn't fetch the firewood
didn't go to the station

5. නෝනා ....

will give the money
will work in the bungalow
will give me a book
will build the fence
will buy vegetables

B. Transform according to the model, changing the verb to the past tense:

මම ගමට යනවා......මම ගමට ගියා.

1. නෝනාත් එනවා ද?
2. ඔහේ වැඩ කරනවා ද?
3. මම දර කපන්නෙ නෑ.
4. කාර් එක සෝදන්නෙ බංඩා ද?
5. සල්ලි දෙන්නෙ මහත්තයා.
6. මේ සුමානෙ සල්ලි හම්බ වෙනවා.
7. මම වැට බඳින්නම්.
8. පොල් කඩන්නෙ නැද්ද?
9. මම කාර් එක එලවනවා.
10. මම කියවන්නෙ නව කතාවක්.
11. මට මහත්තයා හම්බ වේවි.
12. මම ඉස්කෝලෙ යනවා.
13. පුතා අද යාපනේ යනවා.
14. මොනවා ද අද කරන්නෙ?
15. මේ වත්තෙ පොල් කඩන්නෙ ඔය ලමයා ද?
16. අපි වැටක් බඳිමු.
17. මම ඉස්ටේසමට මුරකාරයා එවන්නම්.
18. ඔහේ සිංහල කියවනවා ද?
19. බස් එක නවත්තන්නෙ මෙතෙන් ද?

C. Say in Sinhalese:

1. Did you see upland dances yesterday?
2. No, I didn't go.
3. Yesterday I took the car to the garage.
4. So I stayed at home.
5. I went. Several very famous dancers came.
6. They danced very well.
7. Do you like to see dances?
8. Yes. Upcountry dances are not too bad.
9. I like them.
10. Five dancers came from Kandy yesterday.
11. Those five danced very well.
12. Is that so?
13. Yes. I took some good pictures, too.
14. I must see some dances one day.

15. When are you cleaning up the estate?
16. Tomorrow morning.
17. Can't you do it before that?
18. I can't, sir. I have a lot of work today.
19. I must finish the road before six o'clock.
20. I'll send two more men.
21. Then you can clean up the estate, can't you?
22. If you can send some men I can finish it.
23. Fine. I'll send two men.
24. Didn't you go to the bungalow this morning?
25. No, sir. I'll come in the afternoon.
26. If you can come, I can give you this week's money.
27. Yes, sir. I'll come at about seven o'clock.

LESSON 18

Conversation: Financial Problems

Sirisena comes back wearily after going to his employer looking for a loan, and discusses it with his friend Gunasena, with whom he wants to go into business.

GUNASENA

පුලුවන් වෙනවා	become possible
බස් එක ගන්න පුලුවන් වුනා ද?	Were you able to get the bus?

SIRISENA

බැරි වෙනවා	become impossible
බැරි උනා.	I couldn't.
ඕන වෙනවා	want, become necessary
මට කඩේ ටිකක් නවතින්න ඕන උනා.	I wanted to stop a while at the shop.
ඒ නිසා බස් එකට පරක්කු උනා.	Therefore I was late for the bus.

GUNASENA

ඉතින් කොහොම ද ගියේ?	So how did you go?

SIRISENA

පයින්.	On foot.

GUNASENA

කුලිය	the wage
කුලී කාර් එක	taxi (hiring car)
කුලී කාර් එකක් ගන්න තිඋනෙ නැද්ද?	Wasn't there a taxi to be had?

SIRISENA

වෙනදඃ	other days
නම්	of course
සොයා ගන්නවා	find
එහේ වෙනදා නම් කාර් එකක් සොයා ගන්න තියෙනවා.	Other days, of course, you can find a car there.
නමුත් අද තිඋනෙ නෑ.	But there wasn't one today.
හැතැප්ම හයක් විතර පයින් යන්න උනා.	I had to go on foot for about six miles.
එපා වෙනවා	get fed up
මට ඊට පස්සෙ ගමනක් යන්න එපා උනා.	After that, I got fed up with traveling around.

GUNASENA

මහත්තයා හම්බ උනා ද?	Did you see the boss?

SIRISENA

යන්තම්	barely, just
ඔව්. යන්තම් හම්බ උනා.	Yes, I just managed to see him.
අල්ලාගන්නවා	catch
තව ටිකක් පරක්කු උනා නම් මහත්තයා අල්ලාගන්න හම්බවෙන්නෙ නෑ.	If I had been a bit later, I wouldn't have been able to catch him.

GUNASENA

ගනුදෙනුව	the transaction, loan
ගනුදෙනුවට මොකද උනේ?	What happened about the loan?

SIRISENA

ඉල්ලාගන්නවා	borrow
සේරම ඉල්ලාගන්න බැරි උනා.	I wasn't able to borrow all of it.
බාගයක්	a half
යන්තම් බාගයක් හම්බ උනා.	I barely got half of it.
ලු	it seems
මහත්තයා ලග දැන් සල්ලි හිග ලු.	It seems that the boss is short of cash now.
ගාන	the amount
බර	heavy
වියදම් වෙනවා	gets spent
වත්තෙ ගෙවල් වගයක් හදන්න බර ගානක් වියදම් උනා ලු.	It seems he spent a large amount to build some houses on the estate.

GUNASENA

අනිත්	the other
හරිය	portion
අනිත් හරිය සොයාගන්නෙ කොහොම ද?	How are we going to get the rest of it?
ලොකු	big
ලොකු මහත්තයා ලග තියෙනවාද දන්නෙ නෑ.	I wonder if the big boss has it.

SIRISENA

මම ලොකු මහත්තයා බලන්න ගියා.	I went to see the big boss.
මදි වෙනවා	become insufficient
නමුත් වෙලා මදි උනා.	But I didn't have enough time.*
මම යන කොට මහත්තයා උන්නෙ නෑ.	When I got there, he wasn't there.

---

*The meaning here can be either "I didn't have enough time," or, idiomatically, "I was too late."

GUNASENA

හෙට වත් ලොකු මහත්තයා හම්බවෙන්න පුලුවන් වේවි ද?	Will you at least be able to see the big boss tomorrow?
කොහොම හරි	somehow
කොහොම හරි ගනුදෙනුව ඉක්මනට සොයාගන්න ඕන, නේ?	Somehow we'll have to find the money, won't we?

SIRISENA

ඒක නේන්නං.	That's so.
උදෙන් ම	early in the morning
මම හෙට උදෙන් ම ලොකු මහත්තයා හම්බවෙන්න යන්නම්.	I'll go to see the big boss early in the morning tomorrow.

GUNASENA

පඩිය	salary
ටික ටික	little by little
ගෙවනවා	pay
පඩියෙන් ටික ටික ගෙවන්න පුලුවන්, නේ?	(We) can pay (it back) little by little out of your salary, can't we?

Grammar

1. NEW NOUNS

Class 1

කුලී කාර් එක	'the taxi, hiring car' කුලී කාර් එක refers to a car which will take one somewhere for an agreed-upon price. ටැක්සිය commonly refers to a cab with a meter.
ගනුදෙනුව	'the transaction, loan'; gen. ගනුදෙනුවෙ ; pl. ගනුදෙනු

ගාන	'the sum' (no plural): gen. ගානෙ
පඩිය	'the salary'; gen. පඩියෙ ; pl. පඩි
කුලිය	'the wage'; gen. කුලියෙ ; pl. කුලි

Class 2

හරිය	'the portion, part'; gen. හරියෙ ; pl. හරියවල්

Class 4

බාගෙ	'the half'

2. NEW VERBS

Irregular

සොයාගන්නවා	'find (for oneself)'
අල්ලාගන්නවා	'catch'
ඉල්ලාගන්නවා	'borrow'
වියදම් වෙනවා	'get spent'

Class 1

ගෙවනවා	'pay'

3. පුලුවන් වෙනවා, බැරි වෙනවා

The forms පුලුවන් and බැ may be used in combination with the verb වෙනවා implying future time. බැ appears as බැරි . Thus, පුලුවන් වෙනවා 'It will be possible' or 'I will be able; බැරි වෙනවා 'It will not be possible' or 'I will not be able'. The past forms of වෙනවා , i.e., උනා and උනේ when used in combination with පුලුවන් or බැ imply past time. Thus පුලුවන් උනා 'I could', 'It was possible'; බැරි උනා 'I couldn't', 'It was not possible'.

මහත්තයාට යන්න පුලුවනි.	The gentleman can go.
මහත්තයාට යන්න පුලුවන් වෙනවා.	The gentleman will be able to go.
මහත්තයාට යන්න පුලුවන් උනා.	The gentleman was able to go.

මහත්තයාට යන්න බෑ.	The gentleman can't go.
මහත්තයාට යන්න බැරි වෙනවා.	The gentleman will not be able to go.
මහත්තයාට යන්න බැරි උනා.	The gentleman couldn't go.

4. ඕන වෙනවා, එපා වෙනවා

The forms වෙනවා and උනා may also be used in combination with ඕන implying future and past respectively.

මට පොත් ඕන.	I want books.
මට පොත් ඕන වෙනවා.	I will want books.
මට පොත් ඕන උනා.	I wanted books.
මට යන්න ඕන.	I want to go.
මට යන්න ඕන වෙනවා.	I will want to go.
මට යන්න ඕන උනා.	I wanted to go.

As learned before, the form ඕන may have the negative ඕන නෑ when used with an infinitive or when used with a noun as direct object. Or, it may have a negative එපා but only when used with a noun as direct object:

මට පොත් එපා.	I don't want (or need) books.
මට පොත් ඕන නෑ.	I don't want (or need) books.
මට යන්න ඕන නෑ.	I don't want (or need) to go.

When ඕන is used with වෙනවා the negative is ඕන වෙන්නෙ නෑ and when used with උනා the negative is ඕන උනේ නෑ.

මට පොත් ඕන වෙන්නෙ නෑ.	I won't need books.
මට යන්න ඕන වෙන්නෙ නෑ.	I won't want to go.
මට පොත් ඕන උනේ නෑ.	I didn't need books.
මට යන්න ඕන උනේ නෑ.	I didn't want to go.

When එපා is used with වෙනවා or උනා it is not a negative of ඕන but has the special meaning 'to be fed up with.'

මට පොත් එපා වෙනවා.	I get fed up with books.
මට යන්න එපා වෙනවා.	I get fed up with going.
මට පොත් එපා උනා.	I got fed up with books.
මට යන්න එපා උනා.	I got fed up with going.

This last construction has its own negative එපා වෙන්නෙ නෑ and එපා උනේ නෑ.For example:

මට පොත් එපා වෙන්නෙ නෑ.	I won't get fed up with books.
මට පොත් එපා උනේ නෑ.	I didn't get fed up with books.
මට යන්න එපා වෙන්නෙ නෑ.	I won't get fed up with going.
මට යන්න එපා උනේ නෑ.	I didn't get fed up with going.

Note that there is no past equivalent of the construction මම යන්න ඕන 'I must go.' වෙනවා and උනා are used with ඕන only when the equivalent of the English subject is in the dative case.

5. වේවි

In all of the constructions discussed in Sections 3 and 4, the form වේවි may be used instead of වෙනවා , with the same implications of futurity and uncertainty discussed in Lesson 12, 3:

මහත්තයාට යන්න පුලුවන් වේවි.	The gentleman might be able to go.
මහත්තයාට යන්න බැරි වේවි.	The gentleman might not be able to go.
මට පොත් ඕන වේවි.	I might want books.
මට යන්න එපා වේවි.	I might get fed up with going.

6. NOT ENOUGH

මදි 'not enough' may be used following a verb, or in place of ඉන්නවා , or තියෙනවා . When it is used with a verb, the past is formed by using the past simple form of the verb:

මහත්තයා වැඩ කරනවා මදි.	He doesn't work enough.
මහත්තයා වැඩ කෙරුවා මදි.	He didn't work enough.

When it replaces ඉන්නවා or තියෙනවා , the past is formed by adding උනා :

මට වෙලා මදි.	I don't have enough time.
මට වෙලා මදි උනා.	I didn't have enough time.

7. ADJECTIVES WITH උනා

The form උනා when used with some adjectives can serve as a past tense 'was' where the present would not have any verb, or as a past tense 'became, got' where the present would have වෙනවා 'become, get'.

මම පරක්කුයි.	I'm late.
මම පරක්කු වෙනවා.	I'm delaying.
මම පරක්කු උනා.	I got late.
ඒ නිසා මම බස් එකට පරක්කු උනා.	Therefore I was late for the bus.

The student should avoid using උනා as a past tense in the meaning 'was' with adjectives except for those specifically mentioned.

8. 'BE SUPPOSED TO','HAVE TO'

The construction with තියෙනවා 'be supposed to' with an infinitive and the subject in the dative case has already been learned.

මට යන්න තියෙනවා.	I am supposed to go.

The past of this is formed with the past of තියෙනවා :

මට යන්න තිඋනා.	I was supposed to go.

A similar construction occurs with the verb වෙනවා 'to become'. With the form වෙනවා the implication is future, 'I will have to' and with the form උනා the implication is past, 'I had to' or 'it became necessary for me to'.

මට පයින් යන්න උනා.	I had to go on foot.
මහත්තයා එනවා නම් මට වැඩ කරන්න වෙනවා.	If the boss comes, I'll have to work.

9. නම්

9.1 When නම් occurs as a conjunction 'if' at the end of a clause with a present tense verb (12,5), the implication may be either present or future, and the verb of the other ("then") clause will be in the form demanded by the sense:

මහත්තයා කලුතරට යනවා නම්, මාත් යන්නම්.	If the master is going to Kalutara, I'll go too.
මහත්තයා ඉන්නෙ ගෙදර නම්, මම ටැලිපෝන් කරන්නම්.	If the master is at home, I'll telephone him.

When the verb of a නම් 'if' clause is in the simple past tense, the implication is generally past contrary to fact ('If he had gone . . .'). The verb of the other clause will commonly be in the present tense:

තව ටිකක් පරක්කු උනා නම්, මහත්තයා අල්ලාගන්න හම්බ වෙන්නෙ නෑ.	If I had been a bit later, I wouldn't have been able to catch him.
එයා කන්තෝරුවට ගියා නම්, ලොකු මහත්තයා හම්බ වෙනවා.	If he had gone to the office, he would have met the big boss.

9.2 Besides meaning 'if', නම් may sometimes be an equivalent of English 'of course'. In this usage it does not follow a clause but occurs immediately following the item that 'of course' applies to:

එහේ වෙනදා නම් කාර් එකක් සොයාගන්න තියෙනවා.	Other days, of course, a car is available there.
මම නම් යන්න ඕන.	I, of course, must go. (If I must go, you stay.)

10. තියෙනවා, ඉන්නවා

It has been noted (Chapter 6, 3) that නෑ serves as the negative of තියෙනවා and ඉන්නවා .

මහත්තයා ගෙදර ඉන්නවා.	The master is at home
පොත ගෙදර තියෙනවා.	The book is at home.
මහත්තයා ගෙදර නෑ.	The master is not at home.
පොත ගෙදර නෑ.	The book is not at home.

In the past tense the negative is තිබුනෙ නෑ, and උන්නෙ නෑ .

මහත්තයා ගෙදර උන්නා.	The master was at home.
පොත ගෙදර තිබුනා.	The book was at home.

මහත්තයා ගෙදර උන්නෙ නෑ.	The master wasn't at home.
පොත ගෙදර තිබුනෙ නෑ.	The book wasn't at home.

11. හම්බ වෙනවා

The verb හම්බ වෙනවා besides having the meaning 'meet' may have the meaning 'to have a chance to', 'to have an opportunity to' when used with a dependent infinitive. In this construction the subject is in the dative case:

මෙහේ මට සිංහල කතා කරන්න හම්බ වෙනවා.	Here I get the chance to speak Sinhalese.
මෙහේ මට සිංහල කතා කරන්න හම්බ වෙන්නෙ නෑ.	Here I don't get a chance to speak Sinhalese.
මට මහත්තයා අල්ලාගන්න හම්බ උනේ නෑ.	I didn't get the chance to catch the gentleman.

12. ලු *'IT SEEMS'*

The form ලු has the meaning 'it seems that' and is added at the end of any clause dependent upon it. When added to නෑ and බෑ they take the form නැති and බැරි respectively.

මහත්තයා ගෙදර.	The master is home.
මහත්තයා ගෙදර ලු.	It seems that the master is home.
ළමයා කඩේ උන්නා.	The boy was in the shop.
ළමයා කඩේ උන්නා ලු.	It seems that the boy was in the shop.
ළමයාට යන්න බෑ.	The boy can't go.
ළමයාට යන්න බැරි ලු.	It seems that the boy can't go.

13. වෙනවා

The verb වෙනවා may have the meaning 'to happen'. In this usage 'what' is usually expressed by මොකද .

මොකද වෙන්නෙ?	What's happening?
මොකද උනේ?	What happened?

14. වත්

වත් is a form used to intensify the item immediately preceding it and is thus likely to be the equivalent of English 'at least', 'even':

හෙට වත් ලොකු මහත්තයා හම්බ වෙන්න පුළුවන් වේවි ද?	Will it be possible to see the big boss at least tomorrow?
මට වත් හම්බ උනේ නෑ.	Even I didn't get (it).
පුතාට වත් පොත් නෑ.	Even the son doesn't have books.

15. හරි

The form හරි is used in combination with interrogatives to form an indefinite:

කොහොම හරි එන්න.	Come somehow or other.
මම කොහේ හරි යන්න ඕන.	I must go somewhere or other.

Exercises

A. Substitute orally:

1. මට බස් එකක් ගන්න ....

couldn't
became possible
wanted
got fed up
want
can't
can
won't be necessary

didn't become necessary
don't get fed up
might become impossible
might be necessary
don't want
didn't get fed up
didn't become impossible

2. මේ මහත්තයාට ....

doesn't understand
doesn't understand enough
didn't understand enough

hasn't enough time
didn't have enough time
became late
hasn't enough books

3. මට ....

am supposed to go
was supposed to eat
had to work
didn't have to walk
might have to work
had to go to school

4. පොත ....

is at home
is in the shop
is with me
was at home
was in the shop
was with me
isn't at home
isn't in the shop
isn't with me
wasn't with me
wasn't in the shop
wasn't at home

5. .... ලොකු මහත්තයා හම්බ වේවි ද?

at least tomorrow
at least next week
even the son
even (my) uncle
even father
at least tonight
at least tomorrow morning

B. Transform according to the model, changing the verb or its equivalent to the past tense:

මට වැඩ කරන්න එපා වෙනවා.....මට වැඩ කරන්න එපා උනා.

1. මට කොලඹ යන්න වෙනවා.
2. මට වැඩ කරන්න තියෙනවා.
3. බස් එක ගන්න පුලුවන් වේවි ද?
4. ඔහේට මේ පොත් ඕන වෙන්නෙ නැද්ද?
5. කුලී කාර් එකක් ගන්න බෑ.
6. ඔහේට පරක්කු වෙනවා ද?
7. යන්න ඕන ද?
8. සල්ලි ඉල්ලා ගන්න බැරි වේවි ද?
9. මහත්තයා අල්ලාගන්න පුලුවන් වෙන්නෙ කීයට විතර ද?
10. මට වෙලා මදි.
11. මට පයින් යන්න වේවි.
12. මෙහේ මට සිංහල කතා කරන්න හම්බ වෙන්නෙ නෑ.
13. පොත ගෙදර තියෙනවා.
14. මහත්තයා ගෙදර නෑ.
15. ගනුදෙනුවට මොකද වෙන්නෙ?

C. Transform according to the model, adding ලු 'it seems':

මහත්තයා ගෙදර.....මහත්තයා ගෙදර ලු.

1. ළමයා කඩේ උන්නා.
2. පොත් ගෙදර නෑ.
3. මහත්තයාට වැඩ කරන්න බෑ.
4. බංඩා වැඩ කරන්න යනවා.
5. ඒ මහත්තයා සිංහල දන්නෙ නෑ.
6. ළමයි පොත් ගත්තා.
7. ගනුදෙනුව හම්බ උනා.

D. Transform according to the model, adding වත් 'at least, even', to a suitable noun:

මට පොත් නෑ.....මට පොත් වත් නෑ.

1. මට මහත්තයා හම්බ වේවි ද?
2. ඔය ළමයාට හෙට කොළඹ යන්න පුලුවන් ද?
3. ගනුදෙනුවෙන් බාගයක් හම්බ උනා.
4. හෙට පඩි ගෙවනවා ද දන්නෙ නෑ.
5. ඒ ඉස්කෝල පොත් මට කියවන්න අමාරුයි.
6. මුරකාරයා උඩරට නැටුම් බලන්න ගියේ නෑ.
7. කුලී කාර් එකෙන් යන්න පුලුවන් ද?
8. එයාට සල්ලි හම්බ වේවි ද?
9. ලොකු මහත්තයා ළග සල්ලි තියෙනවා ද?

E. Say in Sinhalese:

1. Is your house very far?
2. Yes. It's about seven miles from here.
3. Then it is very far. Will I be able to go by bus?
4. Yes, you can. There is a bus at about three in the afternoon.
5. Somehow or other I'll come tomorrow, at least.
6. If I want to go somewhere or other I must wait till (my) son comes home.
7. I don't know if he will come even tomorrow.
8. It seems that he has a lot of work now.
9. Therefore it seems he doesn't get a chance to come home always.

10. My son, too, works the whole day now.
11. He goes to work at about six o'clock in the morning.
12. When he comes home, it's very late.

13. Is the big boss home these days?
14. No, he went to the estate.
15. The master has to pay people (their) wages.
16. I wonder (I don't know) if I can get a loan from the big boss.
17. Last month he built some houses.
18. I wonder if all the money is gone (i.e., finished).
19. Come tomorrow afternoon.
20. You might be able to see him there.
21. I can't come tomorrow.
22. I can come on Monday, of course.
23. He might be home on Monday afternoon.
24. It gets late when the master comes home these days.
25. If so, I'll come on Monday night.
26. Fine. I'll tell the master.
27. If I can come I'll telephone.

LESSON 19

Conversation: Visiting Ceylon

John is introduced to the headmaster of a village school in Ceylon by his friend Silva.

SILVA

මිස්ට	Mr.
මුල්	chief
ගුරුවරයා	teacher

මේ මහත්තයා මිස්ට ජෝන් වුඩ්.	This is Mr. John Wood.
මේ මේ ඉස්කෝලෙ මුල් ගුරුවරයා.	This is the headmaster of this school.

HEADMASTER

ආය්බෝවන්	hello
මහත්මයා	sir

ආය්බෝවන්, මහත්මයා.	How do you do, sir.

JOHN

ආය්බෝවන්.	How do you do.

HEADMASTER

එංගලන්තෙ	England
වෙන්න ඇති	might be

මහත්මයා එංගලන්තෙ වෙන්න ඇති.	You must be English.

JOHN

ඇමෙරිකාව	America

නෑ. මම ඇමෙරිකාවෙ.	No. I'm American.

HEADMASTER

මහත්වරු	gentlemen
දෙගොල්ල	the two groups
දැනගන්නවා	get to know
එංගලන්තෙ මහත්වරුයි ඇමෙරිකාවෙ මහත්වරුයි දෙගොල්ල දැනගන්න අමාරුයි.	It is difficult to get to know (the difference between) the two groups--Englishmen and Americans.
සුදු	white
පේනවා	see
එක වගෙයි	alike
අපට	to us
සුදු මහත්වරු කවුරුත් අපට පේන්නෙ එක වගෙයි.	All white men we see alike.

JOHN

ඇත්ත	the truth
ඒක ඇත්ත.	That's true.
ඉන්දියාව	India
අතරෙ	between
වෙනස	the difference
අපටත් ලංකාවෙ මහත්වරුයි ඉන්දියාවෙ මහත්වරුයි අතරෙ වෙනස කියන්න අමාරුයි.	We too find it difficult to tell the difference between the Ceylonese and Indians.

HEADMASTER

නැතුව	without
හොඳට දැනගන්නෙ නැතුව අමාරුයි.	It is difficult without getting to know them properly.
ළඟදි	recently
මහත්මයා ලංකාවට ආවෙ ළඟදි ද?	Did you come to Ceylon recently?

JOHN

මාසෙකට වැඩියෙ	more than a month
ඔව්. දැන් මාසෙකට වැඩියෙ නැ.	Yes. Not more than a month now.

HEADMASTER

මහත්මයා හොඳට සිංහල දන්නවා, නේ?	You know Sinhalese well, don't you?
ඔච්චර	that much
මාසෙකින් කොහොම ද ඔච්චර සිංහල ඉගනගත්තෙ?	How did you learn that much Sinhalese in a month?

JOHN

ඇමෙරිකාවෙ දි	while in America
මම ඇමෙරිකාවෙදිත් සිංහල ටිකක් ඉගනගත්තා.	I learned some Sinhalese while in America also.
ඒ නිසායි	that's why
මෙච්චර	this much
ඒ නිසායි මට මෙච්චර වත් පුලුවන්.	That's why I know even this much.

HEADMASTER

හා	oh
උගන්නනවා	teach
හා, ඇමෙරිකාවෙ සිංහල උගන්නනවා ද?	Oh, so they teach Sinhalese in America?

JOHN

ඔව්.	Yes.

HEADMASTER

සන්තෝස	pleased
ඒක අහන්න බොහොම සන්තෝසයි.	I am pleased to hear that.
ජීවත් වෙනවා	live
ජීවත් වෙන	living
විදිය	the way
බාසාවල්	languages
මිනිස්සු ජීවත් වෙන විදිය දැනගන්න ඕන නම් මිනිස්සුන්ගෙ බාසාවල් දැනගන්න ඕන.	If one wants to get to know the way the people live, one must get to know the people's language.
මහත්මයා ලංකාවෙ මොකුත් වැඩක් කරනවා ද?	Are you doing any job in Ceylon?

JOHN

රටතොට	country and surroundings
නෑ. මම ආවෙ ටිකක් රටතොට බලන්න.	No. I came to see the country for a while.

HEADMASTER

පිටිසර	countryside, rural area
ජීවිතේ	the life
ගැන	about
සුමානයක් හමාරක්	a week or so
මහත්මයාට පිටිසර ජීවිතේ ගැන දැනගන්න ඕන නම් සුමානයක් හමාරක් මෙහේ නවතින්න එන්න.	If you want to know (something) about the country life come to stay here for a week or so.
පුරුදු	accustomed
කෑම් බීම්	foods and drinks
නම්	of course
මහත්මයාට පුරුදු කෑම් බීම් නම් මෙහේ නෑ.	We don't have the foods and drinks you are used to, of course.

නමුත් ඉගනගන්න බොහොම දේවල් තියෙනවා.	But there are many things to learn.

JOHN

බාදාව	the hindrance
ඕන දෙයක්	anything
කෑමෙන් බාදාවක් නෑ.	There is no problem about food.
කනවා	eat
ඕන දෙයක් කන්න පුලුවනි.	I can eat anything.
කට	mouth
දනවා	burn (intransitive)
කට දනවා	to be hot (spicy)
කට දන කෑම පුරුදුයි.	I am used to hot food.
ඉඩ	space, time to spare
ඉඩ තියෙන කොට මම එන්නම් මෙහේ ටිකක් බලන්න.	When there's time I'll come to look around here a while.

HEADMASTER

මහත්තයාලා අපි තේ ටිකක් බොමු ද?	Gentlemen, let's have some tea, shall we?

JOHN

බෑ. අපි යන්න ඕන.	No. We must go now.
පස්සෙ	later
තේ පස්සෙ බොන්න පුලුවනි.	We can drink tea some other time.

HEADMASTER

එහෙම ද? හොඳයි.	Is that so? Fine.
එහෙනම් මහත්මයා වෙලාවක මේ පැත්තෙ එන්න.	Then you come this way some time.

JOHN

අපි ගිහින් එන්නම්.	we had better go
බොහොම ඉස්තූතියි.	Thank you very much.
අපි ගිහින් එන්නම්.	We had better go.

HEADMASTER

ආය්බෝ!	Good bye.

JOHN

ආය්බෝ!	Good bye.

Grammar

1. NEW NOUNS

Class 2

ඇමෙරිකාව	'America' (no pl.); gen. ඇමෙරිකාවෙ
ඉන්දියාව	'India' (no. pl.); gen. ඉන්දියාවෙ
වෙනස	'the difference'; gen. වෙනසෙ ; pl. වෙනස්
බාසාව	'the language'; gen. බාසාවෙ ; pl. බාසා , බාසාවල්
කෑම බීම	'the food and drink'; gen. කෑමෙ බීමෙ ; pl. කෑම් බීම්
බාදාව	'the hindrance'; gen. බාදාවෙ ; pl. බාදාවල්
ඉඩ	'the space'; gen. ඉඩේ ; pl. ඉඩ
ඇත්ත	'the truth'; (no pl.); gen. ඇත්තෙ
රටතොට	'the country'; gen. රටතොටේ ; pl. රටතොටවල්
කට	'the mouth'; gen. කටේ ; pl. කටවල්
විදිය	'the way'; pl. විදි

Class 3

පිටිසර	'countryside, rural area'; pl. පිටිසරවල්

Class 4

එංගලන්තෙ	'England' (no pl.)
ජීවිතේ	'the life'; pl. ජීවිත

Class 5

ගුරුවරයා	'the teacher; pl. ගුරුවරු
මහත්මයා	'the gentleman'; pl. මහත්වරු (See 3.1 in the grammar)

2. NEW VERBS

Class 1

උගන්නනවා	'teach'; past ඉගැන්නුවා

Irregular:

පේනවා	'be seen'; past පෙනුනා , -wi form පෙනේවි
කනවා	'eat'; past කෑවා
දනවා	'burn' (intransitive); past දැවා
කට දනවා	'be hot, spicy' (i.e., mouth-burning)
දැනගන්නවා	'get to know'

3. IDIOMS

In this conversation there are some variants of items learned earlier as well as some new idiomatic expressions.

3.1 ආයුබෝවන් is a variant of the greeting ආයුබෝ 'Hello', 'how do you do?' It is a slightly more formal and literary version and may be used when first meeting someone, as in this conversation, or may be used as a term of respect where ආයුබෝ would imply more familiarity. Note that at the end of the conversation the form ආයුබෝ is used since the participants have become acquainted with each other and have been chatting informally.

3.2 මහත්මයා is a more formal variant of මහත්තයා . It has two plural forms මහත්වරු and මහත්මයාලා. මහත්මයාලා is used more frequently as a term of address or equivalent of 'you (pl.)' and මහත්වරු generally as an equivalent of 'gentlemen'.

3.3 අපට is a variant of අපිට , the dative of අපි. Either may be used with no change in meaning.

3.4 අපි ගිහින් එන්නම් is a polite expression used on parting by the person who is leaving. It means, literally, 'we, having gone, will come' and is a rough equivalent of English 'I, we, had better go', 'I have to go'. Note that although අපි 'we' is a plural form, this expression may be used by a single individual although it is also permissible to use the singular form අපි ගිහින් එන්නම්.

4. STATING NATIONALITY

The Sinhalese equivalent of English expressions like 'I'm an American', 'I'm an Indian', etc., is literally 'I'm of America', 'I'm of India', etc., expressed by the genitive case of the name of the country.

මම ඇමෙරිකාවෙ.	I'm an American.
අපි එංගලන්තෙ	We are English.
මේ මහත්තයා ඉන්දියාවෙ ද?	Is this gentleman an Indian?
අර මහත්වරු ලංකාවෙ ද?	Are those gentlemen Ceylonese?

Note that the same form may be used in qualifying a word like මහත්තයා, මහත්මයා or මිනිහා

ලංකාවෙ මහත්මයා	the Ceylonese gentleman
ඇමෙරිකාවෙ මහත්මයා	the American gentleman
ලංකාවෙ මිනිස්සු	the people of Ceylon

5. VERBAL ADJECTIVES

The verbal adjective form of a verb (8.5) may be used as an adjective qualifying a following noun.

වැඩ කරන මිනිස්සු	working men, men who are working

The verbal adjective form may have its own subject or object and modifiers. The English equivalent is likely to be a noun modified by a following clause.

සුරුට්ටු බොන මහත්තයා	the gentleman who is smoking cigars
මහත්තයා බොන සුරුට්ටු	the cigars that the gentleman is smoking
බස් එකෙන් යන ලමයා	the child who is going by the bus
මිනිස්සු ජීවත්වෙන විදිය	the way in which people live
කට දන කැම	food that burns the mouth

6. THE මෙච්චර SET

6.1 මෙච්චර 'this much' is one of another set of location words:

මෙච්චර	this much, as much as this
ඔච්චර	that much (by you), as much as that (by you)
අච්චර	that much (over there), as much as that (over there)
එච්චර	that much (in question), as much as that (in question)

These have no case forms.

6.2 Members of the මෙච්චර set may modify nouns, and then may either precede or follow the noun they qualify:

මට කෑම මෙච්චර එපා.	I don't want this much food.
එච්චර සල්ලි වියදම් උනා ද?	Did that much money get spent?
මාසෙකින් කොහොම ද ඔච්චර සිංහල ඉගනගත්තෙ?	How did you learn that much Sinhalese in a month?

6.3 They may also act as nouns:

මහත්තයාට ඔච්චර බොන්න පුළුවන් ද?	Can you drink that much?

6.4 They may modify adjectives or verbs:

මේ සුරුට්ටු එච්චර රස නෑ.	These cigars aren't that tasty.
ඒ ළමයාගෙ වැඩ මෙච්චර හොඳ නෑ.	That boy's work isn't this good.
ඇමෙරිකාවෙ කෑම ඔච්චර කට දනවා ද?	Is American food that hot (Does American food burn the mouth as much as that near you)?

6.5 කොච්චර 'how much' is the corresponding interrogative to the මෙච්චර set and acts like a member of that set in interrogative sentences. Thus:

මහත්තයාට තේ කොච්චර බොන්න පුළුවන් ද?	How much tea can you drink?
මහත්තයාට කොච්චර බොන්න පුළුවන් ද?	How much can you drink?
මේ සුරුට්ටු කොච්චර රස ද?	How tasty are these cigars?

7. වැඩියෙ

7.1 වැඩියෙ 'more than' requires a preceding noun or noun phrase in the dative case:

මාසෙකට වැඩියෙ නෑ.	not more than a month
මම ළඟ රුපියල් දෙකකට වැඩියෙ නෑ.	I haven't got more than two rupees.

7.2 වැඩියෙ may equate with English 'more than'. The lesser of the two things compared precedes වැඩියෙ and is in the dative case:

මම කොළඹට වැඩියෙ නුවරට කැමතියි.	I like Kandy more than Colombo.
මම සිංහලට වැඩියෙ ඉංගිරිසි දන්නවා.	I know English more than (I know Sinhalese.

7.3 වැඩියෙ may also equate with '-er than' in English comparative adjective constructions. In an expression such as 'bigger than X', the Sinhalese equivalent of X will be in the dative case and will precede වැඩියෙ . Thus 'bigger than Kalutara' is කළුතරට වැඩියෙ ලොකු . Note that the adjective takes no special form but behaves as usual with respect to the assertion marker:

කළුතරට වැඩියෙ කොළඹ ලොකුයි.	Colombo is bigger than Kalutara.
මේ සුරුට්ටු ජාතියට වැඩියෙ අර සුරුට්ටු ජාතිය රසයි.	That kind of cigars is tastier than this kind of cigars.
මේ පොතට වැඩියෙ අරක හොඳයි.	That book is better than this one.

7.4 As in English, the item with which something is being compared may be left unexpressed where context makes it clear:

මේ පොත වැඩියෙ හොඳයි.	This book is better.
අරක වැඩියෙ ලොකුයි.	That one is larger.

8. වෙන්න ඇති

8.1 The phrase වෙන්න ඇති may be used alone to mean 'perhaps', 'may be so'. It may be added to a sentence with the implication 'maybe', 'might be', 'perhaps':

වෙන්න ඇති.	Maybe so.
මහත්තයා එංගලන්තෙ වෙන්න ඇති.	Perhaps you are English.
මහත්තයා ගෙදර යනවා වෙන්න ඇති.	Perhaps you are going home.
පුතා ඉස්කෝලෙ නෑ වෙන්න ඇති.	Maybe the boy isn't in school.
ගුනපාල කැඩුවෙ පොල් වෙන්න ඇති.	Maybe Gunapala picked coconuts.

8.2 In a sentence in which one presumes something about another, such as මහත්තයා එංගලන්තෙ 'You are English', වෙන්න ඇති is likely to be added in Sinhalese as a mark of politeness.

9. නැතුව

9.1 නැතුව is a form that replaces නෑ in a subordinate clause. It will therefore appear in the same constructions in which may occur, but will form a subordinate clause and is likely to equate with the English clause introduced by 'without':

මහත්තයා හම්බ උනේ නෑ.	I didn't meet the gentleman.
මහත්තයා හම්බ වෙන්නෙ නැතුව මොකුත් කරන්න බෑ.	I can't do anything without having met the gentleman.
පොත් නෑ.	no books
පොත් නැතුව ඉගනගන්නෙ කොහොම ද?	How can you learn without books?
හොඳට දැනගන්නෙ නෑ.	One doesn't get to know (them) well.
හොඳට දැනගන්නෙ නැතුව අමාරුයි.	Without getting to know (them) well it's difficult.

10. අතරෙ

අතරෙ is the genitive case of a Class 2 noun අතර meaning 'between'. The direct form is not used as frequently as the genitive. The genitive serves as an equivalent of English 'between', 'among' and nouns or pronouns dependent upon it are in the direct case:

මේ මහත්තුරු අතරෙ හුඟක් සල්ලි තියෙනවා.	There's a lot of money among these men.
ලංකාවෙ මිනිස්සුයි ඉන්දියාවෙ මිනිස්සුයි අතරෙ වෙනස කියන්න.	Tell me the difference between the Ceylonese people and the Indian people.

ගෙවල් දෙක අතරෙ ගඟක් තියෙනවා ද?	Is there a river between the two houses?

Note that the -යි at the end of the word මිනිස්සුයි in each of its occurrences in the second sentence is the conjunction -යි 'and'.

11. පේනවා

පේනවා 'to see', 'to be able to see', like තේරෙනවා 'to understand' takes a subject in the dative case and an object in the direct case.

මට පේනවා.	I see; I can see.
මට ඒ දෙක අතරෙ වෙනස පේනවා.	I can see the difference between those two.
මට අර අකුරු පේන්නෙ නෑ.	I can't see those letters of the alphabet.

12. වගේ

12.1 The form වගේ is a postposition equating with English 'like'. Phrases with වගේ and a dependent noun or pronoun in the direct case may occur as predicate attributes in equational sentences. In simple sentences, the assertion marker is optional for වගේ.

මේ පොත ඒක වගේ.	This book is like that one.
මේ පොත ඒක වගෙයි.	This book is like that one.

12.2 The construction එක වගේ is an equivalent of the English 'alike' in the same way:

මේ පොත් දෙක එක වගේ.	These two books are alike.
මේ පොත් දෙක එක වගෙයි.	These two books are alike.
සුදු මහත්වරු කවුරුත් අපට පේන්නෙ එක වගෙයි.	All white men we see alike.

13. ALL

The forms කවුරුත් and සේරම , besides being used as pronouns, can be used as quantity words with nouns. In both these uses කවුරුත් is human only, whereas සේරම can be either animate or inanimate:

මිනිස්සු කවුරුත් : මිනිස්සු සේරම	all men
පොත් සේරම	all books

14. ගොල්ල

The form දෙගොල්ල is a combination of the forms දෙ- 'two' and ගොල්ල 'group of people'. In the conversation, the sentence එංගලන්තෙ මහත්වරුයි ඇමෙරිකාවෙ මහත්වරුයි දෙගොල්ල දැනගන්න අමාරුයි is literally 'It is difficult to get to know the two groups of people--English gentlemen and American gentlemen'.

15. PLURAL NOUN INFLECTION

15.1 Classes 1-4

The direct plural form, as discussed earlier, is not predictable from the singular. The other plural case forms have an oblique stem formed by the addition of the suffix -වල්- to the direct form. (The term oblique includes all the case forms except the direct form). To this stem are added the same regular case endings as added to the singular indefinite, i.e., genitive -ə, dative -əTə, instrumental -iŋ. Note that all nouns of these classes, even those with a direct plural ending in -වල්, add the -වල්- suffix to form the oblique plural stem. Those nouns that have alternative direct plural forms with or without -වල්- such as කඩේ with the alternative plurals කඩ, කඩවල් usually use the form with the -වල්- in the formation of the oblique stem.

	Direct	Genitive	Dative	Instrumental
cigars	සුරුට්ටු	සුරුට්ටුවල	සුරුට්ටුවලට	සුරුට්ටුවලින්
houses	ගෙවල්	ගෙවල්වල	ගෙවල්වලට	ගෙවල්වලින්
buses	බස්	බස්වල	බස්වලට	බස්වලින්
shops	කඩ, කඩවල්	කඩවල්වල	කඩවල්වලට	කඩවල්වලින්

15.2 Class 5

As for the other classes, the direct plural form is not predictable from the singular. In the formation of plural forms, nouns of Class 5 fall into two groups:

1. Those nouns with a direct plural in -ලා simply add the regular animate case endings--dative -ට, genitive -ගෙ,

instrumental -ගෙන්--to the direct plural form:

	Direct	Genitive	Dative	Instrumental
uncles	බාප්පාලා	බාප්පාලාගෙ	බාප්පාලාට	බාප්පාලාගෙන්

2. Other nouns of Class 5 add -න් to the direct plural to form an oblique stem to which the regular animate case endings are added. If the direct plural ends in -o, it is changed to -a- when -න is added to form the oblique stem:

	Direct	Genitive	Dative	Instrumental
men	මිනිස්සු	මිනිස්සුන්ගෙ	මිනිස්සුන්ට	මිනිස්සුන්ගෙන්
children	දරුවෝ	දරුවන්ගෙ	දරුවන්ට	දරුවන්ගෙන්

16. ගැන

The postposition ගැන 'about' takes a dependent noun in the direct case:

ළමයා ගැන මම දන්නවා.	I know about the boy.
ලංකාව ගැන මට කියන්න.	Tell me about Ceylon.

17. 'ACCUSTOMED TO'

පුරුදු 'accustomed to' may appear with a dependent noun and the equivalent of the English subject in the dative case. It takes the assertion marker:

මට සිංහල කෑම පුරුදුයි.	I am used to Sinhalese food.

Exercises

A. Substitute orally:

1. මේ මහත්තයා ....

Mr. Gunasena
the headmaster
the watchman of this estate
a driver
my driver

my uncle's son
is from England
an American gentleman
a Sinhalese teacher
is from Ceylon

2. .... දෙගොල්ල දැනගන්න අමාරුයි.

Englishmen and Americans
Indians and Ceylonese
watchmen and drivers
these people and Indians
people of the rural areas and people of Colombo

3. මහත්මයා ලංකාවට ආවෙ ....?

when
recently
today
yesterday
last month
before that
after that
why

4. මෙහේ .... ඉන්නවා ද?

people who drive cars
people who work
children who know Sinhalese
gentlemen who go to America
people who eat Indian food
white people from England
people who pick coconuts
daughters who go to school
boys who live in the country
people who smoke Matale cigars

5. .... බොහොම දේවල් තියෙනවා.

to learn
to buy
to teach
to teach this man
to do
to finish tomorrow
for me to do
to eat when at home

6. මහත්මයාට .... දැනගන්න ඕන ද?

about these vegetables
about the work we do
about the headmaster of this school
about the driver
about the Americans
about the people of England

about the difference between the Indians and the Ceylonese
about the job I am doing
about the way people live here
about spicy food
about Ceylon money
about those bananas over there

7. මම .... කැමතියි.

Kandy more than Colombo
Sinhalese more than English
cigarettes more than cigars
Ceylon more than England
Colombo more than Kalutara
this book more than that one over there
the watchman more than the driver
this doctor more than the apothecary

8. .... වැඩ කරන්නෙ කොහොම ද?

without money
without people
without books
without reading books
without studying
without going to the estate
without a vacation
without Gunapala
without my car and truck
without my uncle and the watchman

9. .... හුඟක් පොත් තියෙනවා.

between these two boys
among these men
between these two counters
between the gentleman and (his) wife
among the boys who go to school

10. .... වෙනස දන්නවා ද?

between Ceylonese men and Englishmen
between this man and my son
between my two uncles
between these two houses
between my estate and Mr. Perera's estate

B. Transform according to the model, changing the sentences to comparative degree (to mean 'more than') by using the noun in parenthesis as the noun compared:

කලුතර ලොකුයි. (කොලඹ).....කලුතරට වැඩියෙ කොලඹ ලොකුයි.

1. මම මහත්තයාට කැමතියි. (නෝනා)
2. මහත්තයා කාර් එකට කැමත්යි. (ඩ්‍රයිවර්)
3. සල්ලි හොඳයි. (පොත්)
4. සුරුට්ටු රසයි. (සිගරට්)
5. මේ බත් රසයි. (අර බත්)
6. මේ බස් එක ඉක්මන්. (කෝච්චිය)
7. ඇමෙරිකාවෙ මහත්තුරු දැනගන්න අමාරුයි. (එංගලන්තෙ මහත්තුරු)
8. මම සිංහලට කැමතියි. (ඉංගිරිසි)
9. පිටිසර ජීවිතේ හොඳයි. (නුවර ජීවිතේ)
10. මම සිංහල දන්නවා. (ඉංගිරිසි)

C. Transform according to the model by adding 'maybe':

මහත්තයා ගෙදර.......මහත්තයා ගෙදර වෙන්න ඇති.

1. ලමයා ලබන මාසෙ එංගලන්තෙට යනවා.
2. ගුනපාල කැඩුවෙ පොල්.
3. මහත්තයා එංගලන්තෙ.
4. පුතා ගම නෑ.
5. තාත්තා ගමට ආවෙ නෑ.
6. දොස්තර මහත්තයා හම්බ උනා.
7. එයා පොත් ගන්නවා.

D. Say in Sinhalese:

1. All men in this estate went home last week.
2. We are starting work again next week.
3. If you can come then, I can give you a job.
4. Do you pay much wages, sir?
5. We pay two rupees a day.
6. Two rupees is not enough.
7. But I'll come.
8. If the wages aren't enough, don't come.
9. All these men are alike.
10. They want money, but they don't work.
11. If your work is good, I'll give you three rupees.
12. But if your work is not good, don't stay here.

13. Are you from America?
14. Yes. I am from America.
15. Maybe you came here to see the country.
16. No. I came to learn Sinhalese.
17. Tell me, is there a good school here?
18. Or, is there a good teacher close by?
19. I can stay in Ceylon for about a year.
20. I want to learn Sinhalese soon.
21. Is Sinhalese taught in America?
22. Yes. Recently we started to teach Sinhalese.
23. But we don't have teachers.
24. That's very good. If you want to get to know people, you must learn the language the people speak.
25. Aren't you doing any job in Ceylon?
26. No. I want to stay a week or so in the countryside.
27. There are things to learn in the countryside. But foods and drinks are not good enough.
28. Food is no trouble. I can eat anything.
29. Then you stay here for two weeks.
30. Fine. I'll come next week.
31. I had better go. Good bye.
32. Good bye.

E. Conversations:

In the following conversations, A is an American visiting Ceylon:

1. A visits a village in the upcountry and talks with the head of the local school. They discuss A's plans for a visit to that area. He is particularly interested in seeing some upcountry dances.
2. A talks with his friend Perera about a visit A just made to Anuradhapura and Sigiriya.

LESSON 20

Conversation: Getting to Know Someone

Sirisena meets a schoolteacher from southern Ceylon who teaches in the eastern part of the country.

SIRISENA

දකුන	the south
මහත්මයා දකුනෙ වෙන්න ඇති.	You must be from the South.

GUNASENA

නැගෙනහිර	the east, eastern
ඔව්. මම දකුනෙ. නමුත් රස්සාව කරන්නෙ නැගෙනහිර පළාතෙ.	Yes, I am from the South. But I work in the eastern province.

SIRISENA

උගන්නනවා වෙන්න ඇති.	You must be teaching.

GUNASENA

මම සිංහල ගුරුවරයෙක්.	I'm a Sinhalese teacher.

SIRISENA

දකුනු	southern
කොහොම ද? නැගෙනහිර පළාත දකුනු පළාතට වැඩියෙ වෙනස් ඇති, නේ ද?	How? The eastern province must be different from the southern province, isn't it?

GUNASENA

විතර	as much as
දියුනු	developed
ඔව්. වෙනස්. ඒ පලාත දකුන විතර දියුනු නෑ.	Yes. It is different. That province isn't as developed as the South.
තරමක් දුරට	to some extent
බාසාව තරමක් දුරට වෙනස්.	The language is somewhat different, too.
ඒ උනත්	even then
නොදියුනු	undeveloped
ඒ උනත් මම නොදියුනු පලාත්වල රස්සාව කරන්න කැමතියි.	Even then, I like to work in undeveloped areas.

SIRISENA

එහේ ජීවත් වෙන්න අමාරු නැද්ද?	Isn't it difficult to live there?

GUNASENA

ඒ තරම්	that much
දිහාව	area
සරුසාරෙට	elegantly, elaborately
ඒ තරම් අමාරුවක් නෑ.	It isn't that difficult.
කෑම බීම කොළඹ දිහාවෙ වගේ සරුසාරෙට නෑ.	Food isn't as elegant as in the Colombo area.
අල	yams
බතල	sweet potatoes
අල බතල	various kinds of yams
කොච්චර වත්	any amount
නමුත් අල බතල ජාති කොච්චර වත් තියෙනවා.	But there are all kinds of yams.
බඩගින්න	hunger
සිද්ද වෙනවා	happen

කවදාවත් බඩගින්නෙ ඉන්න සිද්දවෙන්නෙ නෑ.	You will never have to starve.

SIRISENA

හරිය	area, part
මමත් දවසක ඔය හරිය බලන්න යන්න ඕන.	One day I too must go to see that area (you are talking about).

GUNASENA

ඔව්. ඒක හුඟක් හොඳයි.	Yes. That's very good.
අමුතු	strange, new
අමුතු පලාතක්, නේ?	It's a new area, isn't it?
ආවොත්	if you come
ඒ පැත්තෙ ආවොත් අපේ ඉස්කෝලෙ තියෙන දිහාවටත් එන්න.	If you come that way, also come to the area where our school is, too.
මහ ඔය	Maha Oya
මම උගන්නන්නෙ මහ ඔය.	I teach in Maha Oya.

SIRISENA

වැද්දා	the Vedda
හා, වැද්දො ඉන්නෙත් ඒ කිට්ටුව, නේ ද?	Oh, Veddas live near there, don't they?

GUNASENA

ඔව්. මහත්තයා කැමති නම් වැද්දො බලන්න යන්න පුලුවනි.	Yes. If you like we can go and see the Veddas.
කාලෙ	the time, period
එහෙම නම් ඉස්කෝලෙ නිවාඩු කාලෙක එන්න.	If that is so, come at a time the school is on vacation.
දඹාන	Dambana
ගිහිල්ලා	having gone

ටික දවසක්	a few days
ගත කරනවා	spend (time)
එතකොට අපට දඹානට ගිහිල්ලා ටික දවසක් ගත කරන්න පුළුවනි.	Then we can go to Dambana and spend a few days (there).
දඹානට යන්න මහ ඔය ඉඳලා හැතැප්ම දොලහක් විතර යන්න තියෙනවා.	To go to Dambana one has to go about 12 miles from Maha Oya.

SIRISENA

උනොත්	if it happens
එන්න බලන්නම්	I'll try to come
හොඳයි, පුළුවන් උනොත් මම එන්න බලන්නම්.	Fine. If possible, I'll try to come.

GUNASENA

ඉස්සෙල්ලා	before
කල් තියා	early, in advance
එන්න ඉස්සෙල්ලා කල් තියා ලියුමක් දාන්න.	Before coming, send me a letter in advance.
ඇඩ්‍රස් එක	the address
මෙන්න ඇඩ්‍රස් එක.	Here's the address.

SIRISENA

හොඳයි. මහත්තයා හම්බ උනාට බොහොම සන්තෝසයි.	Good. I am very pleased to have met you.
ආවොත්	if coming
ආයෙත් කොළඹ ආවොත් හම්බ වෙන්න.	If you come to Colombo again, meet (me).

GUNASENA

මුනගැහෙනවා	meet, see
ඔව්. මම ආවොත් මුනගැහෙන්නම්.	Yes. If I happen to come, I'll see you.

Additional Vocabulary

නැගෙනහිර	east, eastern
බස්නාහිර	west, western
දකුන	south
දකුනු	southern
උතුර	north
උතුරු	northern

Grammar

1. NEW NOUNS

Class 1

ඇඩ්‍රස් එක	'the address'

Class 2

දකුන	'the south'; gen. දකුනෙ ;(no plural)
උතුර	'the north'; gen. උතුරෙ ;(no plural)
දිහාව	'the area'; gen. දිහාවෙ ; pl. දිහා, දිහාවල්
බඩගින්න	'the hunger'; gen. බඩගින්නෙ ; pl. බඩගිනි
හරිය	'the area, part'; gen. හරියෙ ; pl. හරියවල්
දඹාන	'Dambana'; gen. දඹානෙ ; (no plural)

Class 3

නැගෙනහිර	'the east'; (no plural)
බස්නාහිර	'the west'; (no plural)

(Note that the words for 'east' and 'west' are also the adjectives 'eastern' and 'western'.

මහ ඔය	'Maha Oya'; (no plural)

Class 4

කාලෙ	'the time, period of time'; pl. කාලවල්

Class 5

වැද්දා	'the Vedda'; pl. වැද්දො

Other Nouns

අල	'yams' (pl. only); gen. අලවල
බතල	'sweet potatoes' (pl. only); gen. බතලවල

2. NEW VERBS

Class 1

ගත කරනවා	'spend (time)'

Irregular

සිද්ද වෙනවා	'happen'; past සිද්ද උනා
මුන ගැහෙනවා	'meet'; past මුන ගැහුනා

3. විතර

3.1 The form විතර may equate with the English 'as much as', 'as many as', 'as well as'. This use of විතර is confined to questions or negative sentences. The two forms being compared will appear in the same case, as the sentence requires:

මට මේ ලමයාට විතර සිංහල බෑ.	I don't know Sinhalese as well as this boy.

In the sentence above the form මට is in the dative case as subject of බෑ, and ලමයාට in the expression ලමයාට විතර is dative because මට is dative. Note also the cases in the following:

මේකෙ අර පොතේ විතර පින්තූර නෑ.	In this book there aren't as many pictures as in that one.
මම මේකට විතර අරකට කැමති නෑ.	I don't like that as much as this.

As the last sentence shows, the construction with විතර that is මේකට විතර, may either precede or follow the item with which it is being compared, that is අරකට.

3.2 In construction with adjectives, විතර may equate with English 'as . . . . as . . . . '.

සිංහල ඉංගිරිසි විතර අමාරු නෑ.	Sinhalese isn't as hard as English.
මහත්තයා ළමයා විතර හොඳ නෑ.	The gentleman isn't as good as the boy.

4. නො දියුණු

Some adjectives may form a negative by adding a prefix නො . Thus:

දියුණු	'developed'	නො දියුණු	'undeveloped'

This is the only adjective which has occurred so far that takes නො.

Although දියුණු may occur in predicative position, නො දියුණු may not occur in predicative position, but may only precede nouns:

නො දියුණු පළාත්වල	in undeveloped areas

An alternative is to negate the adjective with නෑ as usual, which then takes the form නැති when preceding nouns:

දියුණු නැති පළාත්වල	in undeveloped areas

This works with adjectives whether or not they may take නො . Hence:

හොඳ නැති මිනිස්සු	people who are not good

5. තරම්

The form තරම් may be used with the මේ set of location words as an equivalent in meaning and use of the මෙච්චර set.

මේ තරම්, මෙච්චර	this much
ඔය තරම්, ඔච්චර	that much
අර තරම්, අච්චර	that much
ඒ තරම්, එච්චර	that much

6. PAST CONDITIONAL

The past conditional form is formed from the simple past form of the verb by replacing the final -a or -aa by -ot:

Simple Present		Simple Past	Conditional
එනවා	come	ආවා	ආවොත්
යනවා	go	ගියා	ගියොත්
වෙනවා	become	උනා	උනොත්
බලනවා	see, look	බැලුවා	බැලුවොත්

This verb form is used in the 'if' clause of a conditional sentence. This construction implies that the action of the conditional form should precede in time the action of the main verb of the sentence. It is likely to imply a future condition. Note that in the Sinhalese sentence only the form of the verb signals English 'if'. In the main clause the verb form is any reasonable form to fit the situation:

මහත්තයා ආවොත් ඔහේ කොලඹ යන්න.	If the master comes, you go to Colombo (i.e., after he comes).
කඩේට ගියොත් මම සිගරැට් පැකැට් එකක් ගේන්නම්.	If I go to the shop I will bring a pack of cigarettes (when I return).

Compare:

මම කඩේට ගියා නම් සිගරැට් පැකැට් එකක් ගේනවා.	If I had gone to the shop, I would have brought a pack of cigarettes.

7. PAST PARTICIPLE

The past participle form of a verb is formed as follows:

Class 1

Class 1 verbs add -ලා to the verb stem.

Simple Present		Past Participle
බලනවා	look	බලලා
කපනවා	cut	කපලා
කරනවා	do	කරලා

An alternative form of the past participle for Class 1 verbs adds ා to the stem before adding ලා:

Simple Present		Past Participle
බලනවා	look	බලාලා
කපනවා	cut	කපාලා
නවත්තනවා	stop (transitive)	නවත්තාලා

This alternative form is used widely in some dialects of Sinhalese, so the student should be prepared to meet it. Both forms are acceptable Sinhalese.

Class 2

Class 2 verbs change the stem vowel a to æ, u to i, o to e; replace the final vowel -i of the stem by ə and add ලා.

Simple Present		Past Participle
බඳිනවා	tie	බැඳලා
අඳිනවා	draw	ඇඳලා

Class 3

Class 3 verbs replace the final -e of the stem by -i and add ලා.

වැටෙනවා	fall	වැටිලා
තේරෙනවා	understand	තේරිලා

An alternative form of the past participle for Class 3 verbs has a long -ii instead of the short -i if the stem is two syllables and the first syllable is not long. Thus:

	වැටෙනවා		වැටිලා, වැටීලා
but	තේරෙනවා	only	තේරිලා

The people who use this version of the Class 3 past participle are those who use the alternative version of Class 1.

Irregular Verbs:

Of the verbs that have occurred so far, the following have irregular past participles:

Simple Present		Past Participle
යනවා	go	ගිහිල්ලා, ගිහින්
එනවා	come	ඇවිල්ලා, ඇවිත්
දෙනවා	give	දීලා
දානවා	put	දාලා
බොනවා	drink	බීලා
ගන්නවා	take, buy	අරගන, අරන්
තියෙනවා	be (inanimate)	තීලා, තිබීලා
ඉන්නවා	be (animate)	ඉඳලා
වෙනවා	become	වෙලා
ගෙවදිනවා	move into a new house	ගෙවදිලා
දනවා	burn	දාලා
පේනවා	be seen	පෙනීලා
නවතිනවා	stop, stay	නැවතිලා
කනවා	eat	කාලා
ගෙනියනවා	take away	ගෙනිහිල්ලා
ගේනවා	bring	ගෙනැල්ලා

In addition to the alternate forms of the past participle given for ගන්නවා above, that is අරගන and අරන් , ගන්නවා has another past participle ගන gənə that is used to make the past participle of verbs such as බලා ගන්නවා or දැන ගන්නවා that are formed with ගන්නවා . Thus:

Simple Present	Past Participle
බලා ගන්නවා	බලාගන
දැන ගන්නවා	දැනගන

Verbs formed with කරනවා or වෙනවා form their past participles with the usual past participles of those verbs:

පාවිච්චි කරනවා	පාවිච්චි කරලා
හම්බ වෙනවා	හම්බ වෙලා

A common construction in which the Sinhalese past participle is used is the equivalent of two verbs joined by 'and'. Thus, the English expression 'I will go and see' will appear in Sinhalese with the 'go' verb in the form of the past participle and the 'see' verb in the -න්නම් form or, literally, the Sinhalese would be 'Having gone, I will see': මම ගිහින් බලන්නම් .

Note particularly that in this construction the subject of both verbs must be identical:

අපට දඹානට ගිහිල්ලා ටික දවසක් ගත කරන්න පුලුවනි.	We can go to Dambana and spend a few days (there).
මම ඊයෙ කොලඹ ගිහිල්ලා පොත් ගෙනාවා.	Yesterday I went to Colombo and brought books.
බංඩා පොල් කඩලා ගෙදර ගියා.	Banda picked coconuts and went home.

8. 'GLAD, PLEASED'

8.1 Expressions such as සන්තෝස 'glad' or 'pleased' and කැමති 'glad', 'like' may be used with a dependent noun or pronoun in the dative case:

මම නැටුම්වලට කැමතියි.	I like dances.
මම ඒකට සන්තෝසයි.	I am pleased about it.

8.2 The same forms may be used with a dependent infinitive equivalent to English 'glad to', 'pleased to', although this construction may only be used if the subject of සන්තෝස or කැමති is identical with the subject of the infinitive.

මම ඒ පලාතට යන්න කැමතියි.	I like to go to that area.

In this construction, the student is advised to use only කැමති, because සන්තෝස is more rarely used.

8.3 Likewise, the same expressions may take a simple present or simple past tense in the dative case (i.e., with -ට added to the simple present or past). In this usage the subject of කැමති or සන්තෝස may or may not be the same as the subject of the dependent verb. If they are the same, the construction may equate with the English 'glad to', 'pleased to', or 'glad that', 'pleased that', and is an alternative to the construction with an infinitive. In this construction, the student is advised to use only සන්තෝස , since කැමති is more rarely used. If the subject of සන්තෝස or කැමති is different from the subject of the dependent verb, then the construction will equate with English 'glad that', 'pleased that' and in this case only this construction and not the one with the infinitive is used:

මම මහත්තයා හම්බ උනාට සන්තෝසයි.	I'm glad to have met you. or I'm glad that I met you.
මම මහත්තයා එනවාට කැමතියි.	I'm glad that you are coming.

9. බලනවා 'TRY'

බලනවා 'to see' when used with a dependent infinitive has the meaning 'to try'.

මම හෙට එන්න බලන්නම්.	I'll try to come tomorrow.
මේ වැඩේ අද ඉවර කරන්න බලන්න.	Try to finish this work today.

10. ඉස්සෙල්ලා

The form ඉස්සෙල්ලා 'before' is used with a dependent noun in the dative case (like ඉස්සර --14,9) or with a dependent verb in the infinitive.

කෑමට ඉස්සෙල්ලා බීර එකක් බොමු ද?	Shall we have a beer before eating?
එන්න ඉස්සෙල්ලා ලියුමක් දාන්න.	Write to me before coming.

11. වැඩියෙ

වැඩියෙ used with most adjectives equates with the English comparative, i.e., වැඩියෙ හොඳ 'is better than', වැඩියෙ අමාරු 'more difficult than', as stated in 19, 7.3. When used with the adjective වෙනස් 'different' this combination equates with English 'different from'.

මහත්තයා ළමයාට වැඩියෙ හොඳයි.	The master is better than the boy.
මේ එළෝළු අර එළෝළුවලට වැඩියෙ හොඳ ද?	Are those vegetables better than those?
පුතා මට වැඩියෙ වෙනස්.	The son is different from me.

12. ඇති

12.1 The form ඇති 'might be', 'must be' may be used with adjectives:

මේක හොඳ ඇති.	This might be good.
මේ වැඩේ අමාරු ඇති.	This work must be difficult.

12.2 ඇති may also be added to a sentence with the verb in the simple present form:

මහත්තයා දකුණු පලාතෙ වැඩ කරනවා ඇති.	The master must be working in the southern province.
මුරකාරයා අද ඉක්මනට එනවා ඇති.	The watchman might be coming early today.

13. නිවාඩුව

Note that the direct plural form නිවාඩු may be used as an adjective, as in the expression ඉස්කෝලෙ නිවාඩු කාලෙක 'at a time the school is on vacation'.

Exercises

A. Substitute orally:

1. මෙතන .... බඩු නෑ.

as much as in our village
as much as in the shop
as much as in Colombo
as much as there
as much as in my house
as much as in the eastern province
as much as in the South
as much as in the North
as much as in the West
as much as in our school area

2. .... කොලඹ විතර මිනිස්සු නෑ.

in the eastern province
in undeveloped areas
in Jaffna
in our village
in the villages of the rural area

3. .... මට කියන්න.

if the master comes
if the big boss goes
if you build the fence
if the train gets late
if you do the work
if uncle goes for a job
if the vacation starts in the school
if Banda fetches the firewood
if the child understands this book
if the child falls

4. මහත්තයා .... ආපහු ගියා.

came here and
brought the car and
did the work and
ate the food and
wrote the book and
saw the patient and
bought the goods and
gave me some money and
drank a beer and
came to the station and

5. මම .... කැමතියි.

dances
Sinhalese food
the rural area
the Ceylonese people
to live in Ceylon
to learn English
to work
to travel by bus
people who live in the country
children who learn well

6. මම .... බොහොම සන්තෝසයි.

that I met you
that you went to Colombo
that you are coming here
that you gave the money
that you paid the wages

7. අද මේ වැඩේ ....

try to do
try to finish
try to start
try to stop
try to do to some extent
try to finish today

8. ඒ වැඩේ ....

must be good
must be difficult
must be different
must be finished
must be strange
must be good?

9. බංඩා අද ....

may be working
must be going to the workshop
may be asking for his salary
may be bringing the books
must be coming to work in the estate

10. .... බලන්න එන්න.

the house I am building
the book I am writing
the taxi he is driving
the hotel where my teacher stays
the area where the Veddas live
the train that comes from Colombo
the men who are building that road
the dance which is in our village tonight
the garage where my car is repaired
the way in which Sinhalese is taught in this school

B. Transform according to the model, combining the two sentences with the past participial form of the first verb:

මහත්තයා කෑම කාවි. කොලඹ යාවි...මහත්තයා කෑම කාලා කොලඹ යාවි.

1. මම වැඩ කරනවා. ගෙදර එන්නම්.
2. ඔහේ පොල් කඩන්න. බංගලාවට එන්න.
3. බංඩා වැට බැන්දා. ගෙදර ගියා.
4. දොස්තර මෙහේට ආවා. ලෙඩා බැලුවා.

5. ළමයා දර ඇද්දා. සල්ලි ගත්තා.
6. මම වැස්සියක් නවත්තන්නම්. මහත්තයාට කියන්නම්.
7. ඩ්‍රයිවර් කාර් එක ගෙදර ගෙනාවා. යාපනේට යනවා.
8. පුතා ඉස්කෝලෙ ගියා. ආපහු ආවෙ නෑ.
9. මහත්තයා ගැරේජ් එකට ගියා. ආපහු එන්නෙ හවස.

C. Transform according to the model by substituting the conditional form for the verb plus 'if'.

මම ගෙදර යනවා නම් පොත් ගේන්නම්...මම ගෙදර ගියොත් පොත් ගේන්නම්.

1. බංඩා වැඩ කරනවා නම් පඩි දෙන්න.
2. මහත්තයා ගෙදර එනවා නම් මගේ ආපහු යන්න.
3. ළමයා ලියුමක් එවනවා නම් මට එන්න පුළුවනි.
4. කඩේ කවසිනවා නම් තැපුම් බලන්න යන්න බෑ.
5. වැඩ කල්ලියා ඉවර වෙනවා නම් වැට බඳින්න.
6. මහ ඔය යනවා නම් වැද්දො බලන්න පුළුවනි.
7. ළමයා දුක ගැහෙනවා නම් කතා කරන්නම්.
8. අල බතල තියෙනවා නම් කෑමෙන් බාදාවක් නෑ.
9. භාෂාව ඉගෙනගන්නවා නම් ලංකාවට යන්න පුළුවනි.

D. Transform according to the model, combining the two sentences:

මම කොළඹ යනවා. ඊට ඉස්සෙල්ලා ගමට එනවා. මම කොළඹ යන්න ඉස්සෙල්ලා ගමට එනවා.

1. අද මම වැට බැන්දා. ඊට ඉස්සෙල්ලා පොල් කැඩුවා.
2. මහත්තයා වැඩ කෙරුවා. ඊට ඉස්සෙල්ලා ලියුමක් ලිව්වා.
3. පුතා ඉස්කෝලෙ ගියා. ඊට ඉස්සෙල්ලා පොත් කියෙව්වා.
4. නෝනා එලෝලු ගන්නවා. ඊට ඉස්සෙල්ලා මෙහේ එයි.
5. දොස්තර ආපහු එයි. ඊට ඉස්සෙල්ලා ලෙඩා බලාවි.
6. ඇපොතිකරි දකුණු පලාතට යාවි. ඊට ඉස්සෙල්ලා කාර් එකක් ගනීවි.
7. මම ඩ්‍රයිවර් ඉස්ටේසමට එවන්නම්. ඊට ඉස්සෙල්ලා ටැලිපෝන් කරන්නම්.

E. Say in Sinhalese:

1. Maybe you are a southerner.
2. No. I am from the eastern province.
3. Is the eastern province as developed as the South?
4. No. But there are all kinds of yams.

5. Therefore there is no problem about food.
6. Do you like to live there?
7. Yes. I prefer country life to Colombo life.
8. One day I must go to see that area.
9. Do the Veddas live near there?
10. No. The Veddas live in Dambana.
11. Dambana is about twenty miles from my village.

12. Is the Sinhalese language different from the English language?
13. Yes. But English isn't difficult to learn.
14. I know several languages. But I don't know English.
15. I'd like to learn Sinhalese.
16. Can you teach me Sinhalese?
17. If you teach me Sinhalese, I'll teach you English.
18. That's good. Let's start tomorrow.

Review 5

A. Substitute orally:

1. ඒ ලමයාට ....

had to work
had to go to Colombo
had to go home
had to clean up the estate
had to cut some firewood
had to pick some coconuts
had to wash the car
had to build a fence
had to go to the bungalow
had to give the money
had to fetch the firewood
had to go to work
had to finish the work on the road
had to close the old road

2. බංඩාට ....

is to take the truck
is supposed to take the bus
is supposed to stop a while
is supposed to get a taxi
is to go on foot
is supposed to borrow money
is supposed to build some houses
is to go to see the boss
is to find the money
is to pay the wages

3. මාමාට ඊයෙ ....

was supposed to work
was supposed to go to Colombo
was supposed to go home
was supposed to clean up the estate
was supposed to pick fifty coconuts
was supposed to take the car
was supposed to build a fence
was supposed to borrow money
was supposed to see the boss

4. මට අද වැඩ කරන්න ....

want
can
cannot
don't want
will be able
will want
will not be able
didn't want
couldn't
was able
will get fed up
didn't get fed up

5. මේ ළමයා .... ලොකුයි.

more than my son
more than my daughter
more than Banda
more than our children
more than my sons
more than Indian children
more than American childrer
more than my uncle's son

6. .... හොඳ මදි.

The food that I'm eating
The work that Banda is doing
The coconuts that he is picking
The book you are reading
The bus in which you are going
The shop in which my son is
The taxi you are taking
The school in which I teach
The way in which these people live
The food that is in the rural area

The things there are to learn
The food that burns the mouth
The tea that the lady is drinking
The area in which the school is
The books that I am reading now

7. මම .... කැමතියි.

to learn Sinhalese
to go to Ceylon
to live in America
to go by train
to go to England
Sinhalese food
American people
English books
this gentleman
to eat hot food
this gentleman's books

8. මම .... සන්තෝසයි.

that you went to Colombo
that I met you
that he came here
that you are dancing
that you are going to America
that you came this way
that you are teaching Sinhalese here
that you are staying in the southern province
that you eat all kinds of yams
that you went to see the Veddas

9. මේක ....

is like my car
is like the Colombo bus
is like my book
is like (my) father's estate
is like our fence
is like Mr. Perera's bungalow
is like our truck
is like a new road
is like an advance
is like a stone
is like a taxi
is like the house in the estate

10. .... ඉගනගන්න අමාරුයි.

without books
without money
without reading
without reading Sinhalese
without knowing English
without buying the books
without going to school
without knowing the script
without going to Ceylon
without living in the rural area
without getting to know the teacher
without staying here

11. මම .... අරකට කැමති නෑ.

as much as this
as much as this book
as much as these cigars
as much as this car
as much as this road
as much as the Austin
as much as the express train
as much as this paper

12. මේ .... මම දන්නවා.

all the men
all the books
all the headmasters
all the buses
all the trucks
all the roads
all the American gentlemen
all the English people

B. Transform according to the model by adding 'try to'.

මම හෙට එන්නම්.....මම හෙට එන්න බලන්නම්.

1. මහත්තයා ගනුදෙනුවක් ඉල්ලාගනීවි.
2. උන්නැහේ බස් එකෙන් යනවා.
3. මොනවා ද අද කෙරුවෙ.
4. බංඩා දර කපනවා.
5. එයා ගඟ අයිනෙන් වැටක් බඳිනවා.

6. මම කාර් දෙකම සෝදන්නම්.
7. නෝනා සල්ලි දේවි.
8. ඩ්‍රය්වර් වත්තට ලොරිය ගෙනියනවා.
9. සල්ලි හිඟ නම් මට කියන්න.
10. ඒ ලමයා ගහ අදිනවා.
11. හෙට එනකොට කුලී කාර් එකක් ගන්න.
12. ගනුදෙනුව ඉක්මනට සොයාගන්න.
13. මහත්තයා තව ටිකක් පරක්කු වේවි.
14. උන්නැහේ එංගලන්තෙ පදිංචියට යනවා ද?
15. මේ දෙගොල්ල අතරෙ වෙනස කියන්න.
16. මම ඇමෙරිකාවෙදිත් සිංහල ටිකක් ඉගනගත්තා.
17. පිටිසර ජීවිතේ ගැන දැනගන්න ඕන නම් මෙහේ නවතින්න.
18. මම මහත්තයාට පුරුදු කෑම් බීම් හදන්නම්.
19. ඉඩ තියෙනවා නම් මේ පැත්තෙ එන්න.
20. මම තේ එකක් බොනවා.
21. මේ මහත්තයා කට දන කෑම කනවා.
22. ඒ ලමයා ඕන දෙයක් කනවා.
23. අපි හෙට කොලඹ යන්නම්.

C. Transform by changing the singular nouns into plurals:

1. මේ මිනිහාගෙ වැඩ හොඳ මදි.
2. මේ පොතේ පින්තූර නැද්ද?
3. මේ පොතට කීයක් ඕන ද?
4. මේ බස් එකේ හුඟක් මිනිස්සු ඉන්නවා.
5. ලමයා ලඟ සල්ලි නෑ.
6. මම ඉස්කෝලෙන් පොත් දෙකක් ගෙනාවා.
7. අර පුතාගෙන් සල්ලි ඉල්ලාගන්න.
8. මහත්තයා වත්ත වඩුවාට දුන්නා.
9. මම නොදියුනු පලාතක රස්සාවක් කරන්න යනවා.
10. එංගලන්තෙ මහත්තයායි ඇමෙරිකාවෙ මහත්තයායි අද ලංකාවට ආවා.

D. Transform according to the model by combining the sentences with past participles:

මම ගමට ගියා. මම කෑම කෑවා...මම ගමට ගිහිල්ලා කෑම කෑවා.

1. ඒ මහත්තයා ලංකාවට ආවා. එයා ලංකාවෙදි සිංහල ඉගෙනගත්තා.
2. මම වත්ත සුද්ද කෙරුවා. බංඩාට සල්ලි දුන්නා. ආපහු ආවා.
3. බංඩා පොල් කැඩුවා. දර ඇද්දා. ගෙදර ගියා.
4. ඒ මිනිහා වැඩට ඒවි. බංගලාව සුද්ද කරාවි.
5. ඩ්‍රයිවර් පාර හදනවා. හෙට ලොරිය ගෙනියාවි.
6. මම මහත්තයාට කියන්නම්. ඇඩ්වාන්ස් එකක් ඉල්ලාගන්නම්.
7. සුමානෙ ඉවරවෙන කං ඉන්න. සල්ලි ඉල්ලාගන්න බලන්න.

E. Transform into 'maybe' sentences by adding වෙන්න ඇති.

1. බංඩා ගෙදර යනවා.
2. එයා වත්ත සුද්ද කෙරුවා.
3. ජෝන් අද සල්ලි දෙනවා.
4. ඩ්‍රයිවර් දඹාසට යනවා.
5. මහත්තයා අද පරක්කු වෙනවා.
6. ඒ මහත්තයා ඇමෙරිකාවෙ.
7. උන්නැහේ වැඩ කරන්නෙ නෑ.
8. මහත්තයා ආවෙ රටතොට බලන්න.
9. මට පුරුදු කෑම මෙහේ නෑ.
10. සිංහල අමාරු බාසාවක්.

F. Say in Sinhalese:

1. This is Mr. Gunasekera, (and) this is my teacher.
2. Perhaps you are an American.
3. It is difficult to know the difference between Americans and English people.
4. It isn't more than a month now.
5. Did you come here recently?
6. I'm glad to hear that.
7. Are you doing any work in this area?
8. What are the foods (and drinks) you are used to?
9. Food is no problem.
10. Try to come here sometime.

11. We'd better go now.
12. Maybe you are from the South.
13. I'm an American teacher.
14. The language is rather different, too.
15. It isn't that difficult.
16. There are all kinds of foods and drink
17. You will never have to starve.
18. To go to Kalutara you must go about twelve miles from Colombo.
19. If you are coming, write to me early.
20. Can I meet the big boss?

D. Conversations:

1. B is a foreigner who plans to spend a week or so in a rural area. He discusses his plans with A, who lives there. Problems of food and drink, places to live, differences in language, people etc., are discussed.

2. A has been to see the headmaster of a school in Dambana, and is discussing his trip with B. The nature of the country, difficulties in transportation, and the school are the topics discussed.

3. An American visits an estate with his friend Mr. Perera. He is introduced to the owner, Mr. Mendis. The three of them chat about America and about John's plans for the remainder of his stay in Ceylon. Mr. Mendis invites him and Perera to spend some time on his estate.

LESSON 21

Conversation: Festivals of Ceylon

John Wood asks Gunapala for some details on Sinhalese festivals.

JOHN

නුවර	Kandy
පෙරහැර	the procession, Perahera
පවත්තනවා	conduct, hold
කොයි	which
නුවර පෙරහැර පවත්තන්නෙ කොයි කාලෙ ද?	When is the Kandy Perahera held?

GUNAPALA

ජූලි	July
අග දි	at the end
ජූලි මාසෙ අග දි.	At the end of July.
දකිනවා	see
දැකලා නෑ	hasn't seen
මහත්තයා නුවර පෙරහැර දැකලා නැද්ද?	Haven't you seen the Kandy Perahera?

JOHN

මේ පාර	this time
නෑ. මම මේ පාර වත් බලන්න ඕන.	No. I must see it at least this time.
සෙනග	the crowd
පෙරහැර බලන්න හුඟක් සෙනග එනවා ඇති, නේ ද?	Many people must come to see the Perahera, mustn't they?

GUNAPALA

කාලෙට	at the time
ඇඟිල්ල	the finger
ගහනවා	poke, hit, strike
ඔව්. පෙරහැර කාලෙට නුවර ඇඟිල්ලක් ගහන්න බෑ.	Yes. During the Perahera, Kandy is packed.
ඒ තරමට	that much
ඒ තරමට සෙනඟ.	There's that much of a crowd!

JOHN

පෙරහැර කාලෙට ඉස්කෝලවල නිවාඩු ඇති, නේ ද?	During Perahera time the schools must be on vacation, mustn't they?

GUNAPALA

අගෝස්තු	August
මැද	middle
මැද හරිය	about the middle
ග්‍රීස්ම	hot (weather)
ඔව්. ජූලි මාසෙ අග ඉඳලා අගෝස්තු මැද හරිය වෙන කං ඉස්කෝලවල ග්‍රීස්ම නිවාඩුව.	Yes. From the end of July till about the middle of August schools are on summer vacation.
එක්ක එනවා	bring (a person)
ඇයි? බබාලාත් එක්ක එන්න ද?	Why, do you want to bring the children also?

JOHN

පෙන්නනවා	show
හිත	the mind
හිතේ තියෙනවා	intend

ඔව්. ළමයින්ටත් පෙරහැර පෙන්නන්න හිතේ තියෙනවා.	Yes. I intend to show the Perahera to the children, also.
හම්බ වෙනවා	get a chance
මේ පාර බලන්න බැරි උනොත් බලන්න හම්බ වෙන්නෙ නෑ.	If we aren't able to see it this time, we won't get a chance to see it.
ජූලි වල	in July
අපි ලබන ජූලි වල ආපහු යනවා.	We are going back next July.

GUNAPALA

කොහොම හරි	somehow or other
වෙසක් එක	the Vesak (a Buddhist festival)
උත්සවේ	the festival, function
එහෙම ද?	Is that so?
එහෙනම් යන්න ඉස්සෙල්ලා කොහොම හරි බබාලාට වෙසක් උත්සවෙත් පෙන්නන්න ඕන.	Then, somehow or other you must show the children the Vesak celebrations also before you go.

JOHN

මැයි වල	in May
වෙසක් තියෙන්නෙ මැයි වල, නේ ද?	Vesak is in May, isn't it?

GUNAPALA

වෙසක් එකට	for Vesak, at Vesak
ඔව්. වෙසක් එකට කොළඹ ඉඳලා දකුණු පලාතට කාර් එකෙන් යන්න ඕන.	Yes. At Vesak time you must go by car from Colombo to the southern province.

u

දිගටම	all along
නොයෙක්	various
සැරසිලි	decorations
එතකොට පාර දිගටම නොයෙක් සැරසිලි බලන්න පුලුවනි.	Then you can see various decorations all along the road.
වියදම් කරනවා	spend (money)
මිනිස්සු වෙසක් සැරසිලිවලට හුඟක් වියදම් කරනවා.	People spend a lot on Vesak decorations.
තරඟෙ	the competition
තරඟෙට	in competition
හුඟක් සැරසිලි කරන්නෙ තරඟෙට.	Most decorations are done in competition.
අප්රියෙල්	April
පටන්ගත්තාම	when started
හතරක් පහක්	four or five
අප්රියෙල් මාසෙන් පටන්ගත්තාම මාස හතරක් පහක් ම ලංකාවෙ උත්සව කාලෙ.	Beginning in April, for four or five months it is the festival time in Ceylon.

JOHN

අප්රියෙල් වල මොකක් ද තියෙන්නෙ?	What do you have in April?

GUNAPALA

සිංහල අවුරුද්ද	Sinhalese New Year
ඇයි? සිංහල අවුරුද්ද?	Oh! (How about) the Sinhalese New Year?
සිංහල අවුරුද්ද අප්රියෙල් දහතුන්වෙනිදා.	The Sinhalese New Year is on the 13th of April.

JOHN

ඔය උත්සවවලට වියදම් කරන්නෙ ආඬුවෙන් වෙන්න ඇති.	It must be the government that pays for those festivals.

මහජනයා	the public
පුද්ගලික	private
මුදල්	the money, funds
නෑ. නෑ. සේරම කරන්නෙ මහජනයාගෙ පුද්ගලික මුදලෙන්.	No, no. Everything is done with the people's private funds.
නිදහස් උත්සවේ	the Independence Festival
ආංඩුවෙන් වියදම් කරන්නෙ නිදහස් උත්සවේට විතරයි.	The government pays only for the Independence Festival.
පෙබරවාරි	February
ඒක පෙබරවාරි හතරවෙනිදා.	That is on the 4th of February.

JOHN

ඔව්. ගිය පාර නිදහස් උත්සවේ බලන්න අපිත් ගියා.	Yes. Last time we too went to see the Independence festival.
නැතුව ඇති	maybe not
ලංකාවෙ විතර නිවාඩු දවස් වෙන කොහේ වත් නැතුව ඇති, නේ ද?	There's probably no other place with as many holidays as Ceylon, don't you think?

GUNAPALA

වෙන්න පුලුවනි	it may be (so)
ඇත්ත වෙන්න පුලුවනි.	May be true.
ආගම	the religion
ලංකාවෙ නොයෙක් ආගම්වල මිනිස්සු ඉන්නවා, නේ?	In Ceylon there are people of various religions, aren't there?
හේතුව	the reason
ඒකයි හේතුව.	That's the reason.

Extra Vocabulary

මුල	'the beginning'

Grammar

1. NEW NOUNS

Class 1

වෙසක් එක	'the Vesak festival'

Class 2

ජනවාරිය	'January'; gen. ජනවාරියෙ ; pl. ජනවාරි
පෙබරවාරිය	'February'; gen. පෙබරවාරියෙ ; pl. පෙබරවාරි
මාර්තුව	'March'; gen. මාර්තුවෙ ; pl. මාර්තු
අගෝස්තුව	'August; gen. අගෝස්තුවෙ ; pl. අගෝස්තු
පෙරහැර	'the procession'; gen. පෙරහැරේ ; pl. පෙරහැරවල්
සෙනග	'the crowd'; gen. සෙනගෙ (no plural)
ඇඟිල්ල	'the finger'; gen. ඇඟිල්ලෙ ; pl. ඇඟිලි
හිත	'the mind'; gen. හිතේ ; pl. හිත්
සැරසිල්ල	'the decoration'; gen. සැරසිල්ලෙ pl. සැරසිලි
මුදල	'the money, funds'; gen. මුදලෙ ; pl. මුදල්
ආගම	'the religion'; gen. ආගමේ ; pl. ආගම්
හේතුව	'the reason'; gen. හේතුවෙ ; pl. හේතු

Class 3

නුවර	'Kandy' (no plural)
අග	'the end' (no plural)
මැද	'the middle' (no plural)
මුල	'the beginning' (no plural)

Class 4

කාලෙ	'the time'
උත්සවේ	'the festival, function'
තරගෙ	'the competition'

Class 5

මහජනයා	'the public' (no plural)

Other Nouns

The following are plural only:

අප්රියෙල්	'April'
මැයි	'May'
ජූනි	'June'
ජූලි	'July'
සැප්තැම්බර්	'September'
ඔක්තෝබර්	'October'
නොවැම්බර්	'November'
දෙසැම්බර්	'December'

2. NEW VERBS

Class 1

පවත්තනවා	'conduct, hold'
ගහනවා	'hit, poke, strike'

Class 2

දකිනවා	'see'

3. NAMES OF THE MONTHS

3.1 Four of the months--January, February, March and August--occur in both singular and plural forms, and the other eight occur only in plural forms. They are the following:

Singular	Plural	
ජනවාරිය	ජනවාරි	'January'
පෙබරවාරිය	පෙබරවාරි	'February'
මාර්තුව	මාර්තු	'March'
අගෝස්තුව	අගෝස්තු	'August'
	Plural only	
	අප්රියෙල්	'April'
	මැයි	'May'
	ජූනි	'June'
	ජූලි	'July'
	සැප්තැම්බර්	'September'

Plural only

ඔක්තෝබර්	'October'
නොවැම්බර්	'November'
දෙසැම්බර්	'December'

3.2 When used in the direct form, e.g., as the subject of a sentence, a month with two forms may be used in the direct singular or direct plural, or in the direct plural with මාසෙ (also direct form). The months with a single form are used in the direct plural, or in the direct plural with මාසෙ . Thus:

ජනවාරිය අවුරුද්දෙ පලවෙනි මාසෙ.	January is the first month of the year.
ජනවාරි අවුරුද්දෙ පලවෙනි මාසෙ.	January is the first month of the year.
ජනවාරි මාසෙ අවුරුද්දෙ පලවෙනි මාසෙ.	January is the first month of the year.
අප්‍රියෙල් අවුරුද්දෙ හතරවෙනි මාසෙ.	April is the fourth month of the year.
අප්‍රියෙල් මාසෙ අවුරුද්දෙ හතරවෙනි මාසෙ.	April is the fourth month of the year.

3.3 To express 'in January', etc., the alternatives are to use a genitive singular (for those months with a singular form), or genitive plural or the direct plural with මාසෙ (which is also a genitive form).

මම ජනවාරියෙ ගමට යනවා.	I'm going home in January.
මම ජනවාරි වල ගමට යනවා.	I'm going home in January.
මම ජනවාරි මාසෙ ගමට යනවා.	I'm going home in January.
මම අප්‍රියෙල් වල මෙහේ එන්නම්.	I'll come here in April.
මම අප්‍රියෙල් මාසෙ මෙහේ එන්නම්.	I'll come here in April.

3.4 To express 'a date of a month' the ordinal numeral plus දා is used following the name of the month in the direct plural or in this form with මාසෙ :

ජනවාරි දෙවෙනිදා	January 2nd
ජනවාරි මාසෙ දෙවෙනිදා	January 2nd
අප්‍රියෙල් පස්වෙනිදා	April 5th
අප්‍රියෙල් මාසෙ පස්වෙනිදා	April 5th

4. INTERROGATIVES

4.1 Most of the location sets have a parallel interrogative form that makes up part of the set. They are the following:

The Location Set		Parallel Interrogative	
මේ	'this'	කොයි	'which'
මේක	'this one'	කෝක	'which one'
මෙහේ	'here'	කොහේ	'where'
මෙතන	'here (this spot)	කොතන	'where (which spot)'
මෙච්චර	'this much'	කොච්චර	'how much'

මුන්නැහේ has no parallel interrogative form. Only කොයි and කෝක are new in this lesson.

4.2 The inflection of මෙහේ and කොහේ are similar:

Direct	මෙහේ	කොහේ
Instrumental	මෙහෙන්	කොහෙන්
Dative	මෙහාට, මෙහෙට, මෙහේට	කොහාට, කොහෙට, කොහේට
Genitive	මෙහේ	කොහේ

4.3 Like the members of the මේක set, කෝක 'which one' is used as a pronoun referring to inanimate things, and like most interrogatives it will be the emphasized item in the sentence, immediately followed by ද :

මහත්තයා ගත්තෙ කෝක ද?	Which one did the master buy?
ඔහෙට කෝක ද ඕන?	Which one do you want?
නෝනා කෝකට ද කැමති?	Which one does the lady like?

4.4 කොයි 'which,' like the members of the මේ set, occurs before animate or inanimate, singular or plural nouns. The combination කොයි plus a following noun acts like a single interrogative word, and will be the emphasized item immediately followed by ද :

මහත්තයා කොයි පොත ද ගත්තෙ?	Which book did the master buy?
කොයි නැට්ටුවන්ට ද කැමති?	Which dancers do you like?

5. PRESENT PERFECT

Sinhalese has a present perfect form of the verb composed of the past participle of the verb plus the verb තියෙනවා and equating with the English present perfect 'have gone', 'have seen', etc. The verb තියෙනවා may occur in the simple form තියෙනවා , the emphatic form තියෙන්නෙ ,the negative form නෑ or the negative emphatic form නැත්තෙ .

මම සිංහල කෑම කාලා තියෙනවා.	I have eaten Sinhalese food.
මම කාලා තියෙන්නෙ සිංහල කෑම.	It is Sinhalese food that I have eaten.
මම සිංහල කෑම කාලා නෑ.	I haven't eaten Sinhalese food.
මම කාලා නැත්තෙ සිංහල කෑම.	It is Sinhalese food that I haven't eaten.

6. -ට WITH TIME EXPRESSIONS

-ට is added to expressions of time as an equivalent of English 'at' a time. Compare the same with numbers indicating time (11, 7):

පෙරහැර කාලෙට	at the time of the procession
උදේ හයට	at six o'clock in the morning
මහත්තයා එන වෙලාවට	at the time the master is coming

7. 'BEGINNING,' 'MIDDLE,' 'END'

7.1 With the names of months, මුල 'the beginning (of)', මැද 'the middle (of)' and අග 'the end (of)' customarily follow the name of the month in the direct plural form or in the direct plural form with මාසෙ :

ජනවාරි අග ජනවාරි මාසෙ අග	the end of January
මාර්තු මැද මාර්තු මාසෙ මැද	the middle of March
අගෝස්තු මුල අගෝස්තු මාසෙ මුල	the beginning of August

7.2 With nouns referring to periods of time such as සුමානෙ 'the week,' මාසෙ 'the month', and අවුරුද්ද 'the year', මුල, මැද and අග will ordinarily follow the direct singular form.

මාසෙ මුල	the beginning of the month
සුමානෙ මැද	the middle of the week
අවුරුද්ද අග	the end of the year

7.3 The expressions above, in 7.1 and 7.2, besides meaning 'the end of . . .' may be used to mean 'at the end of . . .' In this meaning, the time expression may, optionally, be followed by දී 'while, during':

ජූලි මාසෙ අග නුවර එන්න. ජූලි මාසෙ අගදී නුවර එන්න.	Come to Kandy at the end of July.

8. 'FROM . . . UNTIL'

As stated earlier(6, 9), ඉඳලා may be used with time expressions in the sense 'from':

ජූලි මාසෙ අග ඉඳලා	from the end of July

In expressing 'from a given time until a given time', 'until' is expressed with වෙනකං :

ජූලි මාසෙ අග ඉඳලා අගෝස්තු මාසෙ මැද වෙනකං ඉස්කෝලෙ නිවාඩු.	From the end of July until the middle of August, the school is on vacation.

9. ඒ තරමට සෙනග

ඒ තරමට equates with English 'There was so much, there were so many'. තරමට is the dative case of the noun තරම 'amount, quantity'.

ඇඟිල්ලක් ගහන්න බෑ. ඒ තරමට සෙනග.	You can't poke a finger, there is so much of a crowd.
වාඩිවෙලා ඉන්න වත් බෑ. ඒ තරමට අසනීපයි.	He can't even keep sitting down, he is so ill.
මොකක් වත් සොයාගන්න බෑ. ඒ තරමට බඩු.	There is so much stuff, I can't find anything.

10. 'TO HAVE IN MIND', 'INTEND'

The expression හිතේ තියෙනවා is an equivalent of the English 'to have in mind', 'to intend'. හිතේ is the genitive case of the noun හිත 'mind', so the expression is, literally, 'There is in mind'. This expression is used with a subject in the dative case and a dependent infinitive.

මට වැඩ කරන්න හිතේ තියෙනවා.	I intend to work.
මට පොතක් ලියන්න හිතේ තියෙනවා.	I intend to write a book.
ඒ මහත්තයාට කාර් එකක් ගන්න හිතේ තිඋනා ලු.	It seems he intended to buy a car.
කොළඹ යන්න හිතේ නැද්ද?	Don't you intend to go to Colombo?

11. INDIRECT OBJECT

The verb පෙන්නනවා 'to show' takes the indirect object in the dative case and the direct object in the direct case.

මම මහත්තයාට පොතක් පෙන්නන්නම්.	I'll show you a book.
ළමයා මට කාර් එක පෙන්නුවා.	The boy showed me the car.

12. 'BRING', 'TAKE AWAY'

The form එක්ක used with එනවා and යනවා may have the meaning 'bring', and 'take away' respectively. This expression is restricted to bringing and taking away people, and may not be used for things or animals. The construction differs from the construction 'to come with' (11,5) since 'to come with' requires the noun dependent on එක්ක to have ත් suffixed to it, whereas the එක්ක in 'to bring', 'to take away' does not require this ත් . In the 'bring' and 'take away' construction a noun may have ත් suffixed to it, but in this case it is ත් meaning 'also', not a ත් required by the construction:

නෝනා එක්ක එන්න.	Bring (your) wife.
මහත්තයා බබාලාත් එක්ක එනවා ද?	Are you bringing the children, too?
පුතා එක්ක යන්න එපා.	Don't take the son.

13. INFINITIVE

The infinitive may be used in a question to ask if the hearer is about to or intends to do something:

බබාලාත් එක්ක යන්න ද?	Do you intend to take the children, too?
දැන් ඉස්කෝලෙට යන්න ද?	Are you about to go to the school now?

It is also commonly used in questions in the first person to ask 'should I', 'may I', or 'am I supposed to':

මම මේ පොල් සේරම කඩන්න ද?	Should I pick all these coconuts?
මම කාර් එක ටිකක් එලවන්න ද?	May I drive the car for a while?

14. 'TO GET A CHANCE TO'

හම්බ වෙනවා may be used with a dependent infinitive in the meaning 'to get a chance to', 'to be able to'. The subject of හම්බ වෙනවා is in the dative case.

මට අද යන්න හම්බ වෙන්නෙ නෑ.	I won't get a chance to go today.
මහත්තයාට වැඩ කරන්න හම්බ උනා ද?	Did you get a chance to work?

15. 'ALONG'

The adjective දිග 'long' may add -ට to produce the equivalent of English 'along'. This form may be used as a postposition with a dependent noun in the direct case. The emphatic ම may be added to දිගට to mean 'all along', 'non-stop', 'straight ahead'.

ළමයා පාර දිගට වැටක් බඳිනවා.	The boy is building a fence along the road.
මම දිගටම වැඩ කරන්න කැමතියි.	I like to work non-stop.
ඔය පාර දිගේ දිගටම යන්න.	Go straight ahead along that road.

16. THE PAST TEMPORAL GERUND

The past temporal gerund is formed from the simple past tense form of the verb by adding ම . Thus:

Simple Past		Past Temporal Gerund
පටන්ගත්තා	started	පටන්ගත්තාම
ගියා	went	ගියාම
කැපුවා	cut	කැපුවාම
ඇද්දා	drew	ඇද්දාම
වැටුනා	fell	වැටුනාම

Note that the vowel before -mə is always pronounced as long aa, whether the final vowel of the simple past is long or short: giyaa, giyaamə, kæpuwa, kæpuwaamə.

This form is used to introduce a subordinate temporal clause the time of which is previous to the time of the main clause. Its use parallels that of the present temopral gerund which introduces a subordinate clause, the time of which is either contemporaneous with or future to the time of the main clause. Thus:

මහත්තයා එනකොට මම වැඩ කරන්නම්.	I'll work when (at the time) the master comes (or I'll be working when he comes).
මහත්තයා ඇවාම මම වැඩ කරන්නම්.	I'll work when (after) the master comes.
වැඩ පටන්ගන්නකොට ගුනපාල ගියා.	Gunapala went away when (at the time) the work was starting.
වැඩ පටන්ගත්තාම ගුනපාල ගියා.	Gunapala went away when (after) the work started.

Both these gerunds are likely to equate with an English 'when' clause.

17. 'FOUR OR FIVE'

The Sinhalese equivalent 'three or four'. 'four or five', etc., may be expressed without a conjunction. If the form required is an indefinite, both numerals will be indefinite for inanimate expressions, but for animates only the last one will be indefinite, and the first one will be the stem form:

මට රුපියල් දෙකක් තුනක් දෙන්න.	Give me two or three rupees.
මෙහේ මිනිස්සු තුන් හතර දෙනෙක් ඉන්නවා.	Here there are three or four people.

When the intensive particle ම is added to such an expression, the meaning is 'as much as', 'as many as':

මට පොත් හතරක් පහක් ම තියෙනවා.	I have (as many as) four or five books.
මට ලමයි දෙතුන් දෙනෙක් ම ඉන්නවා.	I have (as many as) two or three boys.

18. INSTRUMENTAL CASE

When something is given, dispersed or distributed to people generally by an organization or institution, the organization or institution is in the instrumental case:

වියදම් කරන්නෙ ආංඩුවෙන්.	The government incurs the expenses.
මේ පාර ආංඩුවෙන් හදනවා.	This road the government builds.

19. 'MIGHT, MIGHT BE"

As learned earlier, 'might be' is expressed in Sinhalese by replacing ඉන්නවා or තියෙනවා by ඇති. The negative of this construction, i.e.,'might not be' is expressed by replacing ඉන්නවා or තියෙනවා by නැතුව ඇති:

කාර් එක ගැරේජ් එකේ තියෙනවා.	The car is in the garage.
කාර් එක ගැරේජ් එකේ ඇති.	The car might be in the garage.
කාර් එක ගැරේජ් එකේ නැතුව ඇති.	The car might not be in the garage.

With other verbs, 'might' is expressed by adding ඇති to the simple present form:

මහත්තයා හෙට ඒ කාර් එක ගන්නවා ඇති.	The master might buy that car tomorrow.
උන්නැහේ හෙට කන්තෝරුවෙ නවතිනවා ඇති.	Tomorrow he might stay in the office.

The negative of this construction is expressed by changing the simple present to the emphatic form and adding නැතුව ඇති.

මහත්තයා හෙට ඒ කාර් එක ගන්නෙ නැතුව ඇති.	The master might not buy that car tomorrow.
උන්නැහේ හෙට කන්තෝරුවෙ නවතින්නෙ නැතුව ඇති.	Tomorrow he might not stay in the office.

ඇති may also be added to adjective predicate attributes. The assertion marker will be dropped:

මේ පොත හොඳයි.	This book is good.
මේ පොත හොඳ ඇති.	This book might be good.

The negative of such sentences is formed by substituting නැතුව ඇති for ඇති.

මේ පොත හොඳ නැතුව ඇති.	This book might not be good.

20. වෙන්න පුළුවනි

වෙන්න පුළුවනි 'likely, it can be' may be added to any complete statement to indicate a reasonable degree of likelihood that the statement might be true:

ඒක ඇත්ත.	It's true.
ඒක ඇත්ත වෙන්න පුළුවනි.	It might be true.
මහත්තයා වැඩ කරනවා.	The gentleman is working.
මහත්තයා වැඩ කරනවා වෙන්න පුළුවනි.	The gentleman might be working.

21. දකිනවා

The verb දකිනවා 'see' is seldom used in the present tense, but generally appears in either the past or perfect forms:

මහත්තයා පෙරහැර දැක්කෙ නෑ.	He didn't see the Perahera.
මම මේ පලාත දැකලා තියෙනවා.	I have seen this area.

22. IDIOMS

ඇඟිල්ලක් ගහන්න බෑ is literally 'Can't poke a finger.' This expression means 'It is very crowded.'

Exercises

A. Substitute orally:

1. නුවර පෙරහැර පවත්තන්නෙ ....

in July
in August
in January
in March
at the end of April
at the end of December
at the beginning of November
at the beginning of the week
at the end of the year
at the beginning of October
in the middle of May
in the middle of February
about the middle of June
about the end of September

2. මම .... බලන්න ඕන.

at least this time
at least this month
at least next month
at least at the end of next month
at least about the end of next month
at least in July
at least in the middle of July
at least about the middle of July
at least while in Ceylon
at least while in Kandy

3. .... නුවර හුඟක් සෙනඟ ඉන්නවා.

at the time of the Perahera
at the Vesak time
at the time of the Independence celebrations
in summer (i.e., the hot) time
at the end of July
at the time the procession is held
in the rainy season (i.e., time)
during the festival time

4. ජූලි මාසෙ ඉඳලා .... ඉස්කෝලෙ නිවාඩු.

till August
till the middle of August
till about the middle of August
till the summertime
till the end of August
till about the end of August
till the beginning of September
till about the beginning of September

5. .... හිතේ තියෙනවා.
to show the procession to the children
to bring (my) wife
to see the festival

to see the Vesak festival
to return
to see rural areas
to make decorations
to live in Ceylon all along
to see the Independence festival
to spend a lot

6. මම ආපහු යන්නෙ ....

on the fourth of July
on the fifth of May
on the first of January
on the twentieth of February
on the tenth of June
on the eleventh of August
on the ninth of September
on the eighth of October
on the sixth of November
on the fourteenth of March
on the nineteenth of April
on the twenty-fifth of December

7. මේකට වියදම් කරන්නෙ ....

the gentleman
we
my uncle
the government
the public
the people of Ceylon

8. මෙහේ .... නිවාඩු දවස් නෑ.

as much as in Ceylon
as much as in India
as much as in Colombo
as much as in your province
as much as in England
as much as in America
as much as in my country

9. මෙහේ තියෙන්නෙ ....?

which one
which goods
which vegetables
which Sinhalese books
which famous festivals
how many
how much firewood
how much

10. උන්නැහෙ කැමති .... ?

which one
which festivals
how many kinds of decorations
which trees
which large shops
which old houses
which road
which province in Ceylon
which resthouses in the upcountry
how much sugar

B. Transform according to the model by changing the verb to present perfect:

මම සිංහල කෑම කෑවා......මම සිංහල කෑම කාලා තියෙනවා.

1. අද මහත්තයා ආවා.
2. ඩ්‍රයිවර් කොළඹ ගියා.
3. දොස්තර ලෙඩා බැලුවා ද?
4. එයා කෑම කෑවෙ නෑ.
5. ගිය අවුරුද්දෙ පෙරහැර පැවැත්තුවෙ නුවර.
6. නෝනා කාර් එකේ වාඩිවුනා.
7. මුරකාරයා වැට බැන්දා.
8. බංඩා කැඩුවෙ මේ පොල් ද?
9. මම බීව්වෙ යාපනේ සුරුට්ටු.

C. Transform according to the model by using හිතේ තියෙනවා 'to have in mind':

මම වැඩ කරනවා......මට වැඩ කරන්න හිතේ තියෙනවා.

1. මහත්තයා කාර් එකක් ගන්නවා.
2. මම කොළඹ යනවා.
3. ගුනපාල පොතක් ලියනවා.
4. මුරකාරයා වැට බඳිනවා.
5. ඩ්‍රයිවර් යාපනේට යනවා.
6. මම ලබන මාසෙ නුවර යනවා.
7. ළමයා කෝච්චියෙන් යනවා ලු.
8. ඔහේ රස්සාවකට යනවා ද?
9. උන්නැහේ පෙරහැර බලන්න යනවා.

D. Transform according to the model, using හම්බ වෙනවා 'get a chance to' in the appropriate tense:

මම වැඩ කරනවා......මට වැඩ කරන්න හම්බ වෙනවා.

1. මහත්තයා පෙරහැර බලනවා.
2. මම මෙහේ සිගරැට් ගන්නවා.
3. ගුනපාල කාර් එකක් ගනීවි.
4. නෝනා මහත්තයා පොත් ටිකක් කියෙව්වා.
5. බංඩා අද වැටක් බැන්දා.
6. ළමයා කෝච්චියෙන් යනවා.
7. මම ලබන මාසෙ සීගිරියට යනවා.
8. ළමයි මේ දවස්වල හුඟක් ඉගනගන්නවා.

E. Transform according to the model, changing the present temporal gerund to the past temporal gerund:

මම යන කොට ඔහේ නවතින්න......මම ගියාම ඔහේ නවතින්න.

1. මහත්තයා කොළඹ යන කොට මම යාපනේ යනවා.
2. වැඩ පටන්ගන්න කොට මට ලියුමක් එවන්න.
3. මම කාර් එක එළවන කොට ඔහේට කියන්නම්.
4. දර අදින කොට සල්ලි දෙන්න පුළුවන් ද?
5. මුරකාරයා වැඩ පටන්ගන්න කොට බංඩාට ටවුමට යන්න පුළුවනි.
6. උත්සවේ පවත්තන කොට මම නුවර එන්නම්.
7. සැරසිලි කරන කොට හුඟක් වියදම් වෙනවා.
8. ඔහේ කොළඹ ඉන්න කොට මම වැඩ කරන්නෙ කොහොම ද?
9. සල්ලි ගන්න කොට ලියුමක් දෙන්න.

F. Transform to the negative, according to the model:

මහත්තයා යනවා ඇති......මහත්තයා යන්නෙ නැතුව ඇති.

1. ළමයාට පොත් ඇති.
2. උන්නැහේ වියදම් කරනවා ඇති.
3. මේ පාර ආංඩුවෙන් හදනවා ඇති.
4. මෙහේ ළමයි වැඩ කරනවා ඇති.
5. මට පොත් පහක් ඇති.
6. කොළඹ යන කොට පුතාත් යනවා ඇති.
7. උන්නැහේ වැඩ කරනවා ඇති.

G. Say in Sinhalese:

1. Do you have a lot of work these days?
2. Yes! These days I can't even eat my food.
3. Because of the festivals, a lot of crowds are coming to this area.
4. There is so much work in the shop!
5. I am on vacation this week.
6. If you need help, tell me.
7. I have to bring some goods for the shop from Colombo.
8. Could you go to get those goods?
9. You can take my car.
10. No, I can go in my car.
11. I have some books to buy in Colombo.
12. Therefore it's no trouble.
13. Fine. I'll send the money to buy the goods (with) tonight.

14. This time, you come to our house for Vesak.
15. I intend to make a lot of decorations.
16. You want a lot of money for decorations, don't you?
17. No. I don't need that much money.
18. I have thirty rupees to spend.
19. That's good. I'll bring the children.
20. Are the children home now?
21. Yes. Now it is the summer vacation in the school.
22. Good. Bring the children. Bring (your) wife also.
23. Fine. Thanks.

H. Conversations:

1. A and B discuss plans to see the Kandy Perahera. A wants to take his children, since they haven't seen it before. B has an uncle who lives in Kandy who can put them up. However, he might not have room for both of them and their families.
2. A is a teacher from America who wants to see some schools in Ceylon. He discusses it with B. They talk about means of travel, places to stay, food, and some of the sights that A can see while in Ceylon.

LESSON 22

Conversation: In a Restaurant

John Wood goes to a Sinhalese restaurant for a meal.

JOHN

වැඩිය	too much, a lot
මම මේ කෑම ජාති ගැන වැඩිය දන්නෙ නෑ.	I don't know much about these kinds of food.
මොනවා ද අද හොඳ?	What's good today?

WAITER

කෑම එකක්	a meal
හදලා දෙනවා	prepare (for someone else)
මහත්තයා මීට ඉස්සර සිංහල කෑම කාලා නැත්තං ඉංගිරිසි කෑම එකක් හදලා දෙන්න පුලුවනි.	If you haven't eaten Sinhalese food before this, I can make you an English meal.

JOHN

නෑ. මම සිංහල කෑම කාලා තියෙනවා.	No. I have eaten Sinhalese food.
කට දන්න කාලා පුරුදුයි.	I'm used to eating hot food.
නමුත් මේ නම්වලින් කෑමවල විදිය දැනගන්න අමාරුයි.	But it is difficult to learn the nature of the foods from these names.

WAITER

මස්	meat
කරිය	the curry
ෆ්‍රයිඩ් රයිස්	fried rice
එකක්	one portion
මහත්තයා හොඳ මස් කරියකුයි ෆ්‍රයිඩ් රයිස් එකකුයි ගන්න.	Take a good meat curry and a portion of fried rice.

JOHN

ෆ්‍රයිඩ් රයිස් කියන්නෙ මොනවා ද?	What is 'fried rice'?

WAITER

ඒක බොහොම රසයි.	It's very tasty.
කලවම් කරනවා	mix
දුන්තෙල්	'duntel,' clarified butter made from buffalo milk
බදිනවා	fry
බත්	cooked rice
එලෝලුයි මසුයි බත් එක්ක කලවම් කරලා දුන්තෙලෙන් බැදලා.	Vegetables and meat are mixed with rice, and fried in 'duntel.'
ඉස්සා	the shrimp
මස් එපා නම් ඉස්සො දාලා හදන්න පුලුවනි.	If you don't want meat, I can make it with shrimp.

JOHN

සිංහලෙන්	in Sinhalese
ඒකට සිංහලෙන් කියන්නෙ මොකක් ද?	What do you call it in Sinhalese?

WAITER

සිංහලෙන් නමක් නෑ, මහත්තයා.	There is no name in Sinhalese, sir.
කියලා	quotation marker
කාටත්	everybody (dative case)
නමුත් ෆ්‍රයිඩ් රයිස් කියලා කිව්වාම කාටත් තේරෙනවා.	But when you say 'fried rice', everybody understands (it).

JOHN

තෙල	the oil
බර	heavy
වැඩි	too much
තෙලෙන් බැදපු කෑම බර වැඩියි, නේ ද?	Food fried in fat is too heavy, isn't it?

WAITER

එහෙම නම්	if that is so
නිකං	plain, simple
එහෙම නම් මහත්තයා මස් කරියකුයි එලෝලු කරියකුයි නිකං බත් එකකුයි ගන්න.	If so, you get a meat curry, a vegetable curry, and a portion of plain (boiled) rice.

JOHN

නිකං බත් කියන්නෙ මොනවා ද?	What is 'plain rice'?

WAITER

තම්බනවා	boil (solids)
මොකුත් දාන්නෙ නැතුව තම්බාපු බත්.	Rice cooked with nothing added.

JOHN

මොනවා ද හොඳ මස්?	What meat is good?

WAITER

ඌරා	the pig
ඌරු මස්	pork
මහත්තයා ඌරු මස් කනවා ද?	Do you eat pork?

JOHN

හරකා	the cow
හරක් මස්	beef
කුකුලා	the fowl
කුකුල් මස්	chicken (meat)
හරි	or
එපා. හරක් මස් හරි කුකුල් මස් හරි නැද්ද?	I don't want (it). Don't you have beef or chicken?

WAITER

තියෙනවා. මහත්තයාට කුකුල් මස් කරියක් හදලා දෙන්නම්.	We have. I'll make you a chicken curry.
මීරිස්	red pepper
අඩු කරනවා	reduce
මීරිස් අඩු කරලා හදන්න ද?	Shall I make it with less red pepper?

JOHN

ඔව්. මීරිස් වැඩිය දාන්නෙ නැතුව හදන්න.	Yes. Make it without putting in too much red pepper.

WAITER

එලෝලුව	the vegetable curry
හොඳයි, මහත්තයා. හදලා දෙන්නම්.	Yes, sir. I'll make it for you.
එලෝලුවකුත් ගේන්න ද?	Shall I bring a vegetable curry also?

	JOHN
ඔව්. හොඳ එලෝලුවකුත් ගේන්න.	Yes. Bring a good vegetable curry, too.
තක්කාලි ගෙඩිය	the tomato
සම්බෝලෙ	the salad
තක්කාලි සම්බෝලෙකුත් හදලා දෙන්න පුලුවන් ද?	Can you make me a tomato salad, also?
	WAITER
බීම	the drink, drinking
පුලුවනි, මහත්තයා. මහත්තයාට බීමට මොකුත් ගේන්න ද?	Yes, sir. Shall I bring you something to drink?
	JOHN
මෙහේ බීර දෙනවා ද?	Do you serve beer here?
	WAITER
පිට	outside
පිටින්	from outside
බීර මෙහේ නෑ. පිටින් ගෙනැත් දෙන්න පුලුවනි.	We don't have beer here. I can bring it from outside.
	JOHN
නුවරඑලිය	Nuwara Eliya
පයින්ට් එක	the pint
හොඳයි. නුවරඑලිය පයින්ට් එකක් ගේන්න.	Fine. Bring a pint of Nuwara Eliya beer.
	WAITER
හොඳයි, මහත්තයා.	Yes, sir.

Grammar

1. NEW NOUNS

Class 1

පයින්ට් එක	'the pint'

Class 2

කෑම	'the food'; gen. කෑමෙ (no plural)
කරිය	'the curry'; gen. කරියෙ ; pl. කරි
තක්කාලි ගෙඩිය	'the tomato'; gen. තක්කාලි ගෙඩියෙ ; pl. තක්කාලි
තෙල	'the oil'; gen. තෙලේ ; pl. තෙල්
එලෝලුව	'the vegetable curry'; gen. එලෝලුවෙ ; pl. එලෝලු
බීම	'the drink'; gen. බීමෙ ; pl. බීම්
නුවර එලිය	'Nuwara Eliya'; gen. නුවර එලියෙ (no plural)

Class 3

පිට	'outside' (no plural)

Class 4

සම්බෝලෙ	'the salad'; pl. සම්බෝල

Class 5

ඉස්සා	'the shrimp'; pl. ඉස්සො
ඌරා	'the pig'; pl. ඌරො
හරකා	'the cow'; pl. හරක් (oblique හරකුන්)
කුකුලා	'the fowl'; pl. කුකුල්ලු

Other Nouns

Note that the names for kinds of meat above are compounds formed with the stem form of the animal name followed by මස් 'meat.'

දුන්තෙල්	'duntel' (plural only)
බත්	'cooked rice' (plural only)
f ප්‍රයිඩ් රයිස්	'fried rice' (plural only)
මිරිස්	'red pepper' (plural only)
මස්	'meat' (plural only)
ඌරු මස්	'pork' (plural only)
හරක් මස්	'beef' (plural only)
කුකුල් මස්	'chicken' (plural only)

2. NEW VERBS

Class 1

කලවම් කරනවා	'mix'
තම්බනවා	'boil' (solids)
අඩු කරනවා	'reduce'

Class 2

බදිනවා	'fry'

Irregular

දානවා	'put'; past දැම්මා

3. PAST PARTICIPLES

3.1 Complex Verbs

The past participle may occur immediately preceding another verb to form a COMPLEX VERB. Complex verbs commonly take on special meanings, and one formed with a past participle plus a form of දෙනවා 'give' frequently has the meaning 'perform the action of the past participle for someone else'. Thus හදලා දෙනවා 'make something for someone else'. The person for whom the action is performed, if expressed, is in the dative. The whole complex verb acts as a single verb, with දෙනවා in whatever form the sentence requires.

මම කරියක් හදලා දෙන්නම්.	I'll make (you) a curry.
ඔහේ මහත්තයාට වැටක් බැඳලා දුන්නා ද?	Did you build the fence for the master?
මට ඔහේට හොඳ මස් කරියක් හදලා දෙන්න පුලුවනි.	I can make you a good meat curry.

3.2 Manner of an Action

Sometimes the past participle of a verb occurring in a sentence or clause with a main verb may indicate the manner in which the action of the main verb is performed.

මස් එපා නම් ඉස්සො දාලා හදන්න පුලුවනි.	If you don't want meat, I can make it with (literally:

	'having put) shrimp.
මිරිස් අඩු කරලා හදන්න ද?	Should I make it reducing the pepper?

The main verb and the past participle may each have its own objects and modifiers, but the subject of both must be the same.

ඉස්සො දාලා කරියක් හදන්න.	Make a curry with (having put) shrimp.

3.3 The past participle of a verb may occur dependent upon පුරුදු 'accustomed to, used to'. As with පුරුදු with a dependent noun, the subject is in the dative case:

මට කට දන්න කාලා පුරුදුයි.	I am used to eating hot food (literally: 'eating to burn the mouth').
මහත්තයාට බස් එකෙන් ගිහිල්ලා පුරුදු ද?	Are you used to going by the bus?

4. PARTICIPIAL SENTENCES

4.1 A past participle without another verb may form the predicate of a sentence. The implication is generally that the action has been completed, so that the usual English equivalent is the perfect (i.e., 'has gone'):

මහත්තයා ගිහිල්ලා.	The master has (or 'is'.) gone.
එලෝලුයි මසුයි බත් එක්ක කලවම් කරලා දුන්තෙලෙන් බැදලා.	Vegetables and meat mixed together with rice have been fried in duntel.

In this usage, the subject of the participial sentence will be in the third person. Where this completive sense is required with the first person, the simple past is used:

මම ඒ වැඩ කෙරුවා.	I did that work.

4.2 With a කොට 'when' clause expressed or implied, a past participial sentence implies an action completed prior to that of the කොට clause, and thus equates with an English pluperfect (i.e., 'had gone'). In this usage, the subject may be any person, first, second, or third:

ඔහේ එනකොට මම කොළඹ ගිහිල්ලා.	When you came, I had gone to Colombo.

4.3 Participial vs. Perfect Sentences

4.31 The Sinhalese present perfect (21,5) may have a completive sense like that of the past participle given in 4.1 implying that the action has been completed in the recent past:

මහත්තයා ගිහිල්ලා තියෙනවා.	The master has gone.
බංඩා පොල් ටිකක් කඩලා තියෙනවා.	Banda has picked some coconuts.

In this sense, the subject will be third person, as with the participle alone.

4.32 The present perfect may indicate that one has had the experience of doing something at some time in the past. In this usage, the subject may be first, second, or third person:

මම කොළඹ ගිහිල්ලා තියෙනවා.	I have gone to Colombo (I've been there).
බංඩා පොල් කඩලා තියෙනවා.	Banda has picked coconuts (he has had the experience).

Sentences with the particple alone are not used in this sense.

5. THE PAST PARTICIPIAL ADJECTIVE

5.1 The regular past participial adjective is formed as follows:

For the first two classes of verbs the -ලා of the past participle is replaced by -පු . Note that there are alternative forms corresponding to those of the past participle:

	Present Simple	Past Participle	Past Participial Adjective
Class 1:			
boil (solids)	තම්බනවා	තම්බලා, තම්බාලා	තම්බපු, තම්බාපු
look, see	බලනවා	බලලා, බලාලා	බලපු, බලාපු
Class 2:			
fry	බදිනවා	බැදලා	බැදපු
fetch, draw	අදිනවා	ඇදලා	ඇදපු

For verbs of Class 3, -ලා is replaced by -ච්ච . For Class 3 verbs there are no alternative forms of the past participial adjective, even if there are for the past participle. Only the form with (short) -i- occurs in the adjective:

	Present Simple	Past Participle	Past Participial Adjective
fall	වැටෙනවා	වැටිලා, වැටීලා	වැටිච්ච
understand	තේරෙනවා	තේරිලා	තේරිච්ච

The verbs with irregular past participial adjectives that have occurred so far are:

	Present Simple	Past Participle	Past Participial Adjective
come	එනවා	ඇවිල්ලා, ඇවිත්	ආපු
take away	ගෙනියනවා	ගෙනිහිල්ලා, ගෙනිහින්	ගෙනියපු
take	ගන්නවා	අරගන, අරන්	අරගත්ත
bring	ගේනවා	ගෙනැල්ලා	ගෙනාපු
burn	දනවා	දාලා	දාච්ච
drink	බොනවා	බීලා	බීපු
go	යනවා	ගිහිල්ලා	ගියපු
be (inan.)	තියෙනවා	තිලා	තිච්ච
give	දෙනවා	දීලා	දීපු
become	වෙනවා	වෙලා	වෙච්ච
move in	ගෙවදිනවා	ගෙවදිලා	ගෙවදිච්ච
put, place	දානවා	දාලා	දාපු
eat	කනවා	කාලා	කාපු
be seen	පේනවා	පෙනිලා	පෙනිච්ච

5.2 The past participial adjective modifies following nouns. The meaning may be either that whatever is expressed by the noun has performed the action or that the action has been performed upon it, depending upon context. The most common English equivalent is a relative clause, usually with a verb in the perfect, modifying a noun. In the following pairs, the first sentence of each is a sentence formed with a past participle and the second contains a noun modified by a past participial adjective:

බංඩා පොල් කඩලා.	Banda has picked coconuts.
බංඩා කඩපු පොල් අදින්න.	Fetch the coconuts that Banda has picked.
මේ කැම තෙලෙන් බැදලා.	This food has been fried in oil.
තෙලෙන් බැදපු බත් බර වැඩියි, නේ ද?	Food fried in oil is too heavy, isn't it?
පොල් වැටිලා.	The coconuts have fallen.
වැටිච්ච පොල් මෙතෙන්ට දාන්න.	Put the fallen coconuts (or 'the coconuts that have fallen') here.

6. කියලා

කියලා the past participle of කියනවා 'tell, call', has some special uses not shared by other past participles. One use is in repeating what someone else has said. Here it is used along with කියනවා and follows the repeated statement:

නෝනා මට සල්ලි දුන්නා කියලා කිව්වා.	The lady said (she) gave me the money.

Another use of කියලා is in indicating the name of something. Here again it is used with the verb කියනවා and the name of the thing in question precedes .

ඒකට කියන්නෙ සීගිරි ගල කියලා.	That is called 'Sigiriya Rock'.
හුගක් දෙනා මේ බත්වලට කියන්නෙ ෆ්‍රයිඩ් රයිස් කියලා.	Many people call that 'fried rice.'

In these sentences it is permissible to leave out කියලා although it is more customary to use it:

නෝනා මට සල්ලි දුන්නා කිව්වා.
ඒකට කියන්නෙ සීගිරි ගල.
හුඟක් දෙනා මේ බත්වලට කියන්නෙ fප්‍රයිඩ් රයිස්.

7. වැඩි and මදි

වැඩි 'too much', and මදි 'not enough' (10,8) are used in a number of ways, with English equivalents depending on their use. Both may occur with or without the assertion marker when final in simple sentences.

7.1 In constructions with තියෙනවා or ඉන්නවා either meaning 'there is, there are' or 'have', වැඩි and මදි may replace තියෙනවා, ඉන්නවා meaning 'there are too many, I have too many' or 'there aren't enough, I haven't enough', respectively:

මෙහේ එළෝලු වැඩියි.	There are too many vegetables here.
මෙහේ එළෝලු මදියි.	There aren't enough vegetables here.
මට සල්ලි වැඩියි.	I have too much money.
මට සල්ලි මදියි.	I haven't enough money.

7.2 These forms may be used with other verbs in the meaning 'too much', 'not enough':

මහත්තයා වැඩ කරනවා මදියි.	The master doesn't work enough.
මහත්තයා වැඩ කරනවා වැඩියි.	The master works too much.

7.3 Following adjectives, they mean 'too . . .' or 'not . . . enough':

මේ ගේ ලොකු මදියි.	This house isn't big enough.
මේ ගේ ලොකු වැඩියි.	This house is too big.
ලොකු වැඩි ගෙවල් හොඳ නෑ.	Too large houses aren't good.
ලොකු මදි ගෙවල් කඩන්න.	Demolish the houses that are not big enough.

7.4 Used as adjectives preceding nouns, the mean 'the extra or excess amount', 'the number, amount that is lacking':

වැඩි පොල් අතෙන්ට දාන්න.	Put the extra coconuts there.
මදි පොල් ගේන්න යන්න.	Go get the (number of) coconuts that are lacking.

8. වැඩියෙ

වැඩියෙ , in addition to having the meaning 'more than' (19,8), has the meaning 'much' when used in negative sentences:

මම සිංහල කෑම වැඩියෙ කන්නෙ නෑ.	I don't eat much Sinhalese food.
මම මේ කෑම ජාති ගැන වැඩියෙ දන්නෙ නෑ.	I don't know much about these kinds of food.
මහත්තයා වැඩියෙ ගෙදර නෑ.	The master isn't at home much.

9. ගැන

ගැන 'about, concerning' takes a dependent noun in the direct case:

වඩුවැඩ ගැන මොකුත් දන්නෙ නෑ.	I don't know anything about carpentry.
ළමයා ගැන මොකද කරන්නෙ?	What are you going to do about the boy?

10. 'IN SINHALESE'

'In a language' is expressed with the instrumental case of the language name:

සිංහලෙන් නමක් නෑ, මහත්තයා.	There isn't a name (for that) in Sinhalese, sir.
ඒකට සිංහලෙන් කියන්නෙ මොකක් ද?	What is that called in Sinhalese?
මේකට සිංහලෙන් කියන්නෙ මොකක් ද?	What is this called in Sinhalese?

Note that in the sentences above the word for 'this, that' is in the dative case.

11. 'WHAT DOES IT MEAN?'

The common Sinhalese expression for 'what does it mean' is කියන්නෙ මොකක් ද? or කියන්නෙ මොනවා ද , preceded by the (Sinhalese) word or phrase for which the meaning is being asked. මොනවා ද may always be used in such a construction, but මොකක් ද only in the singular:

ෆ්‍රයිඩ් රයිස් කියන්නෙ මොනවා ද?	What does 'fraid rais' mean?
පොල් ගෙඩිය කියන්නෙ මොකක් ද?	What does 'pol geDiyə' mean?

12. ...හරි...හරි

. . . හරි. . . .හරි is a conjunction with the English equivalent 'either . . . or'. හරි follows each of the two or more items listed:

එලෝලු හරි මස් හරි ගේන්න.	Bring (me) either vegetables or meat.
එලෝලු කරියක් හරි මස් කරියක් හරි ඉස්සො දාලා කරියක් හරි හදලා දෙන්න පුලුවනි.	(I) can make either a vegetable curry, a meat curry, or a curry with shrimp.

. . .හරි . . .හරි does not occur in negative statements, but may occur in negative questions:

කුකුල් මස් හරි හරක් මස් හරි නැද්ද?	Don't you have chicken or beef?

13. A PORTION

With names of foods, as with drinks (16, 11), quantity expressions occur implying portions or servings of the food. These follow the normal quantity phrase construction, that is, the noun is plural and the forms දෙක , තුන , etc., are used:

එලෝලු දෙක	the two (servings of) vegetables
බත් දෙකක්	two (servings of) rice
කරි තුන	the three portions of curry

Parallel to these constructions the form එක may be used with the plural form of the name of a food, implying a single portion or serving:

එලෝලු එක	the serving of vegetables
බත් එකක්	a portion of rice
කෑම එකක්	a meal
කරි එක	the portion of curry

14. THE PLURALS OF THE මේක SET

The plurals of මේක 'this one', අරක , ඕක , ඒක 'that one', are මේවා 'these', අරවා , ඕවා , ඒවා 'those'. The case forms are:

Direct:	මේවා	අරවා	ඕවා	ඒවා
Dative:	මේවාට	අරවාට	ඕවාට	ඒවාට
Genitive:	මේවායෙ	අරවායෙ	ඕවායෙ	ඒවායෙ
Instrumental:	මේවායින්	අරවායින්	ඕවායින්	ඒවායින්

15. කාටත්

The dative form of කවුරුත් 'everybody, everyone' is කාටත් . Hence:

කවුරුත් යනවා.	Everyone is going.
කාටත් තේරෙනවා.	Everyone understands.

16. ගෙනැත්

ගේනවා 'bring' has the alternative past participle forms ගෙනැල්ලා and ගෙනැත් . Hence either:

පිටින් ගෙනැත් දෙන්න පුලුවනි. or
පිටින් ගෙනැල්ලා දෙන්න පුලුවනි.

17. නැත්තං

When නම් 'if' is added to නෑ , the result is නැත්තං :

මේ කෑම කට දන්නෙ නෑ.	This food isn't hot.
මේ කෑම කට දන්නෙ නැත්තං, තව ටිකක් කන්න.	If this food isn't hot, eat a bit more.
මහත්තයා සිංහල කෑම කාලා නෑ.	You haven't eaten Sinhalese food.
මහත්තයා සිංහල කෑම කාලා නැත්තං, අද වත් කන්න.	If you haven't eaten Sinhalese food, eat it today at least.

Exercises

A. Substitute orally:

1. මම .... වැඩියෙ දන්නෙ නෑ.

about buses
about Colombo trains
about the work of the estate
about Sinhalese curries
about Indian people
about pork
about hot food
about English food
about the names of the Sinhalese people
about food fried in duntel

2. මහත්තයාට මොකුත් .... පුලුවනි.

bring (for you)
prepare (for you)
fry (for you)
cut (for you)
pick (for you)
mix (for you)
boil (for you)
make (for you)

3. මට .... පුරුදුයි.

going to Colombo
eating Sinhalese curries
eating hot food
traveling by bus
picking coconuts
eating fried rice
drinking beer
English food
these kinds of food
vegetable curries

4. .... හොඳ නෑ.

fried food
boiled vegetables
fallen coconuts
the firewood that has been fetched
the book I have read
the curries that have been mixed
the beer you have drunk
the pork you have eaten

5. ඒකට .... මොකක් ද?

call in Sinhalese
call in English
call in your language
call in our language
called by you
called by everybody

6. මට .... ගෙනැත් දෙන්න.

beef or pork
a book or a newspaper
a cigar or a cigarette
this vegetable or some other vegetable
a cup of tea or a glass of beer
a cow or a pig
a pint of beer or a pack of cigars
cooked rice or fried vegetables

B. Transform according to the model, changing the first of the two sentences into into an 'if' clause:

මහත්තයා ගිහිල්ලා නෑ. මට යන්න පුළුවනි... මහත්තයා ගිහිල්ලා නැත්තං මට යන්න පුළුවනි.

1. එයා ඒවා කාලා නෑ. වෙන මොකුත් දෙන්න.
2. කට දන කෑම කන්න බෑ. ඉංගිරිසි කෑම ටිකක් කමු.
3. මේ නම් දැනගන්න අමාරුයි. පොතේ බලන්න.
4. ඔහේ f ප්‍රයිඩ් රයිස් කියන්නෙ මොනවා ද දන්නෙ නෑ. ළමයාගෙන් අහන්න.
5. මහත්තයා නැටුම් බලන්න කැමති ද? හවස අපේ ගෙදරට එන්න.
6. නෝනාට ඌරු මස් එපා ද? කුකුල් මස් එකක් හදලා දෙන්න පුළුවනි.
7. උන්නැහේ සිංහල කෑම කාලා තියෙනවා. අපට කෑම දෙන්න පුළුවනි.

C. Transform according to the model, changing the verbal adjectives to past participial verbal adjectives.

ළමයා බදින බත් රස නෑ... ළමයා බැදපු බත් රස නෑ.

1. මම කියවන පොත ඔහේ ළඟ තියෙනවා ද?
2. මේ වැට කඩන ළමයාට එන්න කියන්න.
3. දූව කඩන එලෝලු මට එපා.
4. මම හදන ගේ අර බලන්න.
5. මම කන ජාතියෙ මස් හොඳයි.

D. Say in Sinhalese:

1. Do you like to eat fried rice?
2. Yes. I like it. But I don't like eating shrimp.
3. I can make it for you with chicken.
4. Is it good when fried with chicken?
5. Yes, sir. Many people like eating rice fried with chicken.
6. I haven't eaten it before this.
7. Fine. Give me a portion of that.
8. Do you want anything else, sir?
9. Yes. Can you make me a tomato salad?
10. Yes, sir. Do you want any vegetables?
11. No, I don't. A fried rice and a tomato salad are enough.

12. Have you eaten English food?
13. Yes. But English food isn't as tasty as Sinhalese food.
14. English food isn't hot: but some people can cook English food very well.
15. If food isn't hot, I don't like to eat (it).
16. Sinhalese people eat a lot of red pepper, don't they?
17. Yes. They like hot food very much.
18. Can I make you a meat curry with red pepper?
19. No. Don't bother. I can eat this food.
20. Yes. Eat food that isn't spicy now.
21. You can eat hot food when you get home in the evening.

LESSON 23

Conversation: Visiting Anuradhapura

John Wood visits Anuradhapura with his friend and guide, Gunasena.

JOHN

අග	chief
නුවර	the city
අග නුවර	the capital
වෙලා තිඋනා	had become
අනුරාදපුරේ ලංකාවෙ අග නුවර වෙලා තිඋනෙ කොයි කාලෙ ද?	When was Anuradhapura the capital of Ceylon?

GUNASENA

ලංකාවෙ පලවෙනි අග නුවර අනුරාදපුරේ.	Ceylon's first capital was Anuradhapura.
සතවර්සෙ	the century
සිංහල මිනිස්සු ලංකාවට ආපු කාලෙ ඉඳලා දහවෙනි සතවර්සෙ විතර වෙනකං අග නුවර තිඋනෙ අනුරාදපුරේ.	From the time the Sinhalese came to Ceylon, until about the Tenth Century, the capital was in Anuradhapura.

JOHN

සිංහලයා	the Sinhalese (man)
ක්‍රිස්තු වර්සෙ	the Christian Era
සිංහලයො ආවෙ ක්‍රිස්තු වර්සෙන් ඉස්සර, නේ ද?	The Sinhalese came before the Christian Era, didn't they?

GUNASENA

ඔව්. ක්‍රිස්තු වර්සෙන් ඉස්සර පන්සිය හතලිස් හතරෙදි.	Yes, in 544 B.C.

JOHN

වැව	the tank, reservoir
ඒවා	things
මේ වැව් සේරම ඒ කාලෙ කරපු ඒවා ද?	Are all these tanks ones built at that time?

GUNASENA

වැඩි හරිය	the majority
පුරාන	ancient
ඔව්. වැව්වලින් වැඩි හරිය බොහොම පුරාන කාලෙ කරපු ඒවා.	Yes. The majority of these tanks were built in very ancient times.
අනුරාදපුර කාලෙ	the Anuradhapura Period
ඉතාම	most
තමයි	indeed
අනුරාදපුර කාලෙ තමයි ලංකාවෙ ඉතාම දියුනු කාලෙ.	The Anuradhapura Period was the most developed period in Ceylon.
අර පේන	that over there
දාගැබ	stupa
අර පේන දාගැබ බලන්න.	Look at that stupa over there.
රුවන්වැලි සෑය	Ruwanweliseya
ඒක තමයි රුවන්වැලි සෑය.	That is the Ruwanweliseya.
රජ්ජුරුවො	the king
දුටුගැමුනු	Dutugemunu
ඒක හැදුවෙ දුටුගැමුනු රජ්ජුරුවො.	It was built by King Dutugemunu.

JOHN

ඒ කොයි කාලෙ ද?	When was that?

GUNASENA

ක්‍රිස්තු වර්ෂෙන් ඉස්සර දෙවෙනි සතවර්ෂෙ.	In the Second Century, B.C.

JOHN

සිරිමහ බෝදිය	the sacred Bodhi tree
සිරිමහ බෝදිය තියෙන්නෙ කොතෙන්ද?	Where is the sacred Bodhi tree?

GUNASENA

හැරෙනවා	turn
දකුනට	to the right
අර හන්දියෙන් දකුනට හැරිලා ටිකක් දුර යන්න ඕන.	You must turn right from that corner and go a little distance.
ඉස්සෙල්ලා	first, before everything else
අපි ඉස්සෙල්ලා මේ දාගැබ බලමු.	First, let's look at this dagoba.
ඇතුල් වෙනවා	enter
සපත්තුව	the shoe
ගලවනවා	remove, undo
එතෙන්ට ඇතුල්වෙන කොට සපත්තු ගලවන්න ඕන.	When entering that place, you must remove your shoes.

JOHN

හොඳයි.	All right.
විහාරෙ	the temple
අර පේන විහාරෙත් පුරාන එකක් ද?	Is that temple over there an ancient one, too?

GUNASENA

නෑ. ඒක අලුත් විහාරයක්.	No. It's a new temple.
හාමුදුරුවො	the monk
සිද්දස්ථානෙ	the holy place
පදිංචි වෙනවා	settle down
හදා ගන්නවා	build, make (for oneself)
හාමුදුරුවරු පුරාන සිද්දස්ථානවල පන්සල් හදාගන පදිංචිවෙලා ඉන්නවා.	Monks have built temples in ancient holy places and settled down there.

JOHN

අයිති	belong to
ඒ සිද්දස්ථාන අයිති හාමුදුරුවරුන්ට ද?	Do those holy places belong to the monks?

GUNASENA

සමහරක් හාමුදුරුවරුන්ට අයිතියි.	Some belong to the monks.
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව	the Department of Archaeology
බාරෙ	in the custody of
නමුත් වැඩි හරිය තියෙන්නෙ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව බාරෙ.	But the majority are in the c care of the Department of Archaeology.

JOHN

සෙල්ලිපිය	the inscription
අර සෙල්ලිපිය සිංහල සෙල්ලිපියක් ද?	Is that inscription a Sinhalese inscription?

GUNASENA

ඔව්. ඒක සිංහල.	Yes. It is Sinhalese.
කෝ බලන්න.	let's see

කෝ බලන්න.	Let's see.
මේක දෙවෙනි සතවර්සෙට අයිති සෙල්ලිපියක්.	This is an inscription belonging to the Second Century.
ඒ කාලෙ සිංහල අකුරු දැන් සිංහල අකුරුවලට වැඩියෙ හුඟක් වෙනස්.	The Sinhalese script of that time was much different from the modern Sinhalese script.
ක යන්න	the letter ක
බලන්න මේ කයන්න ලියලා තියෙන හැටි.	See how this ක is written.

Additional Vocabulary

Numerals

	Numeral	Stem
20	විස්ස	විසි-
30	තිහ	තිස්-
40	හතලිහ	හතලිස්-
50	පනහ	පනස්-
60	හැට	හැට-
70	හැත්තෑව	හැත්තෑ-
80	අසූව	අසූ-
90	අනූව	අනූ-
100	සිය	සිය-
1000	දාහ	දාස්-

Directions

දකුන	'right'
වම	'left'

Grammar

1. NEW NOUNS

Class 2

වැව	'the tank'; gen. වැවේ ; pl. වැව්

Note: Tanks are large reservoirs built in ancient times for irrigation purposes. Sometimes these are many acres in extent.

දකුන	'right'; gen. දකුනෙ ; no plural
වම	'left'; gen. වමේ ; no plural
දාගැබ	'the stupa'; gen. දාගැබේ ; pl. දාගැබ්, දාගැප්
රුවන්වැලි සෑය	'the Ruwanweliseya'; gen. රුවන්වැලි සෑයෙ
සිරිමහ බෝදිය	'the sacred Bodhi tree'; gen. සිරිමහ බෝදියෙ
සපත්තුව	'the shoe'; gen. සපත්තුවෙ ; pl. සපත්තු
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව	'the Department of Archaeology'; gen. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙ
සෙල්ලිපිය	'the inscription'; gen. සෙල්ලිපියෙ ; pl. සෙල්ලිපි
ක යන්න	'the letter ක '; gen. ක යන්නෙ ; pl. ක යනු (See Grammar 15)

Class 3

නුවර	'the city'; pl. නුවරවල්

Note: නුවර may be used as a general term in reference to any city. It is also the name of one particular city, Kandy (Lesson 13), sometimes called මහනුවර.

Class 4

සතවර්සෙ	'the century'; pl. සතවර්ස
ක්‍රිස්තු වර්සෙ	'the Christian Era'
විහාරෙ	'the temple'; pl. විහාර
සිද්දස්තානෙ	'the holy place'; pl. සිද්දස්තාන

Class 5

සිංහලයා	'the Sinhalese man'; pl. සිංහලයො
හාමුදුරුවො	'the monk'; pl. හාමුදුරුවරු ; indef. හාමුදුරු නමක් (See 3 in the Grammar)
රජ්ජුරුවො	'the king'; pl. රජවරු ; indef. රජ්ජුරු කෙනෙක්

2. NEW VERBS

Class 1

ගලවනවා	'remove, take off'

Class 3

හැරෙනවා	'turn'

Irregular

ඇතුල් වෙනවා	'enter'
පදිංචි වෙනවා	'settle down'

3. RESPECTFUL NOUNS

Some nouns referring to people of highly respected status, such as හාමුදුරුවො 'the monk', රජ්ජුරුවො 'the king', end in -o in the singular and have a plural in -වරු . They take plural case inflection in both singular and plural (i.e., have an oblique stem in -න් in both):

	Singular	Plural
Direct	හාමුදුරුවො	හාමුදුරුවරු
Dative	හාමුදුරුවන්ට	හාමුදුරුවරුන්ට
Genitive	හාමුදුරුවන්ගෙ	හාමුදුරුවරුන්ගෙ
Instrumental	හාමුදුරුවන්ගෙන්	හාමුදුරුවරුන්ගෙන්

රජ්ජුරුවො has the respectful indefinite රජ්ජුරු කෙනෙක් and හාමුදුරුවො has a special respectful indefinite හාමුදුරු නමක් , implying even greater respect. Note that the final - වො of both nouns is lost in the indefinite.

4. THE PLUPERFECT

4.1 The pluperfect is formed with the past participle and the past tense of තියෙනවා . The most common English equivalent is the pluperfect ("had" plus past participle). The pluperfect usually signifies that something took place prior to some other stated action in the past:

ඔහේ එන කොට මම ගිහිල්ලා තිඋනා.	When you came, I had gone.
මහත්තයා ගෙදර එන කොට බංඩා වත්ත සුද්දකරලා තිඋනා.	When the master came home, Banda had cleaned the estate.

4.2 The pluperfect of වෙනවා namely වෙලා තිඋනා is literally 'had become', but it may equate with English 'was' in equational sentences which imply that some state of affairs had come into being and continued to exist up to the time involved.

ඒ කාලෙ ලංකාවෙ අග නුවර වෙලා තිඋනෙ අනුරාදපුරේ.	In that period, Anuradhapura was the capital of Ceylon.
අනුරාදපුරේ ලංකාවෙ අග නුවර වෙලා තිඋනෙ කොයි කාලෙ ද?	At what period was Anuradhapura the capital of Ceylon?

5. NUMERALS

5.1 Numerals 20-99

5.11 The numerals 'twenty', 'thirty', 'forty', etc., up to 'ninety' have the forms of Class 2 nouns:

	Numeral	Genitive	Stem
20	විස්ස	විස්සෙ	විසි-
30	තිහ	තිහේ	තිස්-
40	හතලිහ	හතලිහේ	හතලිස්-
50	පනහ	පනහෙ	පනස්-
60	හැට	හැටේ	හැට-
70	හැත්තෑව	හැත්තෑවෙ	හැත්තෑ-
80	අසූව	අසූවෙ	අසූ-
90	අනූව	අනූවෙ	අනූ-

5.12 Numerals between the "tens", i.e., 'twenty-one', 'twenty-two', 'twenty-three', etc., are formed by adding the numerals 'one', 'two', 'three', etc., to the stem forms of the numerals in 5.11. Thus the numerals 20-29 are:

20	විස්ස
21	විසි එක
22	විසි දෙක
23	විසි තුන
24	විසි හතර
25	විසි පහ
26	විසි හය
27	විසි හත
28	විසි අට
29	විසි නමේ

Similarly:

32	තිස් දෙක	75	හැත්තෑ පහ
46	හතලිස් හය	83	අසූ තුන
58	පනස් අට	94	අනූ හතර
61	හැට එක		

5.2 Counting Hundreds and Thousands

5.21 The Sinhalese words for 'hundred' and 'thousand' have the forms of Class 2 nouns:

	Numeral	Genitive	Stem
100	සිය	සියෙ	සිය-
1000	දාහ	දාහෙ	දාස්-

Numerals for hundreds and thousands up to 90,000 are formed by adding සිය and දාහ to the numeral stem. Note that the stems for 'four' and 'five' have special forms when they precede and

100	සිය, එක සිය	2000	දෙ දාහ
200	දෙ සිය	3000	තුන් දාහ
300	තුන් සිය	4000	හාර දාහ
400	හාර සිය	5000	පන් දාහ
500	පන් සිය	6000	හය දාහ
600	හය සිය	7000	හත් දාහ
700	හත් සිය	8000	අට දාහ
800	අට සිය	9000	නම දාහ
900	නම සිය	10,000	දහ දාහ
1000	දාහ, එක් දාහ	20,000	විසි දාහ
		etc.	

3.22 As with other numerals, the stem forms of සිය and දාහ, i.e., සිය and දාස් , are used when another numeral follows. Although one may say either එක සිය or just සිය for 'one hundred' and එක් දාහ or just දාහ for 'one thousand', the 'one' must be expressed, either by එක or the stem form එක්, when another numeral follows:

105	එක සිය පහ
303	තුන් සිය තුන
508	පන් සිය අට
182	එක සිය අසූ දෙක
343	තුන් සිය හතලිස් තුන
1005	එක් දාස් පහ or එක දාස් පහ
1962	එක් දාස් නමසිය හැට දෙක or එක දාස් නමසිය හැට දෙක
2835	දෙ දාස් අට සිය තිස් පහ
99,999	අනූ නම දාස් නමසිය අනූ නමේ

Note that Sinhalese never says the equivalent of "nineteen hundred and sixty-one", but always 'one thousand,nine hundred (and) sixty-one.'

5.3 Animate and Ordinal Numerals

For all the numerals in the preceding sections, the animate and ordinal forms are made, as usual, by adding දෙනා and වෙනි respectively to the stem form of the numeral. Note that although 'first' is පලවෙනි , the numeral 'one' elsewhere has the stem form එක්.

Animate		Ordinal	
තිස් දෙනා	thirty	තිස් වෙනි	thirtieth
පනස් දෙනා	fifty	පනස් වෙනි	fiftieth
හතලිස් එක් දෙනා	forty-one	හතලිස් එක් වෙනි	forty-first
හැත්තෑ පස් දෙනා	seventy-five	හැත්තෑ පස් වෙනි	seventy-fifth
දෙසිය හැට අට දෙනා	two hundred and sixty-eight	දෙසිය හැට අට වෙනි	two hundred and sixty-eighth
තුන් දාස් දොලොස් දෙනා	three thousand and twelve	තුන් දාස් දොලොස් වෙනි	three thousand and twelfth

6. B.C. AND A.D.

6.1 The Sinhalese term for 'the Christian Era' is ක්‍රිස්තු වර්ෂය , stem form ක්‍රිස්තු වර්ෂ . In stating the equivalent of 'A.D.', Sinhalese places either the stem or instrumental form before the numeral. Thus:

ක්‍රිස්තු වර්ස එක් දාස් නමසිය හැට දෙක	or	1962 A.D.
ක්‍රිස්තු වර්සෙන් එක් දාස් නමසිය හැට දෙක		1962 A.D.
ක්‍රිස්තු වර්ස තුන් සිය හතලිස් පහ	or	345 A.D.
ක්‍රිස්තු වර්සෙන් තුන් සිය හතලිස් පහ		345 A.D.

6.2 B.C. is expressed by ක්‍රිස්තු වර්සෙන් ඉස්සර preceding the numeral:

ක්‍රිස්තු වර්සෙන් ඉස්සර තුන් සිය හතලිස් තුන	343 B.C.
ක්‍රිස්තු වර්සෙන් ඉස්සර දෙදාහ	2000 B.C.

6.3 'In a year' is expressed by placing දී after the numeral in the genitive case:

පන්සිය හතලිස් හතරෙ දී	in 544

7. 'BEFORE'

ඉස්සර 'before' in time expressions may take a dependent noun in the dative case (14.9). The dependent noun may, alternatively, be in the instrumental case. Note that the word ක්‍රිස්තු වර්සෙ is always in the instrumental when used with ඉස්සර . Thus:

ගිය මාසෙට ඉස්සර	or	before last month
ගිය මාසෙන් ඉස්සර		before last month
ලබන සුමානෙට ඉස්සර	or	before next week
ලබන සුමානෙන් ඉස්සර		before next week
ක්‍රිස්තු වර්සෙන් ඉස්සර		before the Christian Era

8. අයිති 'BELONG TO'

අයිති 'belong to' occurs with the direct case of the thing possessed and the dative case of the possessor. In simple sentences අයිති takes the assertion marker:

අර ගේ මට අයිතියි.	That house belongs to me.
ඒ වත්ත පෙරේරා මහත්තයාට අයිතියි.	That estate belongs to Mr. Perera.

In emphatic sentences, or preceding nouns, the assertion marker, as usual, does not occur:

ඒ සිද්දස්තානෙ අයිති ඒ හාමුදුරුවන්ට ද?	Does that holy place belong to that monk?
මේක දෙවෙනි සතවර්සෙට අයිති සෙල්ලිපියක්.	This one is an inscription belonging to the Second Century.

9. 'ONE', 'ONES'

එක 'one' may be used as an inanimate indefinite pronoun similar to English "one" in phrases such as "an old one," "one from that period," etc.:

පුරාන එකක්	an ancient one
හොඳ එක	the good one
දූව කරපු එක	the one that the daughter did
බංඩා අදින එකක්	one that Banda is fetching

The plural, 'ones', is expressed by ඒවා:

පුරාන ඒවා	ancient ones
දුටුගැමුණු කාලෙ ඒවා	ones from the period of Dutugemunu
මම ලියපු ඒවා	the ones I wrote

10. වැඩි හරිය 'THE MAJORITY'

වැඩි හරිය 'the majority' follows a plural dependent noun in the instrumental case:

මේ කඩවල්වලින් වැඩි හරිය හොඳයි.	The majority of these shops are good.
වැව්වලින් වැඩි හරිය බොහොම පුරානයි.	The majority of the tanks are very old.

11. බාරෙ

බාරෙ 'in care of', 'in the custody of' follows a noun in the direct case:

වැඩි හරිය තියෙන්නෙ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව බාරෙ.	The majority are in the care of the Department of Archaeology.
මට එවන සේරම ලියුම් පෙරේරා බාරෙ එවන්න ඕන.	All letters sent to me must be sent in care of Perera.

12. තමයි

තමයි is a particle which emphasizes the preceding word. It will be the equivalent of English 'too, indeed, certainly so', etc., depending upon context. When this is added to predicate adjectives, the assertion marker is dropped:

මම යනවා තමයි.	I am so going!
මේ මහත්තයා තමයි ලොකු මහත්තයා.	This gentleman is the big boss.
මම කතා කරන්නෙ සිංහල තමයි.	It is Sinhalese that I'm speaking.
මේවා හොඳ තමයි.	These are good.

13. SUPERLATIVE DEGREE

The Sinhalese equivalent of the English superlative degree is formed by placing ඉතාම 'most, extremely' before the adjective. Thus: ඉතාම හොඳ 'best'. This construction may also be used to mean 'extremely good', etc., depending upon the context. Thus:

මේ පොත ඉතාම හොඳයි.	This book is best. or This book is extremely good.
මට ඉතාම ලොකු පැකැට් එක ඕන.	I want the biggest pack. or I want the extremely big pack.

14. IDIOMS

14.1 අර පේන

අර පේන is අර plus the verbal adjective form of පේනවා 'to see'. It is used as a set expression modifying nouns to mean 'visible over there', 'that can be seen yonder':

අර පේන දාගැබ බලන්න.	Look at that stupa that we can see over there.

අර පේන හෝටලේ ළඟට යන්න. එතනින් දකුණට හැරෙන්න.	Go up to that hotel, and turn right from there.

14.2 කෝ බලන්න

කෝ බලන්න is an idiom meaning 'let's see', 'let me see', 'let's have a look'.

15. "THE LETTER ක"

The names of the letters in the Sinhalese writing system are formed by adding යන්න . Thus ක යන්න 'the letter ක', බ යන්න 'the letter බ', අ යන්න 'the letter අ', etc.

Exercises

A. Substitute orally:

1. මහත්තයා ඊයෙ ....

had gone
had eaten
had read the paper
had delivered the letter
had repaired the car
had brought the coconuts
had broken the fence
had given a job
had bought vegetables
had gone to Jaffna

2. ඒ මිනිස්සු මේ රටට ආවෙ ....

in the tenth century
in the first century
in the twelfth century
before the Christian Era
in 192 B.C.
in 343 B.C.
in 596 B.C.
in 871 A.D.
in 1962 A.D.
in very ancient times

3. .... අයිති මට.

the majority of these estates
the majority of these books
the majority of the cars
the majority of the inscriptions
the majority of the temples
the majority of those buses

4. ඒ බඩු ....

belong to monks
belong to me
belong to the master
belong to Mr. Perera
belong to the driver
belong to the watchman of this estate
belong to the lady in that car
belong to the Department of Archaeology

5. මේ .... ලියලා තියෙන හැටි බලන්න.

the letter 'ක'
the letter 'ග'
the letter 'ම'
the letter 'ස'
these two letters 'ක'
those three letters 'බ'

6. .... පුරාණ එකක් ද?

that temple seen over there
that inscription seen over there
that tank seen over there
that sacred Bodhi tree seen over there
that shrine house seen over there
that stupa seen over there

7. .... එන්න පුළුවන් ද?

before next week
before next month
before the thirteenth
after the Independence festival
before the master comes
before the first of May
before the Vesak Festival is held
before we start our journey
after July fourth
before the Sinhalese New Year
after the Kandy Rerahera
after the dances

8. .... කොයි පොත ද?

better
older
more ancient

more beautiful
newer
bigger

9. .... ලියුම් එවන්න එපා.

care of Mr. Perera
care of this gentleman
care of the big boss
care of me
care of the estate
care of the driver

care of my uncle
care of the Department of Archaeology
care of Gunapala
care of the garage

10. මම ....

will get the car and go home
will clean up the estate and wash the car
will service the car and bring it to you
bought some vegetables and made a curry
went to the corner and barely caught the bus

11. මහත්තයා ....

will go to Colombo and work in the office
will get the money and give it to us on Monday
will drink a beer, eat some curry, and come back
picked a good novel and went home to read
finished the paper and gave it to me

B. Transform into pluperfect, according to the model:

මහත්තයා ගිහිල්ලා තියෙනවා....මහත්තයා ගිහිල්ලා තිබුනා.

1. උන්නැහේ වැඩ කරලා තියෙනවා.
2. ඒ ළමයා කාර් එලවාලා තියෙනවා.
3. මම කෑම කාලා තියෙනවා.
4. අපේ පුතා කොළඹ ගිහිල්ලා තියෙනවා.
5. ළමයා ඒ කතාව අහලා තියෙනවා.
6. අනුරාදපුරේ අග නුවර වෙලා තියෙනවා.
7. මේ බෝදිය වැටිලා තියෙනවා.

C. Transform into emphatic sentences, according to the model:

මේ පන්සල මට අයිතියි....මේ පන්සල අයිති මට.

1. මේ වත්ත පෙරේරාට අයිතියි.
2. වැව්වලින් වැඩි හරිය ආංඩුවට අයිතියි.
3. මේවා සේරම මාමාට අයිතියි.
4. මේ කඩවල් ලොකු මහත්තයාට අයිතියි.
5. මේ සිද්දස්තාන හාමුදුරුවන්ට අයිති ද?
6. මේ සෙල්ලිපිය දෙවෙනි සතවර්සෙට අයිති ද?
7. මේ පොත අපේ ඉස්කෝලෙ මුල් ගුරුවරයාට අයිති ද?

D. Transform according to the model, emphasizing with තමයි :

මේවා මගේ....මේවා මගේ තමයි.

1. මේ වත්ත අයිති අපට.
2. මම කතා කරන්නෙ සිංහල.
3. උන්නැහේ බොන්නෙ මාතලේ සුරුට්ටු.
4. වත්තෙ වැඩ කරන්නෙ බංඩා.
5. මම අද පොල් කැඩුවා.
6. ලමයා කාර් එලවාලා තියෙනවා.
7. ඒ දොස්තර බොහොම ප්‍රසිද්දයි.

E. Translate orally:

1. For learning Sinhalese, this book is better than that book.
2. This car is better than the master's old Austin.
3. This temple is much older than the temple in our village.
4. This stupa is much more famous than those tanks.
5. This kind of bananas is tastier than the kind in that shop.
6. The people in this village are different from the people in Colombo.
7. These sacred places are more than ten centuries old.
8. People like this tank more than that tank.
9. The way people speak here is different from the way people speak in the upcountry.

F. Say in Sinhalese:

1. Look at the stupa seen over there.
2. Is it very old?
3. Yes. The majority of these stupas are ones built in the Third Century B.C.
4. When the English (people) came, these stupas had been built.
5. When did the English come?
6. In 1815 A.D.
7. What was the capital of Ceylon at that time?
8. Anuradhapura.
9. When was Anuradhapura the capital of Ceylon?
10. From the third century B.C. to the tenth century A.D., Anuradhapura was the capital of Ceylon.
11. Did the people of Ceylon speak Sinhalese at that time?
12. Yes. But the Sinhalese of that time was much different from the Sinhalese spoken now.
13. I understand that. The script is different, too, isn't it?
14. Yes. Look at that inscription. Can you read it?
15. No. I can't even read a letter.
16. Look at that letter 'ම'.
17. It is similar to the modern letter 'ම', isn't it?
18. Yes.

LESSON 24

Conversation: Two University Students

Gunasena is trying to peruade Siripala to go to a lecture given by a visitor at a meeting of the University Sinhalese Association.

GUNASENA

සමිතිය	the association
රැස්වීම	the meeting
ඔයා සිංහල සමිතියෙ රැස්වීමට යනවා ද?	Are you going to the meeting of the Sinhalese Association?

SIRIPALA

යන්න බලාපොරොත්තුවක් නම් නෑ.	I have no intention of going, of course.

GUNASENA

හිතාගන ඉන්නවා	intend, resolve
මම නම් යන්න හිතාගන ඉන්නවා.	I am hoping to go.
යමු.	Let's go.

SIRIPALA

මොකක් ද අද තියෙන්නෙ?	What's on today?

GUNASENA

කතාව	the speech, talk
මාපිටිගම උන්නැහේ කතාවකට එනවා.	Mr. Mapitigama is coming to give a talk.

දැක්කා	saw
දැන්වීම	the notice
ඇයි? දැක්කෙ නැද්ද දැන්වීම?	Why? Didn't you see the notice?

SIRIPALA

මතක	remember
ඔව්. ඔව්. මට දැන් මතකයි.	Yes, I remember now.
කලින්	earlier
අහනවා	listen to
මම මිනිහාගෙ කතාවක් මීට කලිනුත් අහලා තියෙනවා.	I have listened to a speech by him before, too.
සවුත්තු	hopeless, useless
මිනිහාගෙ කතාවල් නම් බොහොම සවුත්තුයි.	His speeches are really useless.
දේ	the thing
මිනිහා දන්න දේකුත් නෑ.	There isn't anything he knows either.

GUNASENA

විබාගෙ	the examination
ප්‍රයෝජනවත්	useful
විබාගෙට ප්‍රයෝජනවත් දෙයක් කියාවි ද දන්නෙ නෑ.	I don't know if he will say anything useful for the examination.
ඒකයි	that's why
කල්පනා කරනවා	think
ඒකයි මම යන්න කල්පනා කෙරුවෙ.	That's why I thought of going.

SIRIPALA

මාත්‍රෘකාව	the topic
මොකක් ද මිනිහාගෙ කතාවෙ මාත්‍රෘකාව?	What's the topic of his talk?

අලුත් සිංහල නවකතා ගැන, නේ ද?	Isn't it on modern Sinhalese novels?

GUNASENA

ප්‍රශ්නෙ	the question
ඔව්. ඒකෙන් ප්‍රශ්නයක් එනව මයි.	We are sure to get a question on that.
හැම ...ම	every
සාහිත්‍යය	the literature
හැම අවුරුද්දෙ ම අලුත් සාහිත්‍යයෙන් ප්‍රශ්නයක් දෙකක් දීලා තියෙනවා.	A question or two on modern literature has been given every year.

SIRIPALA

ඩොක්ට	Doctor (Dr.)
අයිසෙ	friend
ඒකට ඩොක්ට වීරසිංහගෙ පොත කියෙව්වාම ඇති, අයිසෙ.	For that, it is enough to read Dr. Weerasinghe's book, my friend.
පැත්තකට දානවා	put aside
රවුම	the stroll, round
ගහනවා	hit
රවුමක් ගහනවා	go for a stroll
කතාව පැත්තකට දාලා රවුමක් ගහන්න යන්න එනවා.	Let the talk go, and let's go for a stroll.

GUNASENA

තමුසෙ	you
හරි	real, true, correct
රස්තියාදුව	the loafing
රස්තියාදුකාරයා	loafer
තමුසෙ හරි රස්තියාදුකාරයා, අයිසෙ.	You are a real loafer, friend.

රස්තියාදු ගහනවා	loaf
පාස් කරනවා	to pass
රස්තියාදු ගහලා විභාග පාස් කරන්නෙ කොහොම ද?	How can you pass exams by loafing about (literally: having loafed about)?

SIRIPALA

හැමදාම	every day
ලෙක්චර් එක	the lecture
හැමදාම ප්‍රශ්න දීලා තියෙන්නෙ වීරසිංහ උන්නැහේගෙ පොතෙනුයි ලෙක්චර්වලිනුයි.	Every time, questions have been given from Mr. Weerasinghe's book and from the lectures.
පල්	dry, useless, boring
ඔය පල් කතාව අහන්න යන්න ඕන නෑ.	You needn't go to listen to that dry talk.

GUNASENA

නිකං ඉන්නවා	just stay (without doing anything)
තමුසෙට බැරි නම් තමුසෙ නිකං ඉන්නවා.	If you can't, you just stay away.
මම නම් යනවා.	I am going.
තමුසෙ යන්නෙ නැති එක වැඩියෙ හොඳයි.	It's better that you are not going.
හූ කියනවා	boo
තමුසෙ රැස්වීමකට ගියොත් කරන්නෙ හූ කියන එක විතරයි, නේ?	If you go to a meeting, all you do is boo, eh?

SIRIPALA

හොඳයි. තමුසෙ යනවා.	All right, you go.

පල්හැල්ල	the useless talk
අහගන ඉන්නවා	remain listening
ගිහිල්ලා මිනිහාගෙ පල්හැල්ල අහගන ඉඳලා එනවා.	Go, listen to his useless talk, and come.
සිංහල නවකතා ගැන ඒ මිනිහාට වැඩියෙ හොඳ ලැක්චර් එකක් මම කරන්නම්.	On Sinhalese novels I will give you a better lecture than he (can).

GUNASENA

දේසපාලනේ	politics
දේසපාලන	political
දේසපාලන සමිතියෙ රැස්වීමක් නම් තමුසෙ යනවා, නේ ද?	If it were a meeting of the Political Association, you would go, wouldn't you?

SIRIPALA

ලස්සන	beautiful
ඔව්. ඒ රැස්වීම්වලට එන මිනිස්සු කතා කරන විදිය අහගන ඉන්න ලස්සනයි, නේ.	Yes. The way the people who come to those meetings talk is nice to listen to, isn't it?

GUNASENA

විනෝදෙ	the enjoyment
විනෝද වෙනවා	enjoy
එහෙනම් තමුසෙ රැස්වීම්වලට යන්නෙ විනෝද වෙන්න විතරයි, නේ?	Then you go to meetings only for enjoyment?

SIRIPALA

නැතුව?	What else?

GUNASENA

එහෙනම් තමුසෙ විනෝද වෙන්න යනවා.	Then you go and enjoy yourself.
යාලුවා	the friend
හැබැයි, යාලුවා, මගෙන් අහන්න එපා කතාවට කියාපු දේවල්.	But, friend, don't ask me the things said in the talk.

Grammar

1. NEW NOUNS

Class 1

ලෙක්චර් එක	'the lecture'

Class 2

සමිතිය	'the society, association'; gen. සමිතියෙ pl. සමිති
රැස්වීම	'the meeting'; gen. රැස්වීමෙ ; pl. රැස්වීම්
කතාව	'the talk, lecture'; gen. කතාවෙ ; pl. කතා
දැන්වීම	'the notice'; gen. දැන්වීමෙ ; pl. දැන්වීම්
මාත්‍රෘකාව	'the topic'; gen. මාත්‍රෘකාවෙ ; pl. මාත්‍රෘකා
සාහිත්‍යය	'the literature'; gen. සාහිත්‍යයෙ ; pl. සාහිත්‍ය
රවුම	'the round, stroll'; gen. රවුමෙ ; pl. රවුම්
රස්තියාදුව	'the loafing'; gen. රස්තියාදුවෙ ; pl. රස්තියාදු
පල්හෑල්ල	'the useless talk'; gen. පල්හෑල්ලෙ ; pl. පල්හෑලි

Class 4

විභාගෙ	'the examination'; pl. විභාග
ප්‍රශ්නෙ	'the question'; pl. ප්‍රශ්න
දේ	'the thing'; pl. දේවල්
දේශපාලනේ	'politics'; (no plural)
විනෝදෙ	'enjoyment'; (no plural)

Class 5

රස්තියාදුකාරයා	'the loafer'; pl. රස්තියාදුකාරයෝ
යාලුවා	'the friend'; pl. යාලුවෝ

2. NEW VERBS

Class 1

ගහනවා	'hit'
කල්පනා කරනවා	'think'
පාස් කරනවා	'pass'
රස්තියාදු වෙනවා	'loaf'
හූ කියනවා	'boo'
අහනවා	'listen to' (or 'ask' - 13,11)

Irregular

හිතා ගන්නවා	'have, have in mind, intend'
හිතං ඉන්නවා	'stay without doing anything'
විනෝද වෙනවා	'enjoy'

3. INTIMATE EXPRESSIONS

Conversation 24, a very informal discussion between two student friends, contains a number of expressions which are suitable for such a situation, but very rarely used in more formal circumstances. Thus, while the user of the book might wish to know them, he should avoid using them unless he is sure that such informality is allowable.

3.1 අඩිසෙ is used primarily by young people to equals, either as a term of address or as a form meaning 'you'. It is very common among male college students and school boys. Older people use it infrequently, and girls and women very rarely.

අඩිසෙ යනවා ද?	Are you going?
අඩිසෙත් එනවා ද?	Are you coming, too?
පොත් කියෙව්වාම ඇති, අඩිසෙ.	It's enough if you read the books, chum.

3.2 තමුසෙ is a 'you' form used for equals, or sometimes by a superior to an inferior (except within the family group). Different people have different reactions to it, and its use and implications vary from area to area of Ceylon. Some speakers use it freely while others studiously avoid it. Like අඩිසෙ it is used mostly by men. The safest rule is not to use it, but not to be offended if others do.

3.3 ඔයා is one of the members of the මෙයා set, and thus may mean 'that person by you'. It is also used as an equivalent to 'you'. As such it is primarily restricted to close friends, and is less formal than ඔහේ, more so than තමුසෙ. There is some individual variation in the extent to which people use ඔයා just as there is with ඔහේ (6.6). Just as some will use ඔහේ where others would continue to use මහත්තයා, some will use ඔයා, where others would continue to use ඔහේ. As always, it is safest to lean toward greater formality and use මහත්තයා, unless one is sure of the intimacy permitted by the situation, and the implication of the other forms in the particular area and group concerned.

4. THE SIMPLE IMPERATIVE

The simple form of the verb may be used as an imperative in those social situations in which the word තමුසෙ would be used for 'you'.

හොඳයි. තමුසෙ යනවා.	Fine, you go.

5. 'HOPE'

5.1 බලාපොරොත්තුව

'I hope, I expect' may be expressed in Sinhalese by
මම බලාපොරොත්තුවෙන් ඉන්නවා (8,1).
This expression may be used with a noun as object, in which case it equates with the English 'I expect, I hope to get', or with an infinitive as object equating with English 'I expect, I hope':

මම ලියුමක් බලාපොරොත්තුවෙන් ඉන්නවා.	I am expecting a letter.
මම යන්න බලාපොරොත්තුවෙන් ඉන්නවා.	I expect to go.

In the negative of the present, නෑ is substituted for ඉන්නවා as usual, but the instrumental form බලාපොරොත්තුවෙන් is replaced by the indefinite direct form බලාපොරොත්තුවක්:

මම යන්න බලාපොරොත්තුවක් නෑ.	I don't expect to go.
මම ලියුමක් බලාපොරොත්තුවක් නෑ.	I don't expect a letter.

The past tense and its negative are formed regularly:

මම යන්න බලාපොරොත්තුවෙන් උන්නා.	I expected to go.
මම ලියුමක් බලාපොරොත්තුවෙන් උන්නා.	I expected a letter.
මම යන්න බලාපොරොත්තුවෙන් උන්නෙ නැ.	I didn't expect to go.
මම ලියුමක් බලාපොරොත්තුවෙන් උන්නෙ නැ.	I didn't expect a letter.

5.2 හිතාගන ඉන්නවා

හිතාගන is the past participle of a verb හිතාගන්නවා 'to have in mind'. The forms of this verb other than හිතාගන occur only rarely in certain special situations. The complex verb හිතාගන ඉන්නවා may take a dependent infinitive, but not a dependent noun object and may have the same meaning as බලාපොරොත්තුවෙන් ඉන්නවා:

මම නම් යන්න හිතාගන ඉන්නවා.	I, of course, intend to go.
මම මේ සුමානෙ පාර ඉවර කරන්න හිතාගන ඉන්නවා.	I hope to finish the road this week.

6. මතක 'REMEMBER'

මතක 'remember' takes its subject in the dative case and the assertion marker in simple sentences. Thus:

මට මතකයි.	I remember.
මට ඒ කතාව මතකයි.	I remember that story.
මට මොකුත් මතක නැ.	I don't remember anything.

7. ඇති 'ENOUGH'

ඇති 'enough' is like මදි 'not enough' වැඩි 'too much' (22,8).

1. It replaces තියෙනවා, ඉන්නවා :

මට පොත් තියෙනවා.	I have some books.
මට පොත් ඇති.	I have enough books.

2. With verbs:

මහත්තයා වැඩ කරනවා ඇති.	The master works enough.

3. Following adjectives:

මේ ගේ ලොකු ඇති.	This house is big enough.
ලොකු ඇති ගෙවල් තියෙනවා නම් මට කියන්න.	If there are big enough houses, let me know.

4. As an adjective:

ඇති පොල් අරගෙන අනිත් හරිය මෙතනින් දාන්න.	Take enough coconuts (i.e., as many as you need) and put the rest here.

5. ඇති also occurs in a construction with the past temporal gerund. මදි and වැඩි also occur in this construction, but very rarely. The usual English equivalent is 'it's enough if . . .':

මම ගියාම ඇති	It's enough if I go.
ඔහේ මට සල්ලි දුන්නාම ඇති.	It's enough if you give me money.
දවසක් වැඩ කෙරුවාම ඇති.	If you work one day, it's enough.
ඩොක්ට වීරසිංහගෙ පොත කියෙව්වාම ඇති.	It's enough if you read Dr. Weerasinghe's book.
වැට බැන්දාම මදි.	It's not enough building the fence.

8. කලින්

8.1 කලින් may have as English equivalents 'before', 'earlier' or 'early'. As a postposition meaning 'before' it is an alternative to ඉස්සර (14,9) or ඉස්සෙල්ලා (20, 10) 'before', and like ඉස්සර or ඉස්සෙල්ලා takes a noun in the dative case:

මීට කලින් මීට ඉස්සර	before this
ලමයාට කලින් මම යන්න ඕන. ලමයාට ඉස්සර මම යන්න ඕන.	I must go before the boy.

8.2 කලින් may also follow a verb in the infinitive to form the Sinhalese equivalent of English 'before' clauses; and is an alternative for ඉස්සෙල්ලා in these constructions (20, 10):

මහත්තයා ගෙදර එන්න කලින් මම අර පොල් කඩන්න ඕන.	I must pick those coconuts before the master comes home.

8.3 As an adverb, කලින් may have the English equivalent 'earlier' or 'early'; ඉස්සෙල්ලා can also be used in this way:

කලින් එන්න පුලුවන් නම් හොඳයි. ඉස්සෙල්ලා එන්න පුලුවන් නම් හොඳයි.	It will be good if you can come earlier (early).

9. 'THAT'S WHY'

ඒක plus the assertion marker may mean 'that's why'. It is used with the emphatic form of the verb:

ඒකයි මම ආවෙ.	That's why I came.
අද කොලඹ උත්සවයක් තියෙනවා.	There is a festival in Colombo today.
මහත්තයා කොලඹ යන්නෙ ඒකයි.	That's why the master is going.

10. නැති

Some uses of the නැති form of නෑ are parallel to the verbal adjective form of verbs.

10.1 නැති may modify a following noun, and may be accompanied by other elements that accompany it in sentences to form the Sinhalese equivalent of an English negative relative clause (compare the verbal adjectives in 19, 5):

ළමයා ඉස්කෝලෙ යන්නෙ නෑ.	The child doesn't go to school.
ඉස්කෝලෙ යන්නෙ නැති ළමයා	The child who doesn't go to school
නෝනා පොත් කියවන්නෙ නෑ.	The mistress doesn't read books.
නෝනා කියවන්නෙ නැති පොත්	The books the mistress doesn't read

මම තානායමේ නවතින්නෙ නෑ.	I'm not staying in the resthouse.
මම නවතින්නෙ නැති තානායම	The resthouse that I am not staying in

10.2 From the verbal adjective a verbal noun is formed by adding එක to it (14, 6). In the same way, a verbal noun may be formed by adding එක to නැති producing නැති එක . Like the verbal noun of 14, 6, this is the equivalent of the English verbal noun in "-ing" or an English clause introduced by "that."

තමුසෙ හූ කියන්නෙ නෑ.	You don't hoot.
තමුසෙ හූ කියන්නෙ නැති එක වැඩියෙ හොඳයි.	It's better that you don't hoot. (Your not hooting is better.)

11. USEFUL EXPRESSIONS

1. නැතුව is often used to mean 'otherwise', 'if not', or 'if you don't, if one doesn't', 'why else':

නැතුව?	Otherwise? Why else?
නැතුව මම මොකද කරන්නෙ?	Otherwise, what can I do?
නැතුව ඉගනගන්නෙ කොහොම ද?	If not, how can one learn?

2. නිකං ඉන්නවා 'stay without doing anything' is commonly used in the imperative to stop or discourage someone from doing somethin As such, it may have numerous English equivalents:

මහත්තයා නිකං ඉන්න.	Don't do it.
එහෙනම් තමුසෙ නිකං ඉන්නවා.	All right, stay then!
ළමයා, නිකං ඉන්න.	Don't bother me, child.

Exercises

A. Substitute orally:

1. උන්නැහේ .... යනවා.

for a talk
for an upcountry dance
for a carpentry job
for a job
for a vacation
to make a speech
to dance
to do carpentry
to spend a vacation
to see a new car

2. මිනිහාගෙ කතාව ....

very beautiful
really useless
useful
not good enough
not useful enough
not useful for the exam
is about ancient capitals in Ceylon
is a very useless one

3. ඒ පොත ....

useful for the exam
new to me
difficult for my son
not new to the doctor
very new to this boy
the one that I brought
the one the master gave
not easy to read

4. එයා කතා කරන්නෙ .... ද?

about Sinhalese
about England
about American schools
about political questions
about Mr. Perera's novel
about the new literature
about a loafer
about what

5. මම .... ගමට යනවා.

every year
every day
every week
every month
by every bus
every Saturday
the whole year
the whole week
by the train that goes to Jaffna
by hiring a car

6. .... ඇති.

if you read his book
if you pick fifty coconuts
if you build this fence
if you service this car
if you repair these two buses
if you go for a stroll
if you give a question from modern literature
if you read these five novels

7. .... රවුමක් ගහන්න යමු.

having finished this work
having built the fence
having read the paper
having delivered the letters
having learned the book
having given two questions
having put the talk aside
having put the work aside

8. .... වැඩියෙ හොඳයි.

that you are going
that you are not going
that you are eating this food
that you don't eat Sinhalese food
that you don't remember the speech
that you don't pass the exam
that you don't drive cars
that you can't go to hear that useless talk
that the master doesn't know that book

9. .... මිරිස් වැඩියි.

In the salad that Banda made
In the curry that he gave me
In the tomato salad that Sirisena brought
In the food that Banda is preparing now

7

In the fried beef
In the vegetables boiled here

B. Transform according to the model, by changing 'every' to 'the whole':

මම හැම ප්‍රස්නෙ ම දන්නවා.....මම මුළු ප්‍රස්නෙ ම දන්නවා.

1. මම හැම පොත ම කියෙව්වා.
2. උන්නැහේ හැම වත්තක් ම ගත්තා.
3. මෙහෙට හැම මාසෙ ම වහිනවා.
4. තාත්තාට හැම සුමානෙ ම ගමට යන්න බෑ.
5. ඒ ලමයා හැම අවුරුද්දෙ ම විබාගෙට යනවා.
6. ඩොක්ට වීරසිංහගෙ පොත කියෙව්වාම හැම විබාගෙ ම පාස් කරන්න පුළුවනි.

C. Transform according to the model by adding ඇති:

මට පොත් තියෙනවා.....මට පොත් ඇති.

1. මෙතන නවකතාවක් තියෙනවා.
2. ඒ කඩේ ලමයි ඉන්නවා.
3. උන්නැහේ වැඩ කරනවා.
4. මහත්තයා සුරුට්ටු බොනවා.
5. මේ ගේ ලොකුයි.
6. මේ කෑම රසයි.
7. උන්නැහේ පත්තරේ බැලුවා.

D. Say in Sinhalese:

1. Do you go to work every day?
2. What else? I go to work on Sunday also.
3. Does the boss pay you wages every day?
4. No. He pays the whole week's wages on Monday.
5. People buy things from shops on Tuesday.
6. That's why he pays wages on Monday.
7. That's true. How can you buy goods without money?

8. Aren't you going to the meeting?
9. Which meeting: the political meeting?
10. Yes. The meeting is at 4 o'clock.

11. I can't go, friend. You go.
12. Who is coming to talk?
13. Mr. Gunasekera and Mr. Jayasena.
14. Mr. Gunasekera's talks are dry, aren't they?
15. Yes. But Jayasena's talks are nice to listen to.
16. He doesn't know a thing about politics.
17. Do you know the topic of his talk?
18. I don't know. Every talk of his his useless.
19. So you are not going?
20. No.
21. Then you stay. I'm going.
22. Fine.

REVIEW 6

A. Substitute orally:

1. මෙහේ පෙරහැර පවත්තන්නෙ..............

in April
at the end of May
before August
after July
in the middle of January
in October

in September this year
in March
at the end of February
after June
on the 5th of September
on the 14th of November

2. අම්මා කැම..............

has eaten
has bought
has brought
has taken to Colombo
has prepared

had eaten
had bought
had brought
had taken to Colombo
had prepared

3. ....මෙහේ පෙරහැරක් නෑ.

on Thursday
at this time
on the 15th
on Wednesday
at the time of the Kandy procession

4. ....කොලඹ යන්න හිතේ තියෙනවා.

the gentleman
I
my father
my uncle and brother
my wife
his wife
that watchman
any driver

5. මම..............පෙරහැර පෙන්නන්න ඕන.

to my son
to my mother
to my uncle
to my children
to these people
to my daughters

6. මම ලඟ පොත් ....තියෙනවා.

two or three
three or four
five or six
ten or twelve
ten or fifteen
twenty or thirty

7. සිරිසේන ඒවා ගත්තෙ..............?

from which shop
from which villages
from which one
from where (what spot?)
from which uncle
from which city
from which houses
from which teacher
from which doctor
from which books

8. ....රස නෑ.

vegetables fried in oil
the food I've eaten in that hotel
the cigars that my father has brought
the curry that my daughter made
the food I make
the cigars I smoke these days

the curry that my daughter makes
the curry that my daughter made
the cigar that I smoked yesterday
the vegetables that I fried
the salad prepared with shrimp
food fried without red pepper

9. තාත්තා.............. කිව්වා.

that my work is good
that I am late
that he is going to Colombo
that the bus is late
that the driver has gone to Jaffna
that my work is not good
that Gunapala didn't give the money
that my wife paid the wages

10. මට .... හදලා දෙන්න.

a vegetable or a meat curry
a house or a bungalow
shrimp or beef
chicken curry or a fried rice
a curry or a portion of plain rice

11. ඒ මිනිස්සු ලංකාවට ආවෙ ....

before the Christian Era
in 6th Century B.C.
in 5th Century B.C.
in 543 B.C.
in 483 B.C.
after the Christian Era
in 394 A.D.
in 756 A.D.
in the 12th Century A.D.
in the 18th Century A.D.
before that
before the English people

B. Transform according to the model, changing the verb to the pluperfect:

මහත්තයා කොලඹ ගිහිල්ලා තියෙනවා .....මහත්තයා කොලඹ ගිහිල්ලා තිඋණා.

1. අම්මා හොඳ කෑම ජාතියක් හදලා තියෙනවා.
2. මහත්තයා ඊට ඉස්සර සිංහල කෑම කාලා තියෙනවා.
3. මසුයි එලෝලුයි කලවම් කරලා තියෙනවා.
4. ඒ බත් තෙලෙන් බැදලා තියෙනවා.
5. ලමයා මස් කරි දෙකක් කාලා තියෙනවා ද?
6. ඒ එලෝලුවට මිරිස් වැඩියෙ දාලා තියෙනවා.
7. මුරකාරයා යාපනේ ඉඳලා තියෙනවා.

C. Transform according to the model, changing to the negative:

මම කොලඹ ගිහිල්ලා තියෙනවා.....මම කොලඹ ගිහිල්ලා නෑ.

1. අම්මා කෑම හදලා තියෙනවා.
2. මහත්තයා සිංහල කෑම කාලා තියෙනවා.
3. ඒ බත් තෙලෙන් බැදලා තියෙනවා.
4. මුරකාරයා යාපනේට ගිහිල්ලා තිඋනා.
5. ලමයා මස් කරියක් කෑලා තිඋනා.
6. මසුයි එලෝලුයි කලවම් කරලා තිඋනා.
7. පුතා වැඩ කරලා තිඋනා.

D. Transform according to the model, changing the present temporal gerund to the past temporal gerund:

මහත්තයා යනකොට මට යන්න පුලුවනි...මහත්තයා ගියාම මට යන්න පුලුවනි.

1. වැඩ කරන කොට සල්ලි දෙන්නම්.
2. සම්බෝලෙ හදන කොට මට කියන්න.
3. බීර ගේන කොට සල්ලි ඉල්ලාගන්න.
4. අනුරාදපුරේට යන කොට මහත්තයා හම්බවෙන්න පුලුවනි.
5. ඒ මිනිස්සු එන කොට අපි කඩේ උන්නා.
6. සිංහල මිනිස්සු ලංකාවට එන කොට නැවතුනේ කොහේ ද?
7. රුවන්වැලි සෑය ලඟට යන කොට සපත්තු ගලවන්න.

E. Transform according to the model, by changing the sentences into 'should I' questions:

මම අද යනවා....මම අද යන්න ද ?

1. අනුරාදපුරේට ගියාම තානායමේ නවතිනවා.
2. සිරිමහ බෝදිය ළඟට යනකොට සපත්තු ගලවන්නම්.
3. මම හන්දියෙන් එහාට යන්නම්.
4. මහත්තයාට තේ එකක් ගේන්නම්.
5. නෝනා මහත්තයාට මස් කරියක් හදලා දෙන්නම්.
6. බොන්න මොකුත් ගේන්නම්.
7. විහාරෙ ළඟ ටිකක් නවතින්නම්.

F. Transform according to the model by adding ඇති 'maybe':

මහත්තයා යනවා....මහත්තයා යනවා ඇති.

1. උන්නැහේ සිංහල කෑම කාලා තියෙනවා.
2. ඒ සිද්දස්තානෙ හාමුදුරුවන්ට අයිතියි.
3. ඒ සෙල්ලිපිය කියවන්න අමාරුයි.
4. මහත්තයා සිංහල අකුරු තිහක් විතර දන්නවා.
5. මේ පොතෙන් ප්‍රස්න දීලා.
6. ඒ මිනිහා අද රැස්වීමට යනවා.
7. ගුනපාල ඒ මිනිහාගෙ පල්හැල්ල අහගන ඉන්නවා.

G. Conversations

1. Gunapala is getting his summer vacation in the middle of July. He wants to visit ancient capitals of Ceylon. He talks to Mr. Gunasekera from the Department of Archaeology to get some idea of Anuradhapura. Gunasekera describes Anuradhapura.

2. Mr. Wood goes to a Sinhalese restaurant in Kandy. Sinhalese food is entirely new to him. He talks to the waiter about Sinhalese food and what he should order.

3. Gunapala and Sirisena disagree on a lecture given by a visitor to the University. Gunapala thinks that it might be useful for the exam they will take next week. But Sirisena thinks that it was an utter waste of time.

4. John arrives at the Anuradhapura station. He talks with a hiring-car driver about going to see the ancient temples and tanks. They discuss the time it is likely to take, the distance to be covered, the fare, and whether the driver can show John about so that he can take pictures.

Title VI NDEA

BR-7-8322 Part II

~~1911~~

PA-48

OE-BR [redacted]

COLLOQUIAL SINHALESE

ED025759

U.S. DEPARTMENT OF HEALTH, EDUCATION & WELFARE
OFFICE OF EDUCATION

THIS DOCUMENT HAS BEEN REPRODUCED EXACTLY AS RECEIVED FROM THE PERSON OR ORGANIZATION ORIGINATING IT. POINTS OF VIEW OR OPINIONS STATED DO NOT NECESSARILY REPRESENT OFFICIAL OFFICE OF EDUCATION POSITION OR POLICY.

FAIRBANKS
GAIR
DE SILVA

part II

AL 001 686

[redacted]

COLLOQUIAL SINHALESE

G. H. Fairbanks
J. W. Gair
M. W. S. De Silva

Part 2

Lessons 25 - 36
Appendix
Glossary

South Asia Program
Cornell University

1968

This work was prepared under contracts with
the Office of Education,
Department of Health, Education and Welfare,
Washington, D. C.

CONTENTS

Page

LESSON 25 - Running for Office 1
   1. New Nouns 5
   2. New Verbs 5
   3. Negative Formation නෙවි 6
   4. The මෙහෙම Set 7
   5. Complex Verbs 8
   6. Exclamatory Sentences 9
   7. වත් 10
   8. තිඋනාට මදි 10
   9. පුලුවන්කම 11
   10. ගානෙ 11
   11. කිසිම 'any . . . at all' 12
   12. හිතවත් 12
   13. වගේ 13
   14. 'Bad for' 13
   15. දැනට 14
   16. ඒ උනාට 14
   17. 'Throughout' 14
   18. 'Time' 14

LESSON 26 - Building Houses 18
   1. New Nouns 22
   2. New Verbs 24
   3. 'Built of Brick' 24
   4. 'As well as' 24
   5. 'Not only . . . but' 25
   6. 'Might' 26
   7. Superlatives 27

Page

8. Age 27
9. 'Up' and 'Down' 27
10. 'Lacking' 28
11. 'To roof, thatch' 29
LESSON 27 - Visit to a Buddhist Temple 32
1. New Nouns 35
2. New Verbs 36
3. කවුරු 'Who' 36
4. වත් 38
5. නො කෙරුවොත් 38
6. තුන් පලක් 40
7. 'Every, all' 41
8. ආසා 42
9. Instrumental Case 42
10. Emphatic Sentences 42
11. අර 42
12. Buddhist Monks 43
LESSON 28 - About an Author 46
1. New Nouns 49
2. New Verbs 50
3. ඇත්තෙ 50
4. Past Tense Verbal Adjective 51
5. Verbal Nouns 52
6. Repetition of Adjectives 55
7. 'From Day to Day' 56
8. 'Two-fifty' 57
9. 'Before, After' 58
10. 'Way, Manner' 58
11. 'As' 58
12. Negative 59
13. මං 59
14. 'I think . . .' 59
15. Respectful Forms 59
REVIEW 7 63

Contents Page

LESSON 29 - Finding Out About Doctors 66
1. New Nouns 69
2. New Verbs 70
3. Infinitive 71
4. 'Have to' 71
5. 'From . . . to . . ." 72
6. කලේ 72
7. Emphatic Equational Sentences 73
8. Adverbs in -ව. 73
9. Third Person Pronouns 73
10. රිදෙනවා 74
11. යටතෙ 74
12. සම්බන්දව 75
13. තරම් 75

LESSON 30 - Visiting a Friend 79
1. New Nouns 85
2. New Verbs 86
3. Idioms 86
4. හා 86
5. බෑ, පුලුවන් with Past Participle 87
6. 'Ill' 87
7. කම්මැලි 88
8. Past Tense Verbal Adjective 89
9. Past Participle 90
10. 'Take, Bring' 91
11. එක්ක 91
12. ම 91
13. අපේ 92
14. හිටිනවා 92
15. Simple Past 92

LESSON 31 - An Automobile Accident 96
1. New Nouns 101
2. New Verbs 102
3. Dative Case 102
4. Telling Time 104

5. 'Must Have' 107
6. 'Completely Ruined' 107
7. හදනවා 108
8. ආරංචි 108

LESSON 32 - Toddy Tapping 111
1. New Nouns 115
2. New Verbs 116
3. Past Participial Clauses 116
4. Numeral Expressions 117
5. 'Similar to' 118
6. ඊ, මී 118
7. 'Get a Chance to' 119
8. 'Climb, Descend' 119
9. බලනවා 119
10. 'See' 120
11. 'False' 120

REVIEW 8 122

LESSON 33 - The Government of Ceylon 126
1. New Nouns 131
2. New Verbs 132
3. The Object Marker - 132
4. 'Two or Three' 132
5. Other 134
6. Comparative Degree 135
7. 'Except' 135
8. Reflexive Pronoun 136
9. වෙනුවෙන් 136
10. 'What For' 137
11. අය 137
12. 'Intend' 137
13. 'All' 137
14. Terms of Respect 138
15. Adjectives 138

Contents Page

LESSON 34 - Going to a Movie 142
1. New Nouns 146
2. New Verbs 146
3. The Past Concessive Form 147
4. 'to Begin' 148
5. 'Inside' and 'Outside' 148
6. 'Half' 149
7. 'to Feel' 149
8. හින්දා 149
9. The -ඩ Form 150
10. Idioms 150
11. Writing System -ෂ. 151

LESSON 35 - Planning a Party 154
1. New Nouns 157
2. New Verbs 158
3. Reduplicated Form 158
4. Negative Past Participle 160
5. 'to Let' 160
6. 'Doesn't Appeal to' 161
7. වැඩියෙ 161
8. -ලා 'And Company' 162
9. කො 162
10. වෙන්න 163
11. Idioms 163

LESSON 36 - Agricultural Development 168
1. New Nouns 172
2. New Verbs 173
3. 'Despite the Fact that, Though' 173
4. මිසක් 175
5. Active and Passive Verbs 176
6. Use of the Active and Passive Verbs 176
7. තම තමන් 178

REVIEW 9 182

APPENDIX 186

GLOSSARIES - Lessons 1 - 36 196

LESSON 25

Conversation: Running for Office

Perera tries to talk Gunapala into running for Parliament in the next election.

PERERA

පාර්ලිමේන්තුව	Parliament
ඉදිරිපත් වෙනවා	come forward
නරක	bad
මහත්තයාටත් නරක ද මේ පාර පාර්ලිමේන්තුවට ඉදිරිපත් උනොත්?	Why don't you run for Parliament this time?

GUNAPALA

දැනට	right now
එහෙම	like that
කල්	time
දැනට නම් එහෙම බලාපොරොත්තුවක් නෑ.	Right now, I don't have any such intention.
නමුත් තව කල් තියෙනවා, නේ?	But there's still time, isn't there?

PERERA

පුළුවන්කම	possibility
සලකලා බලනවා	consider
පුළුවන්කමක් තියෙනවා නම් සලකලා බලන්න.	If there is a possibility, do consider it.
ඕන කරන	become necessary
ගම්මු	villagers
බලාපොරොත්තු වෙනවා	expect

ඕන කරන උදව්වක් ගම්මුන්ගෙන් බලාපොරොත්තු වෙන්න පුළුවනි. ඇහුනා ද?	You can expect any help you need from the villagers. All right? (Literally: Did you hear?)

GUNAPALA

ඒ උනාට	nevertheless
මහ	great, big
ඒ උනාට ඒක මහ කරදර වැඩේ, නේ.	Nevertheless, that's a very tedious job, isn't it?

රෑ දවල්	day and night
ගෙයක් ගානෙ	house to house
ඇවිදිනවා	walk
මහන්සි වෙනවා	exert oneself, tire oneself
රෑ දවල් ගෙයක් ගානෙ ඇවිදින්නයි කතා කරන්නයි කොව්වර මහන්සි වෙන්න ඕන ද?	How much must one tire oneself to walk from house to house day and night and to make speeches!

සමහරු	some people
ආසනේ	seat
දිනනවා	win
දිනා ගන්නවා	win for oneself
හිතනවා	think
එහෙම කරලාත් සමහරුන්ට ආසනයක් දිනාගන්න හිතන්න වත් බෑ!	Even having done all that some people can't even think of winning a seat!

PERERA

චන්දෙ	vote
නෙවි	not
චන්දයක් දිනන එක ලේසි වැඩක් නෙවි.	Winning an election is not an easy thing.

ඒක හැබෑව.	That's true.
ආදාරෙ	support
ලබනවා	obtain
ලබාගන්නවා	obtain for oneself
කිසිම	any, whatsoever
ඈමුත් මහත්තයා වගේ කෙනෙකුට මහජනයාගෙ ආදාරෙ ලබාගන්න කිසිම අමාරුවක් නෑ, නේ.	But, for a man like you there's no difficulty in getting people's support, is there?
මහත්තයා ඉදිරිපත් වෙන්න.	You come forward.
ඕන හරිය	whatever is necessary
ඕන හරිය අපි බලාගන්නම්.	We shall see to whatever is necessary.
යවනවා	send
හිතවත්	well-wishing
අපට පාර්ලිමේන්තුවට යවන්න ඕන මහජනයාට හිතවත් කෙනෙක්.	We want to send to Parliament someone who has the people's interest at heart.

GUNAPALA

එකඟ වෙනවා	agree
කටයුතු	activities
හිතවත්කම	friendship understanding
ඒකට මම එකඟ වෙන්නෙ නෑ.	I don't agree with that.
පාර්ලිමේන්තුවෙ කටයුතු කරන්න මහජනයාට හිතවත්කම තිබුනාට මදි.	To work in Parliament, being friendly to the people is not enough.
දේසපාලන කටයුතු ගැන අවබෝදෙකුත් තියෙන්න ඕන.	You must also have an understanding of political work.

PERERA

දැනීම	knowledge
ඉතින් මහත්තයාට එහෙම දැනීමක් නැද්ද?	So, don't you have such a knowledge?
තිස්සෙ	throughout
ගං සබාව	Village Council
දැන් අවුරුදු තුනක් හතරක් තිස්සෙ ගං සබාවෙ කටයුතු කරලා තියෙනවා, නේ ද?	For three or four years now you have worked in the Village Council, haven't you?
එකක් කියන්නම්	I'll tell one thing
මහත්තයාට එකක් කියන්නම්.	I'll tell you one thing.
මන්ත්‍රී තුමා	Member of Parliament
දැන් ඉන්න මන්ත්‍රී තුමාගෙන් අපට මොකක් ද වෙලා තියෙන ප්‍රයෝජනේ?	What benefit has come to us from the present M.P.?
මහත්තයා ඉදිරිපත් වෙනවා නම් දිනන එක අපි බලාගන්නම්.	If you'll come forward we'll see to the winning.

GUNAPALA

කල්පනා කරනවා	think, consider
පස්සෙ කල්පනා කරලා බලමු.	We'll consider it later and see.
අදහස	intention
දැන් නම් මගේ අදහසක් නෑ.	Right now I have no such intension.

Grammar

1. NEW NOUNS

Class 2

පාර්ලිමේන්තුව	'parliament'; gen. පාර්ලිමේන්තුවෙ ; pl. පාර්ලිමේන්තු
පුලුවන් කම	'possibility'; gen. පුලුවන් කමේ ; pl. පුලුවන් කම්
ගං සබාව	'village council'; gen. ගං සබාවෙ ; pl. ගං සබා
හිතවත් කම	'friendship'; gen. හිතවත් කමේ ; pl. හිතවත් කම්

Class 3

ප්‍රයෝජනේ	'the use, benefit'; pl. ප්‍රයෝජන

Class 4

අවබෝදෙ	'understanding'; pl. අවබෝද
ආදාරෙ	'support'; pl. ආදාර
ආසනේ	'seat'; pl. ආසන
චන්දෙ	'vote, election'; pl. චන්ද

Class 5

මන්ත්‍රී තුමා	'Member of Parliament'; pl. මන්ත්‍රී තුමාලා

Plural only:

ගම්මු	'villagers'
සමහරු	'some people'

2. NEW VERBS

Class 1

යවනවා	'send'
සලකලා බලනවා	'consider'
දිනනවා	'win'
හිතනවා	'think'
ලබනවා	'obtain'

Class 2

ඇවිදිනවා	'walk'

Irregular:

ඉදිරිපත් වෙනවා	'come forward'
එකඟ වෙනවා	'agree'
බලාපොරොත්තු වෙනවා	'expect, anticipate'

3. NEGATIVE FORMATION --නෙවි

Up to this point, negative sentences or clauses, except those with එපා and බෑ have been formed with නෑ or one of its forms (නැති, නැත්තෙ, නැතුව , and the interrogative නැද්ද). In this conversation, the other major Sinhalese negative word, නෙවි , occurs for the first time. නෙවි forms the negative of some important sentence types for which නෑ may not be used, and hence for which negative forms have not been given so far.

3.1 Equational sentences with a noun or noun phrase as predicate attribute regularly form the negative by adding නෙවි :

මේක හොඳ සිගරැට් ජාතියක් නෙවි.	This is not a good kind of cigarette.
අර කවුන්ටරේ පොත් නවකතා පොත් නෙවි.	The books on that counter are not novels.
ඒක හැබෑව නෙවි.	That's not so.
චන්දය දිනන එක ලේසි වැඩක් නෙවි.	Winning a vote isn't an easy job.

3.2 Emphatic sentences form the negative by adding නෙවි:

මහත්තයා යන්නෙ කලුතරට නෙවි.	It's not to Kalutara that the master is going.
මම කිව්වෙ ඒක නෙවි.	That isn't what I said!
අර දොස්තර එලවන්නෙ ඔස්ටින් එකක් නෙවි.	It isn't an Austin that that doctor drives.
මට ඕන මස් කරියක් නෙවි.	It isn't a meat curry I want.

Note that a negative sentence with නෙවි usually implies that the speaker, in denying something, has another alternative in mind. Hence the alternative may be expressed:

මේක මගේ පොත නෙවි, මහත්තයාගෙ පොත.	This isn't my book. It's the gentleman's book.
චන්දයක් දිනන එක ලේසි වැඩක් නෙවි, බොහොම අමාරු වැඩක්.	Winning a vote isn't an easy job, it's very hard.
මහත්තයා යන්නෙ අනුරාදපුරේට නෙවි, සීගිරියට.	The master isn't going to Anuradhapura, but to Sigiriya.
මට ඕන හරක් මස් නෙවි, කුකුල් මස්.	It isn't a beef curry I want, but a chicken (curry).

3.3 In some dialects of Sinhalese, නෙවි occurs as නෙමෙ , but there is no difference in use:

මේක හොඳ සිගරැට් ජාතියක් නෙමෙ.	This is not a good kind of cigarette.
මහත්තයා යන්නෙ කලුතරට නෙමෙ.	It's not to Kalutara that the master is going.

4. THE මෙහෙම SET

4.1 එහෙම 'like that' is one of another set of four location words:

මෙහෙම	like this
ඔහොම	like that (which you are doing, or which involves you)
අරහෙම	like that (over there)
එහෙම	like that (in question)

In previous lessons, එහෙම has occurred in such expressions as:

එහෙම ද?	(Is it) like that? Is that so?
එහෙම නම්	If it's like that . . ., if that's so . . .

The other members of the set occur in similar expressions. For example:

මෙහෙම ද?	Like this? Is it like this?
මෙහෙම නම්	If it's like this . . ., if this is so . . .

4.2 The members of the set occur adverbially, with the meaning 'like this, like that', or 'in this, that way', 'so':

ඔහොම ලියන්න එපා; මෙහෙම ලියන්න.	Don't write like that (as you are), write like this!
තාත්තාට ඔහොම කතා කරන්න එපා!	Don't talk to your father that way!
චන්ද එහෙම දිනන්න බෑ.	You can't win votes like that (in that way).
එහෙම කරලාත් මට චන්ද දිනාගන්න බෑ.	Even having done so, I can't win those votes.

4.3 They may also act as adjectives modifying following nouns, and may have English equivalents 'like this/that' or 'of this/that sort'.

මෙහෙම කෑම මම කවදාවත් කාලා නෑ.	I've never eaten food like this.
අරහෙම පොත් කියවන්න ඔහේට පුලුවන් ද?	Can you read books of that sort?

4.4 කොහොම 'how, in what way' is the corresponding interrogative word to the මෙහෙම set:

මෙහෙම ද?	Like this?
කොහොම ද?	How?
මේ වැඩ කරන්නෙ මෙහෙම ද?	Is this work done in this way?
මේ වැඩ කරන්නෙ කොහොම ද?	How is this work done?

5. COMPLEX VERBS

5.1 In Lesson 22, we met complex verbs formed with a past participle plus දෙනවා. As noted there, these complex verbs usually have the sense 'to do something for someone'. Thus:

මට කරියක් හදලා දෙන්න.	Make me a curry.
මට ටැක්සියක් නවත්තලා දෙන්න.	Stop a taxi for me.
අපිට වැටක් බැඳලා දුන්නා.	(He) built us a fence.

These complex verbs with දෙනවා, if they are formed with the past participles of Class 1 or Class 2 verbs, have alternative forms which may occur with no change of meaning. These alternate forms have the PAST PARTICIPLE STEM rather than the past participle. The past participle stem is that to which either the -ලා of the past participle or the -පු of the past participial adjective is added. Thus, instead of the sentences above, we may have:

මට කරියක් හදා දෙන්න.	Make me a curry.
මට ටැක්සියක් නවත්තා දෙන්න.	Stop a taxi for me.
අපිට වැටක් බැඳ දුන්නා.	(He) built us a fence.

It will be remembered that Class 1 verbs have alternate past participle forms with either ə or aa, a so that හදනවා has either හදලා or හදාලා ; නවත්තනවා either නවත්තලා or නවත්තාලා . They thus have alternate forms of the past participle stem. However, only the form with -a- or -aa- occurs as the first member of complex verbs, never the form with -ə.

Class 3 verbs do not occur in complex verb constructions.

5.2 Complex verbs may also be formed with ගන්නවා , but these always have the form past participial stem plus ගන්නවා . There is no alternative form with the past participle. The meaning is most commonly 'to do for oneself'. Thus:

මම කරියක් හදාගන්නවා.	I'm making myself a curry.
මම ටැක්සියක් නවත්තාගන්නම්.	I'll stop a taxi (for myself).
මේ මිනිස්සුන්ගෙ චන්ද ලබාගන්න අමාරුයි.	It's hard to get these people's votes.

6. EXCLAMATORY SENTENCES

Sentences with an interrogative word and ද may be exclamatory as well as interrogative:

මේ බඩුවලට කොච්චර සල්ලි ඕන ද?	How much money do I need for these goods?
මේ බඩුවලට කොච්චර සල්ලි ඕන ද!	How much money I need for these goods!

පාර්ලිමේන්තුවට ඉදිරිපත් වෙන්න කොච්චර මහන්සි වෙන්න ඕන ද?	How much effort must one expend to run for Parliament?
පාර්ලිමේන්තුවට ඉදිරිපත් වෙන්න කොච්චර මහන්සි වෙන්න ඕන ද!	How much effort one must expend to run for Parliament!

7. වත්

වත් 'even, at least' commonly has the English equivalent 'at least' in positive and 'even' in negative sentences.

7.1 වත් may follow a noun:

මට හෙට වත් යන්න ඕන.	I want to go tomorrow, at least.
මට හෙට වත් යන්න ඕන නෑ.	Even tomorrow, I don't want to go.
එහේ හෝටලේ බත් වත් තියෙනවා.	In the hotel there there's rice at least.
එහේ හෝටලේ බත් වත් නෑ.	In the hotel there there's not even rice.

7.2 වත් may occur after an infinitive accompanying පුලුවන් or බෑ.

මට පයින් වත් යන්න පුලුවනි.	I can at least go on foot.
මට පයින් වත් යන්න බෑ.	I can't even go on foot.

හිතන්න වත් බෑ 'can't even think, imagine' is an example of this construction, but with an infinitive dependent on හිතන්න it takes on the idiomatic sense 'haven't the slightest chance of':

එහෙම කරලත් සමහරුන්ට ආසනයක් දිනාගන්න හිතන්න වත් බෑ.	And even having done so, some haven't the slightest chance of winning a seat.

8. තිඋනාට මදි.

In Lesson 24 we met a construction with the past temporal gerund and ඇති (and rarely මදි or වැඩි) as in:

පොත් කියෙව්වාම ඇති.	Reading books is enough.

In this conversation a similar construction occurs, in which the simple past tense of the verb inflected for dative case is used rather than the gerund; in this construction only මදි is used.

මහජනයාට හිතවත්කම තිඋනාට මදි.	Having the public's interest at heart isn't enough.
ගං සබාවෙ කටයුතු කෙරුවාට මදි.	Having carried out village committee duties isn't enough.

9. පුලුවන් කම

කම may be added to forms like පුලුවන්, බෑ (in the form බැරි), ඕන , එපා , නෑ (in the form නැති), as well as to a number of adjectives to form nouns with a related meaning.

පුලුවන් කම	the possibility
බැරි කම	the impossibility
ඕන කම	the necessity
එපා කම	the lack of interest
නැති කම	the lack

පුලුවන්කමක් තියෙනවා නම් සලකලා බලන්න.	If there is a possibility, think it over.
යන්න ඕනකම නිසා මම කුලී කාර් එකක් ගත්තා.	Because of my desire to go, I got a taxi.

These nouns inflect like Class 2 nouns:

එයාට කාර් එක එලවන්න බැරිකමෙන් ගමන පරක්කු උනා.	The trip was delayed (i.e., it took longer) because he couldn't drive a car.

10. ගානෙ

ගානෙ preceded by a noun in the direct indefinite forms the Sinhalese equivalent of such expressions as 'from house to house', 'from village to village', 'day after day'.

ගෙයක් ගානෙ යන්න ඕන.	We must go from house to house.
උන්නැහේ දවසක් ගානෙ ලැක්චර් කරනවා.	He lectures day after day.

අපි ගමක් ගානෙ ගියා.	We went from village to village.

Optionally, the noun in the indefinite may be repeated with no change in meaning:

ගෙයක් ගෙයක් ගානෙ	from house to house
දවසක් දවසක් ගානෙ	day after day
ගමක් ගමක් ගානෙ	from village to village

In all the above expressions, the word ගානෙ may be replaced by පායා with no change in meaning:

ගෙයක් පායා ගෙයක් ගෙයක් පායා	from house to house

11. කිසිම 'any . . . at all'

කිසිම modifies following nouns in the indefinite, and the resulting phrase may occur only in a negative sentence. The sense is 'any . . . at all' or 'a single . . . ':

මේ ළමයාට කිසිම පොතක් නෑ.	The boy doesn't have a single book.
වත්තෙ කිසිම මිනිහෙක් නෑ.	There aren't any men at all in the estate.
අපි ළඟ කිසිම සිගරැට් ජාතියක් නෑ.	We don't have any kinds of cigarettes at all.
මෙහේ කිසිම කෙනෙක් නෑ.	There's nobody here at all.

12. හිතවත්

හිතවත් is an adjective with the meaning 'thinking of someone's or something's interest', or 'having it at heart'. The beneficiary is in the dative case:

ඒ මහජනයාට හිතවත් කෙනෙක්.	That's a man who has the public's interest at heart!

කම may be added to හිතවත් to form a related noun හිතවත්කම 'the having of X's interest at heart'.

මහජනයාට හිතවත්කම තිඋනාට මදි.	Having the public's interest at heart isn't enough.
ඔහේට හිතවත්කම තියෙන කෙනෙකුට කියන්න.	Tell (it) to a person who has your interest at heart.

13. වගේ

13.1 In Lesson 19, phrases with වගේ 'like' and a dependent noun in the direct case occurred as predicate attributes. The assertion marker is optional:

ඒ මිනිහා මහත්තයා වගේ.	That man is like the master.

Such phrases may, like adjectives, modify following nouns and, as with adjectives, the assertion marker does not appear:

මහත්තයා වගේ කෙනෙක් ඕන.	We want a man like you.

13.2 වගේ may be used with a preceding dependent noun or pronoun to form an adverbial construction. The case of the dependent noun or pronoun will depend on the construction in which it is used:

අර මහත්තයාට වගේ මටත් සිංහල පුලුවනි.	I can speak Sinhalese like that gentleman.
මිහත්තයාගෙ වගේ පොතක් මටත් තියෙනවා.	I have a book like yours.

14. 'BAD FOR'

In Sinhalese, the equivalent of the English 'bad for somebody' is expressed by the dative case of the person plus the adjective නරක 'bad'. Equivalent expression may be formed with many adjectives:

මහත්තයාට නරක ද?	Would (it) be bad for you?
මේ කෑම මට හොඳ නෑ.	This food isn't good for me.
මේ වැඩ මට අමාරුයි.	This work is hard for me.
මේ වැඩ මට පහසුයි.	This work is easy for me.
මේ පොත මට ප්‍රයෝජනවත්.	This book is useful to me.

15. දැනට

දැනට is the word දැන් 'now' with the dative case ending added to it, and has the meaning 'right now', 'at this time'.

දැනට එහෙම බලාපොරොත්තුවක් නෑ.	At this time, I have no such intention.

16. ඒ උනාට

ඒ උනාට 'nevertheless, but' is used like නමුත්, but the latter can have only the meaning 'but, not, nevertheless':

ඒ උනාට මට යන්න පුලුවනි.	But I can go.
නමුත් මට යන්න පුලුවනි.	But I can go.

17. 'THROUGHOUT'

The post position තිස්සෙ takes a noun in the direct case and has the meaning 'throughout'. It has a variant form මුලුල්ලෙ :

මම මාසයක් තිස්සෙ මෙහෙ උන්නා.	I stayed here (throughout) a month.
මම මාසයක් මුලුල්ලෙ මෙහෙ උන්නා.	I stayed here (throughout) a month.

18. 'TIME'

The words කල් and වෙලා both may equate with English 'time' in expressions such as 'a lot of time'. වෙලා usually means a short period of time, something less than a day, and කල් a longer stretch:

මට වැඩ කරන්න කල් මදි.	I don't have enough time to work.
මට වැඩ කරන්න වෙලා මදි.	I don't have enough time to work.

කල් is actually the plural form of the Class 3 noun කල 'the time', but the latter is used only in some special situations, to be learned as they occur.

Exercises

A. Substitute orally:

1. මහත්තයාට නරක ද ....

if you would run for Parliament
if you would go to Colombo
if you would drive my car
if you would teach Sinhalese
if you would eat a Ceylon curry
if you would go to Ceylon
if you would consider
if you would exert yourself

2. මම හෙට ....

make a curry for someone
build a fence for someone
pick coconuts for someone
stop the bus for someone
get the votes for someone
do that work for someone
service the car for someone

3. මම අද ....

am making a curry for myself
am building a fence for myself
am picking coconuts for my own use
will stop a taxi for myself
will win the votes

4. උන්නැහෙ .... කොළඹ යනවා.

every day
every week
every month
every year

5. මහත්තයා .... ඇවිදිනවා.

from village to village
from town to town
from shop to shop
from house to house
from school to school

6. මේ කඩේ .... නෑ.

any kind of cigarettes
any body
any book
any kind of vegetables
any boy whatsoever
any thing whatsoever

B. Transform by changing to the negative, according to the model:

ඒක ලේසි වැඩක්.....ඒක ලේසි වැඩක් නෙවි.
1. මහත්තයා යන්නෙ කලුතරට.
2. මම එලවන්නෙ බස් එක.
3. මේක මස් කරියක්.
4. මම වත්තට යනවා.
5. මම යන්නෙ පාර්ලිමේන්තුවට.
6. මම කියෙව්වෙ අර පොත.
7. වන්දෙ දිනුවෙ පෙරේරා මහත්තයා.
8. අර කවුන්ටරේ තියෙන්නෙ නවකතා පොත්.
9. මම සිංහල දන්නවා.

C. Transform according to the model by using වත් 'at least, even':

මම හෙට යන්න ඕන.....මම හෙට වත් යන්න ඕන.

1. මම කලුතර නවතින්නම්.
2. එහේ හෝටලයක් නෑ.
3. අපේ කඩේ කෝපි නෑ.
4. ඔහේ ලග සුරුට්ටු තියෙනවා ද?
5. මහත්තයා වැඩ කරන්න යනවා ද?
6. මට ඒක හිතන්න බෑ.
7. ඒ ලමයාට කාර් එලවන්න පුලුවන් ද?

D. Say in Sinhalese:

1. If there is a possibility, try to go to Colombo tomorrow.
2. Tomorrow there is a famous festival in Colombo.
3. Our M.P. is going there, too.
4. If you go to Colombo, go and see the Parliament also.
5. It is near the Galle Face Hotel.
6. You know the place where the Galle Face Hotel is, don't you?

7. I get a lot of support from the villagers.
8. Here the villagers are very friendly.
9. When I walk in the village, the villagers give me tea.
10. Some people give me food also.
11. They come to my house day and night.
12. I like talking to them.
13. The people of this village take a lot of effort to work.

LESSON 26

Conversation: Building Houses

John and Perera are discussing the methods of building houses in Ceylon.

JOHN

ගොඩනැගිල්ල	building
ගඩොල	the brick
මෙහේ ගොඩනැගිලි සේරම හදන්නෙ ගඩොල්වලින් ද?	Are all buildings here built of bricks?

PERERA

කලුගල්	black granite
ගඩොලෙනුත් බඳිනවා, කලුගලෙනුත් බඳිනවා.	They are built of bricks as well as black granite.
සමහර පලාත්වල කබුක් ගලුත් පාවිච්චි කරනවා.	In some areas they also use *kabuk*.
දුප්පත්	poor
වරිච්චිය	wattle and daub
දුප්පත් මිනිස්සු නම් ගෙවල් හදන්නෙ වරිච්චියෙන් තමයි.	Poor people, of course, build houses out of wattle and daub.
ගම්බද	village area
අය	persons
බිත්තිය	the wall
හුනු	plaster, lime
කපලාරු කරනවා	plaster (verb)

ගම්බද හුඟක් අය බිත්ති වරිච්චියෙන් බැඳලා හුනු කපලාරු කරනවා.	Many people in villages build their walls out of wattle and daub and plaster them.

JOHN

වහල	roof
හෙවිලි කරනවා	thatch
රට උලු	factory-made tile
වහලවල්වල වැඩියෙ හෙවිලි කරන්නෙ රට උලු ද?	Do they mostly roof their houses with factory-made tiles?

PERERA

කොලඹ පලාතෙ නම් වැඩියෙ හෙවිලි කරන්නෙ රට උලු තමයි.	In Colombo area, of course, they mostly use factory-made tiles.
ගං උලු	village tile, locally-made tiles
ගම්බද පලාත්වල හෙවිලි කරන්නෙ ගං උලු.	In village areas they roof with village tiles
දුප්පත් ම	poorest
පොල් අත්ත	the coconut leaf
පිදුරු	straw
දුප්පත් ම ගෙවල්වල පොල් අතු හරි පිදුරු හරි තමයි හෙවිලි කරන්නෙ.	On the poorest houses they thatch their roofs with coconut leaves or straw.
ඇයි, මහත්තයා දැකලා ඇති නේ අතු හෙවිලි කරපු ගෙවල්.	Why, you must have seen houses thatched with leaves.

JOHN

පවතිනවා	last
කලුගලෙන් හරි ගඩොලෙන් හරි බැන්දොත් ගෙවල් හුඟක් කල් පවතිනවා ඇති, නේ ද?	Houses must last a long time if they are built with black granite or bricks, eh?

PERERA

ඔව්. මේ ගෙට දැන් අවුරුදු සීයක් විතර වෙනවා.	Yes. This house is now about 100 years old.
බාගයක් උසට	halfway in height
මේකෙ බිත්ති බාගයක් උසට බැඳලා තියෙන්නෙ කළුගලෙන්.	The walls of this one are built out of black granite halfway up.
ඉහල	above
එතනින් ඉහලට ගඩොල්.	Above that it is bricks.
ලී	timber, wood
කොස්	jak, a kind of tree
වහලෙ සේරම ලී කොස්.	All the wood in the roof is jak.
වේයා	the white ant
හොඳ කොස් ලී කවදාවත් වේයො කන්නෙ නෑ.	Good jak wood is never eaten by white ants.
පුච්චනවා	burn, fire, bake
වහලෙ උළු ගමේ පුච්චාපු ඒවා.	Tiles on the roof are those fired in the village.

JOHN

පොලව	earth
මෙහේ පොලවෙ වේයො ඉන්නවා ද?	Are there white ants in the earth here?

PERERA

ඉඳලා හිටලා	occasionally
මතුවෙනවා	appear, surface (verb)
ඔව්. ඉඳලා හිටලා වේයො මතුවෙනවා.	Yes. Occasionally white ants come to the surface.
අත්තිවාරම	foundation
ඉඩ තියෙනවා	there is a possibility

අත්තිවාරම ගලෙන් බැන්දෙ නැත්තං වේයො බිත්ති දිගේ මතුවෙන්න ඉඩ තියෙනවා.	If the foundation isn't built of stones, white ants can come up along the walls.

JOHN

අපේ රටේ නම්, වේයන්ගෙන් කරදරයක් නෑ.	In our country there's no trouble with white ants.
එහේ ගෙවල් හුඟක් හරියක බිත්ති බැඳලා තියෙන්නෙ ලීයෙන්.	In most houses there the walls are made of wood.
ඒත් සමහර දිහාවල්වල වේයො ඉන්නවා.	But in some areas there are white ants.
අඩු	less
ඒ පලාත්වල ලීවලින් ගෙවල් බඳිනවා අඩුයි.	In those areas they rarely build houses out of wood.
සොල්දරේ	the upstairs
සොල්දර ගේ	the two-story house
මෙහේ සොල්දර ගෙවල් අඩුයි, නේ ද?	Here two-story houses are rare, aren't they?

PERERA

වියදම	expenditure, cost
ඔව්. ගම්බද සොල්දර ගෙවල් හදනවා අඩු වියදම වැඩි නිසායි.	Yes. In villages they rarely build two-story houses because the cost is too high.
කොන්ක්‍රීට්	concrete
සොල්දර ගෙවල්වලට හුඟක් කොන්ක්‍රීට් ඕන, නේ?	You need a lot of concrete for two-story houses, don't you?

JOHN

යකඩෙ	the piece of iron
කොන්ක්‍රීට් විතරක් නෙවි, යකඩත් ඕන කරනවා, නේ ද?	Not only concrete, but you need iron, too, don't you?

PERERA

මද්‍යම	middle
පන්තිය	class, level
ඔව්. මද්‍යම පන්තියෙ මිනිස්සුන්ට ගෙවල් හදන්න එච්චර වියදම් කරන්න අමාරුයි, නේ.	Yes. It is difficult for middle class people to spend that much on building houses, isn't it?

JOHN

ඒක ඇත්ත.	That's true.

Additional Vocabulary

පහල	down

Grammar

1. NEW NOUNS

Class 1:

කොන්ක්‍රීට් එක	'concrete'

Class 2:

අත්තිවාරම	'the foundation'; gen. අත්තිවාරමේ ; pl. අත්තිවාරම්
කබුක් ගල	'the piece of kabuk'; gen. කබුක් ගලේ ; pl. කබුක් ගල්
කලු ගල	'the piece of black granite; gen. කලු ගලේ ; pl. කලු ගල්
ගඩොල	'the brick'; gen. ගඩොලෙ ; pl. ගඩොල්

Note: for some speakers, the singular is Class 4: ගඩොලෙ

ගොඩනැගිල්ල	'the building'; gen. ගොඩනැගිල්ලෙ; pl. ගොඩනැගිලි
පන්තිය	'the class, level'; gen. පන්තියෙ ; pl. පන්ති
පොලව	'the earth'; gen. පොලවෙ ;
පොල් අත්ත	'the coconut leaf'; gen. පොල් අත්තෙ ; pl. පොල් අතු
බිත්තිය	'the wall'; gen. බිත්තියෙ ; pl. බිත්ති

ලීය	'the piece of wood'; gen. ලීයෙ ; pl. ලී
වරිච්චිය	'wattle and daub'; gen. වරිච්චියෙ ; pl. වරිච්චි
වහල	'the roof'; gen. වහලෙ ; pl. වහලවල්
වියදම	'expenditure; gen. වියදමේ ; pl. වියදම්

Class 3:

ගම්බද	'the village area'; no plural

Class 4:

යකඩෙ	'the piece of iron; pl. යකඩ
සොල්දරේ	'the upstairs'; pl. සොල්දරවල්

Class 5:

වේයා	'white ant'; pl. වේයො
අය	'people'

Note: අය never occurs by itself, but is always qualified by something preceding it. Though it is plural in meaning, the inflection is always definite singular:

හුඟක් අය	many, most people
හොඳ අය	good people
මේ අය	these people
සමහර අය	some people
සේරම අය	everybody

Other Nouns:

Plural only:

ගං උළු	tiles made in villages
රට උළු	tiles made in factories
පිදුරු	straw
හුනු	lime, plaster
කොස්	jak (wood or fruit)

2. NEW VERBS

Class 1:

කපරාරු කරනවා	'plaster'
සෙවිලි කරනවා	'thatch'
පුච්චනවා	'burn, fire, bake'

Irregular:

පවතිනවා	'last'; past පැවතුනා ; past participle පැවතිලා
මතුවෙනවා	'appear, surface'; past මතුඋනා ; past participle මතුවෙලා

3. 'BUILT OF BRICK'

The singular forms of the nouns ගඩොල , කලු ගල , කබුක් ගල refer to single units, i.e., 'the brick', 'the piece of black granite', the piece of kabuk. The plural forms ගඩොල් , කලු ගල් , කබුක් ගල් , are used in referring to a number of such units, or to the substance rather tnan the unit. Thus ගඩොල් may be either 'bricks':

ගඩොල් එතෙන්ට දාන්න!	Put the bricks there!

or 'brick':

බිත්ති බඳින්න ගඩොල් හොඳයි.	Brick is good for building walls.

In saying that something is made of that substance, however, the instrumental case of either the singular or the plural may be used with no difference in meaning:

මෙහේ ගෙවල් හදන්නෙ ගඩොල්වලින්. මෙහේ ගෙවල් හදන්නෙ ගඩොලෙන්.	Here houses are built of brick.
බිත්ති බඳින්නෙ කලුගල්වලින්. බිත්ති බඳින්නෙ කලුගලෙන්.	The walls are built of black granite.

4. 'AS WELL AS'

One means of expressing 'as well as' in Sinhalese is to add -ත් (or -උත් to a form ending in a consonant) to each of the two things being compared. If there is only one verb involved it must be repeated:

ගඩොලෙනුත් බඳිනවා, කලුගලෙනුත් බඳිනවා.	(They) build (them) of bricks as well as of black granite.
මම කඩේටත් යනවා, වැඩත් කරනවා.	I go to the shop as well as work.
මහත්තයාටත් යන්න තියෙනවා, නෝනාටත් යන්න තියෙනවා.	The master, as well as the mistress, has to go.
මහත්තයාටත් දෙන්න, මටත් දෙන්න.	Give it to the master as well as to me.

The -ත් (-උත්) is usually added to noun or pronoun forms, as in the preceding sentences. It may be added to some verb forms, but never to the simple form, either present or past:

කඩේට යන්නෙත් මම, වැඩ කරන්නෙත් මම.	It is I who go to the shop as well as work.
මහත්තයාට ලියන්නත් පුලුවනි, කියවන්නත් පුලුවනි.	The gentleman can write as well as read.

5. 'NOT ONLY . . . BUT'

Sinhalese can express 'not only . . . but' or 'not just . . . but . . . too' by adding විතරක් නෙවි to the first and -ත් (-උත්) to the second of the items in question. විතරක් නෙවි and -ත් are used in the same positions as . . .ත් . . .ත් in the 'as well as' construction, but while the same verb must be repeated in the 'as well as' construction, it is not repeated in the 'not only . . but' construction. Compare:

ගඩොලෙනුත් බඳිනවා, කලුගලෙනුත් බඳිනවා.	(They) build (them) of brick as well as of black granite.
ගඩොලෙන් විතරක් නෙවි, කලුගලෙනුත් බඳිනවා.	(They) build (them) not only of brick, but of black granite, too.

Further examples of this construction are:

කොන්ක්‍රීට් විතරක් නෙවී, යකඩත් ඕන කරනවා, නේ ද?	Not only concrete, but steel becomes necessary, doesn't it?
එලෝලු විතරක් නෙවී, පලතුරුත් ගන්න.	Don't just get vegetables, but fruit, too.

Again, the -ත් (-උත්) can be added to verb forms, but never to the simple form:

මට කාර් එක එලවන්න විතරක් නෙවි, වත්තෙ වැඩ කරන්නත් පුලුවනි.	I cannot only drive the car, but work on the estate, too.
නෝනා කඩේට යනවා විතරක් නෙවි, බඩුත් ගන්නවා.	The mistress is not only going to the shop, but buying goods, too.

Note that in the last example, -ත් is added to the object of the verb, since it cannot be added to the simple verb, and there is no other verb present.

6. 'MIGHT'

By changing the verb of a simple sentence to the infinitive and adding ඉඩ තියෙනවා , a sentence may be obtained which is the equivalent of one in English with 'might':

මම ගෙදර යනවා.	I am going home.
මම ගෙදර යන්න ඉඩ තියෙනවා.	I might (It might happen that I) go home.
අත්තිවාරම ගලෙන් බැන්දෙ නැත්තං වේයො බීත්ති දිගේ මතුවෙනවා.	If you don't build the foundation of stone, the white ants come to the surface along the wall.
අත්තිවාරම ගලෙන් බැන්දෙ නැත්තං වේයො බීත්ති දිගේ මතුවෙන්න ඉඩ තියෙනවා.	If you don't build the foundation of stone, the white ants might come to the surface along the wall.

7. SUPERLATIVES

In Lesson 23, the superlative of adjectives was given as ඉතා ම plus the adjective. Thus ඉතා ම හොඳ 'best', ඉතා ම ලොකු 'biggest'. An alternative way of forming the superlative is to add ම to the adjective, thus:

හොඳ ම පොත	the best book
ලොකු ම කඩේ	the biggest shop
දුප්පත් ම ගෙවල්	the poorest houses

8. AGE

In stating age, the Sinhalese construction is literally 'to me are twenty years', for the English 'I am twenty years old':

මට අවුරුදු විස්සයි.	I am twenty years old.
මගේ පුතාට අවුරුදු තුනයි.	My son is three years old.
මේ ගෙට අවුරුදු සීයයි.	This house is a hundred years old.
මේ ලමයාට අවුරුදු තුනයි මාස දෙකයි.	This boy is three years and two months old.

A similar construction with the time in the indefinite form and with the verb වෙනවා implies that something is older than expected:

මට දැන් අවුරුදු විස්සක් වෙනවා.	I am (already) twenty years old.
මේ ගෙට දැන් අවුරුදු සීයක් විතර වෙනවා.	The house is (already) about a hundred years old.
මගේ පුතාට අදට අවුරුදු තුනක් වෙනවා.	My son is three years old today!

9. 'UP' AND 'DOWN'

9.1 ඉහල 'up' and පහල 'down' inflect like singular Class 3 nouns. In the dative case they take on the meaning 'upwards', 'downwards':

එතනින් ඉහලට ගඩොල්.	From there upwards (they are) brick.

ඉහලට යන්න.	Go upwards.
මෙතනින් පහලට පාරක් හදන්න.	From here downwards, make a road.
පහලට එන්න.	Come down!

9.2 The forms පහල and ඉහල may be used as postpositions with the meanings 'below' and 'above' respectively. In this usage they may occur in their instrumental forms පහලින් , ඉහලින් with no change in meaning. A dependent noun or pronoun is in either the dative case or the instrumental, except that if the postposition is in the instrumental, the dependent noun may not also be in the instrumental:

වත්තට පහල ගමක් තියෙනවා. වත්තෙන් පහල ගමක් තියෙනවා. වත්තට පහලින් ගමක් තියෙනවා.	Below the estate there is a village.
ගල්වලට ඉහල ගඩොල් තියෙනවා. ගල්වලින් ඉහල ගඩොල් තියෙනවා. ගල්වලට ඉහලින් ගඩොල් තියෙනවා.	Above the rocks there are bricks.

If the sentence requires the postposition to be in the dative case, however, (as when motion toward some point is involved) the dependent noun is in the instrumental case:

වත්තෙන් පහලට යන්න.	Go (to a point) below the estate.
මේ ගෙයින් ඉහලට වැටක් බඳින්න.	Build a fence (to some point) above the house.

10. අඩු 'LACKING'

අඩු 'lacking, scarce' belongs to the same set as වැඩි 'too much', ඇති 'enough', මදි 'not enough', and occurs in the same types of constructions. It takes the assertion marker in simple sentences. With verbs, it commonly means '(is) scarce, rare', and otherwise may mean either 'rare' or 'short of, lacking'.

ඒ පලාත්වල ලීවලින් ගෙවල් හදනවා අඩුයි.	In those areas, building houses of wood is rare.
මට පොත් අඩුයි.	I am short of books.
මෙහේ සොල්දර ගෙවල් අඩුයි, නේ ද?	Here two-story houses are rare, aren't they?
ගම්බද සොල්දර ගෙවල් හදනවා අඩු වියදම වැඩි නිසායි.	In village areas, two-story houses are rare because it's too expensive.
මට අඩු පොත් ගන්න වත් බෑ.	I can't even buy the books I lack.

11. 'TO ROOF, THATCH'

හෙවිලි කරනවා 'to roof, thatch' may take as direct object the material with which something is roofed, and that to which the roof is applied is then in the genitive case:

මම මගේ අලුත් ගෙයි රට උලු හෙවිලි කරනවා.	I am going to roof my new house with imported tiles.

When the material is not expressed, the place to which the roof is applied will be the direct object:

මහත්තයාට ඒ වැඩපල හෙවිලි කරන්න ඕන ද?	Do you want to roof that workshop today?

Exercises

A. Substitute orally:

1. මම ගන්නෙ ....
   - the best books
   - the best cigarettes in that shop
   - the biggest cars
   - the smallest car that Banda can drive
   - the strongest cigars
   - the biggest estate
   - the most beautiful picture
   - the oldest house in the village

2. .... පාරක් නැද්ද?

below the estate
beyond the estate
this side of the estate
above the estate
near the estate
in the middle of the estate
to the estate
from the estate
to the other estate
below the other estate
between these two estates
near these two estates
above the other estate

3. මහත්තයා .... අර පලතුරුත් ගත්තා.

not only vegetables
not only bananas
not only cigarettes
not only tea
not only tea and coffee
not only these things

4. නෝනා .... පොතුත් කියවනවා.

not only teaches
not only prepares food
not only drives her car
not only dances
not only writes letters

B. Say in Sinhalese:

1. I go to the shop as well as prepare the food.
2. So I don't have enough time to read for the exam.
3. I have to read many books.
4. Most of the books are very hard.
5. This is the most difficult book.
6. I have to learn this one today, too.
7. I read it five times.
8. But still I don't understand it.
9. Who can understand it?

10. Here houses are built out of stone as well as bricks.
11. Houses built out of bricks are big.
12. Poor people have no money.
13. So they build houses out of wattle and daub.
14. Houses built out of wattle and daub are very small.

15. Are there many two-story houses in your village?
16. Here there are only five two-story houses.
17. The majority of the people in this village are poor.
18. So they have no money to build two-story houses.
19. They have to spend money on building the foundations.
20. The foundations must be built of stone.
21. If they are not built of stone, white ants might come to the surface.

22. Do you know how to plaster walls?
23. I know how to make wattle and daub walls, but I don't know how to plaster them.
24. People in rural areas don't plaster their walls too much.
25. Only brick walls are plastered.
26. It seems they build houses out of wood in America.
27. Is that true?
28. Yes. Most of the houses are made of wood.
29. Brick walls are rare.
30. We have no trouble with white ants.

LESSON 27

Conversation: Visit to a Buddhist Temple

John visits a Buddhist temple with Gunapala, who acts as his guide.

GUNAPALA

වැඳුම් පිදුම්	offerings
තුන් පලක්	three places
විහාර ගේ	Shrine House
හැම පන්සලක ම වැඳුම් පිදුම් කරන්න තුන් පලක් තියෙනවා.	Every temple has three places for making offerings.
දාගැබයි, බෝදියයි, විහාර ගේයි.	The Stupa, Bodhi tree,and Shrine House.
අර තියෙන්නෙ දාගැබ.	Over there is the Stupa.
අනිත්	the other
බෝදිය අනිත් පැත්තෙ.	The Bodhi tree is on the other side.
මේ පන්සලේ විහාර ගේ බොහොම ලස්සනයි.	The Shrine House of this temple is very pretty.

JOHN

පුස්තකාලෙ	the library
මේ පන්සලේ හොඳ පුස්තකාලයක් නැද්ද?	Isn't there a good library in this temple?

GUNAPALA

එහායින්	over there
පොත්ගුල	the temple library

ඔව්. තියෙනවා.	Yes, there is.
was taken over by us
was taken into his charge
was taken under that department
was taken over by my uncle

5. මට .... සල්ලි නෑ.

as much as to go to Colombo
as much as to go to see a dance
as much as to eat in a good hotel
as much as to pay the watchman
as much as to stay at the rest house
as much as to visit ancient holy places
as much as to study Sinhalese
as much as to build a new house

6. .... මහත්තයා ගෙදර නැවතුනා.

because (he) had to do a job
because (his) father came home
when (he) had to enter the hospital
after his uncle came to the estate
when the watchman began to work
when I had to go to work

B. Transform into 'has to' constructions, according to the model:

මම වැඩ කරනවා.....මට වැඩ කරන්න වෙනවා.

1. මහත්තයා කොළඹ යාවි.
2. උන්නැහේ නවතීවි ද?
3. බාප්පා කඩේ ලඟ උන්නා.
4. ලොකු මහත්තයා ඉස්පිරිතාලෙට ඇතුල් උනා.
5. මීස්ට ගුනසේකර වත්තක් ගත්තා ලු.
6. ලොකු මහත්තයා ඊයෙ කොළඹ උන්නා.
7. ඒ ළමයා දවල් දොළහ වෙන කං මෙතන නැවතුනා.

C. Transform into emphatic sentences, emphasizing any suitable item:

1. උන්නැහේ කන්තෝරුවෙදි හම්බවෙන එක වැඩියෙ හොඳයි.
2. හඳ පාලොස්සක දාට හුඟක් ලස්සනයි.
3. මාතලේ පුරුට්ටු හුඟක් සැරයි.
4. මේවායින් ලංකාවෙ එලෝලු වැඩියෙ හොඳයි.
5. ඒ මහත්තයා රස්සාවකට යනවා ඇති.
6. මේ දොස්තර පුද්ගලිව වැඩ කරනවා ද?

C. Say in Sinhalese:

1. You mustn't go to the hospital.
2. If you go to the hospital, you'll have to waste a lot of time.
3. These days the doctor is at home.
4. So you can see him if you go there at about 12 o'clock.
5. Yes. I must see a doctor soon.
6. My body is aching all over.
7. Perhaps I might have to stay in the hospital.
8. That doesn't matter.
9. Do as the doctor says.

10. How much do you want to send a letter to England?
11. I think you need about fifty cents.
12. Then you go to the office and bring me a stamp.
13. I don't have any money now.
14. I'll pay you later.
15. If there aren't any stamps in the office you can bring one tomorrow when you come, can't you?
16. Tomorrow I am supposed to go to Jaffna.
17. Is that so?
18. Then I might have to go, too, eh?

LESSON 30

Conversation: Visiting a Friend

Gunapala drops in to see his old friends the Pereras.

PERERA

එන්න, එන්න. වාඩිවෙන්න.	Come, come. Sit down.

GUNAPALA

හා	ah
නැතුව ඇතියි කියලා	that (you) might not be
බයෙන් බයෙන්	worriedly, in fear
හා, ගෙදර ඉන්නවා, නේ ද?	Oh, you are home.
අද ගෙදර නැතුව ඇතියි කියලා හිතාගන මම ආවෙ බයෙන් බයෙන්.	I came in fear that you wouldn't be home today.

PERERA

මම මේ දවස්වල කොහේවත් යන්නෙ නෑ.	These days I don't go anywhere.
අස්වෙනවා	leave, vacate
කන්තෝරුවෙන් අස්උනාට පස්සෙ මම ගෙදර ම තමයි.	Since leaving the office I'm always at home.
ගිහින් එන්න යනවා	go to visit
ඉඳලා හිටලා සාප්පුවට ගිහින් එන්න යනවා.	Occasionally I visit the shop.
බෑනා	the son-in-law, nephew
බාර දෙනවා	hand over
සාප්පුවෙ වැඩත් සේරම අපේ බෑනාට බාර දුන්නා.	I have even handed over the work of the shop to my son-in-law.

දුවයි බැනායි දෙන්නා දැන් කොළඹ.	My daughter and son-in-law are in Colombo now.

GUNAPALA

එහෙනම් ඒ ගොල්ල දැන් මේ පැත්තෙ එන්නෙම නැතුව ඇති, නේ ද?	Then I suppose that they don't come here at all, eh?

PERERA

ඇවිත් යන්න එනවා.	They come to visit us.
නිතර නිතර	often, frequently
නමුත් නිතර නිතර එන්නෙ නෑ.	But not frequently.
ඉස්පාසුව	the rest, peace
ඒ ළමයාට දැන් ඉස්පාසුවක් නෑ.	That boy has no rest now.
සාප්පුවෙ හරියට වැඩ.	There is really work in the shop.

GUNAPALA

බිස්නස් එක	the business
බිස්නස් හොඳ ද මේ දවස්වල?	Is business good these days?

PERERA

තොග වෙළඳාම	the wholesale trade
හොඳයි. අපි දැන් තොග වෙළඳාමක් පටන් අරන් තියෙනවා.	Yes. We have started a wholesale business now.
ඒකයි එයාට දැන් හුඟක් කරදර.	That's why he has so much to do now.
සිල්ලර වෙළඳාම	the retail trade
ලාබෙ	the profit
සිල්ලර වෙළඳාමෙන් වැඩි ලාබයක් නෑ.	There isn't much of a profit from retail trade.

කොහොම ද දැන් ඒ පලාතෙ තොරතුරු?	How are things in your area now?

GUNAPALA

අමුතු	new, strange
එහේ අමුතු දෙයක් නෑ.	There's nothing new there.
මම ගංසබා චන්දෙට ඉදිරිපත් උනා.	I came forward for Village Council elections.
හරි යනවා	go well
නමුත් හරි ගියේ නෑ.	But it didn't turn out so well.

PERERA

ඔව්. ඕවා ඔහොම තමයි.	Yes. Those things are like that.
සමාජ වැඩ	the public service
කම්මැලි	lazy, disinclined
මම නම් සමාජ වැඩවලට බහින්න කම්මැලියි.	I, of course, don't like entering public service.
අමුත්තා	visitor, stranger
සීතා, සීතා, මෙන්න අමුත්තෙක් ඇවිල්ලා.	Sita, Sita, we have a visitor.

SITA

ඕ, ආය්බෝ!	Oh, hello.
මදැයි දැකපු කල්!	It's been a long time, hasn't it?
බබා	the baby
කොහොම ද දැන් බබාලා?	How are the children now?
එක්ක එනවා	bring along
මේ පැත්තෙ එන කොට නෝනාත් එක්ක එන්න නරක ද?	Would it be bad to bring your wife along when you come this way?

එයාට මේ පැත්ත එපා වෙලා වෙන්න ඇති.	Maybe she is tired of this place?

GUNAPALA

එයාට එන්න විදියක් නැ.	She has no way of coming.
හාදයා	the fellow
පොඩි හාදයා දැන් මාසයක් විතර අසනීපෙන්.	The little fellow has been ill for about a month now.
ලොකු දෙන්නා ඉස්කෝලෙ යනවා.	The two big ones are going to school.
ගෑනි	the woman
උන්නු	=උන්න
ගෙදර වැඩට උන්නු ගෑනි ගිහිල්ලා දැන් ගෙදර සේරම වැඩ කරන්නෙ එයා.	With the woman who worked at home gone, she does all the work in the house herself.

SITA

වැඩකාරයා	the servant
සොයාගන්නවා	find (for oneself)
වැඩකාරයෙක් සොයාගන්න අමාරු ද?	Is it difficult to find oneself a servant?

GUNAPALA

සොයනවා	look for, search
ඔව්. සෙව්වා, සෙව්වා. හොඳ කවුරුවත් සොයාගන්න බැරි උනා.	Yes. I looked and looked. I couldn't find anyone good.

SITA

කුස්සි අම්මා	the (female) cook
අපට කිව්වා නම් කුස්සි අම්මා කෙනෙක් සොයා දෙන්න තිඋනා, නේ.	If you had told us we could have found a cook for you.

කුස්සිය	the kitchen
කුස්සියෙ වැඩට කවුරුවත් උන්නාම ඇති, නේ?	It would be enough if you had someone to work in the kitchen, wouldn't it?
හිටිනවා	be (animate)
හිටියා	there was
බොහොම හොඳ ගෑනියෙක් හිටියා.	There was a very good woman.
නමුත් මේ ගිය සුමානෙ තැනකට බාරදුන්නා.	But last week we handed her over to someone (literally: 'to a place').

GUNAPALA

ශග්	Ah, heck
ශග්. දැනගත්තා නම් මම ඇවිත් එක්ක යනවා.	Ah! If I had known I would have come and taken her.
ගෙදර දැන් හරියට වැඩ.	There's really work at home now.

PERERA

සීතා, අපි මොකුත් බොමු, නේ ද?	Sita, shall we drink something?

SITA

ලෑස්ති කරනවා	to get ready
නෑ. නෑ. කෑම ලෑස්ති කරනවා.	No. I am getting the meal ready.
දැන් තේ බිව්වොත් කෑම කන්න බැරි වෙනවා.	If you drink tea now, you won't be able to eat.
පහු වෙනවා	be past (of time), fall behind

දැන් දොලහත් පහු වෙලා, නේ?	Now it's after 12 already, isn't it?
කෑම කමු.	Let's eat.

GUNAPALA

මටත් එක්ක	for me as well
මටත් එක්ක කෑම හැදුවෙ නෑ, නේ?	You didn't prepare food for me, too, did you?

SITA

ඕ, කෑම තියෙනවා.	Oh, there's food.
දවල්ට	for lunch
කවදාත්	every day
කවදාත් දවල්ට අමුත්තෙක් දෙන්නෙක් ඉන්නවා	Every day we get a visitor or two for lunch.
මාලුව	the fish curry
අච්චාරුව	the pickle
අද හොඳ මාලුවකුයි අච්චාරුවකුයි තියෙනවා.	Today we have a good fish curry and a pickle.

PERERA

හය මාසෙකින් විතර පස්සෙ ඇවිත් කෑම ටිකක් නොකා පුලුවන් ද?	Now that you have come after about six months, can you go without eating a little something?

GUNAPALA

බල කරනවා	force
හොඳයි. ඉතින් බල කරනවා නම් කමු.	Well, if you force me, let's eat.
අච්චාරුක් තියෙනවා නම් නොකා බෑ.	If there's pickle I must eat some.

Grammar

1. NEW NOUNS

Class 1

බිස්නස් එක	'the business'

Class 2

අච්චාරුව	'the pickle'; gen. අච්චාරුවෙ ; pl. අච්චාරු
ඉස්පාසුව	'the rest, peace'; gen. ඉස්පාසුවෙ ; pl. ඉස්පාසු
කුස්සිය	'the kitchen'; gen. කුස්සියෙ ; pl. කුස්සි
තොග වෙළඳාම	'the wholesale trade; gen. තොග වෙළඳාමෙ ; pl. තොග වෙළඳාම්
මාලුව	'the fish curry'; gen. මාලුවෙ ; pl. මාලු

Note: In some areas මාලුව means simply 'curry'; not necessarily fish.

සිල්ලර වෙළඳාම	'the retail trade'; gen. සිල්ලර වෙළඳාමෙ; pl. සිල්ලර වෙළඳාම්

Class 4

ලාබෙ	'the profit'; pl. ලාබ
සමාජ වැඩේ	'the social work'; pl. සමාජ වැඩ

Class 5

අමුත්තා	'the visitor, stranger'; pl. අමුත්තො
කුස්සි අම්මා	'the female cook'; indef. කුස්සි අම්මා කෙනෙක් pl. කුස්සි අම්මාලා
බබා	'the baby, child'; pl. බබාලා
බැනා	'the nephew, son-in-law'; indef. බැනා කෙනෙක් pl. බැනාලා
ගැනි	'the woman'; pl. ගැනු
වැඩකාරයා	'the servant'; pl. වැඩකාරයො
හාදයා	'the fellow'; pl. හාදයො

2. NEW VERBS

Class 1

බල කරනවා	'force'
ලෑස්ති කරනවා	'make ready, prepare
සොයනවා	(or හොයනවා) 'look for, search'

Irregular

හිටිනවා	'be' (animate = ඉන්නවා); past හිටියා ; ppl. හිටලා
එක්ක එනවා	'bring (a person)'; past එක්ක ආවා
බාර දෙනවා	'hand over'; past බාර දුන්නා

3 IDIOMS

නිතර	'frequently'
ඉඳලා හිටලා	'now and then'
බයෙන් බයෙන්	'worriedly, in fear'
ඉස්පාසුවක් නෑ	(with dative case subject) 'doesn't get a minute's peace'
අමුතු දෙයක්	'something new'

Note: අමුතු is also used with 'news': අමුතු තොරතුරු

මදැයි දැකපු කල්	'Hasn't it been a long time!'
ගිහින් එන්න යනවා	'go to visit'
ඇවිත් යන්න එනවා	'come to visit'

4. හා

The vowel in හා is pronounced with nasalization. හා may be used like English 'oh' or ah' as an expression of surprise:

හා, ගෙදර ඉන්නවා, නේ ද?	Ah, you are home, aren't you!

හා is also an equivalent of English 'yes' or 'all right', in response to commands or requests, and is the common way of answering them affirmatively. It is not used as an affirmative answer to questions, which are answered with ඔව් , with or without repetition of the verb (or item like පුළුවන් , ඕන) of the question. Compare the following:

බංඩා, මෙහ්ට එන්න.	Banda, come here.
හා, මහත්තයා.	Yes, sir.
බංඩා කොලඹ යනවා ද?	Are you going to Colombo, Banda?
ඔව්. මහත්තයා (යනවා).	Yes, I am (going), sir.
බංඩාට කාර් එලවන්න පුළුවන්, නේ ද?	You can drive a car, can't you, Banda?
ඔව්. මහත්තයා (පුළුවනි).	Yes, sir (I can).

5. බෑ, පුළුවන් WITH PAST PARTICIPLE

The form බෑ may be used with a dependent past participle either in the negative or positive form. In this construction, the negative participle plus බෑ means 'must' and the positive participle with බෑ means 'mustn't':

නොකා බෑ.	(You) must eat.
කාලා බෑ.	(You) mustn't eat.

In questions a similar construction occurs with පුළුවන් , again with the negative participle plus පුළුවන් meaning 'must' and the positive participle plus පුළුවන් meaning 'mustn't. The question form serves as an emphatic type of statement rather than a question. Compare English 'How can I drink tea?' meaning 'I certainly can't drink tea.'

තේ බීලා පුළුවන් ද?	(I) mustn't drink tea, how can I drink tea?
තේ නොබී පුළුවන් ද?	(I) must drink tea, how can (I) not drink tea?

6. 'ILL'

'Someone is ill' may be expressed in Sinhalese in either of two ways: with the adjective අසනීප as predicate and the dative case of the person who is ill as subject, or with the instrumental case of the noun අසනීපෙ as predicate and a direct case subject. There is no difference in meaning:

මහත්තයාට අසනීපයි. මහත්තයා අසනීපෙන්.	The master is sick.
පොඩි හාදයාට දැන් මාසයක් විතර අසනීපයි. පොඩි හාදයා දැන් මාසයක් විතර අසනීපෙන්.	The little fellow has been sick for about a month now.

The same can be done with the adjective සනීප 'healthy, well' and the noun සනීපෙ 'good health':

පුතාට දැන් සනීපයි. පුතා දැන් සනීපෙන්.	(My) son is well now.

7. කම්මැලි

The form කම්මැලි 'not to like, not to feel like' is used with the assertion marker in simple sentences:

7.1 When කම්මැලි is used with a dative subject it has the meaning 'not to feel like (temporarily)' or 'to be too lazy to'. It may be used with or without a dependent infinitive:

මට කම්මැලියි.	I don't feel like doing anything.
මට කොහේවත් යන්න කම්මැලියි.	I'm too lazy to go anywhere.

7.2 When කම්මැලි is used with a subject in the direct case it means 'not to like' or 'to dislike'. In this construction it may have either a dependent infinitive or a dependent noun in the dative case as object:

මහත්තයා ඒ කඩේට යන්න කම්මැලියි.	The master doesn't like to go to that shop.
මම නම් සමාජ වැඩවලට කම්මැලියි.	As for me, I'm not interested in public service.

7.3 As a predicate adjective, or adjective preceding a noun, කම්මැලි means 'lazy'.

ඒ රස්තියාදුකාරයා බොහොම කම්මැලියි.	That loafer is very lazy!
අයිසෙ, තමුසෙ හරි කම්මැලි මිනිහෙක්.	Friend, you are a real lazy fellow!

7.4 Note that the constructions in which කම්මැලි occurs are like those in which ආසා does (4, 8) and that කම්මැලි is in a sense the opposite of ආසා :

මට කොලඹ යන්ඩ ආසායි.	I feel like going to Colombo.
මට කොලඹ යන්ඩ කම්මැලියි.	I don't feel like going to Colombo.
මම කොලඹ යන්ඩ ආසායි.	I like going to Colombo.
මම කොලඹ යන්ඩ කම්මැලියි.	I don't like going to Colombo.

8. PAST TENSE VERBAL ADJECTIVE

In Lesson 28 the formation of the past tense verbal adjective was given. For example:

	Verb	Past Tense Verbal Adjective
Class 1	බලනවා	බැලුව
Class 2	අදිනවා	ඇද්ද
Class 3	තේරෙනවා	තේරුන

Class 1 and 3 verbal adjectives have alternate forms as follows. Class 2 verbal adjectives do not have alternate forms.

Class 1. Instead of ending in -ə, the past tense verbal adjective may end in -u or -ū. If the stem has two syllables and the first syllable is short as in කපනවා , බලනවා , the ending will be ū. Otherwise it is u:

Verb	Past Tense Verbal Adjective		
බලනවා	බැලුව	or	බැලූ
කපනවා	කැපුව	or	කැපූ
නවත්තනවා	නැවැත්තුව	or	නැවැත්තු

Class 3. Instead of ending in න , the verbal adjective may end in නු :

තේරෙනවා	තේරුන	or	තේරුනු
වැටෙනවා	වැටුන	or	වැටුනු

Irregular Verbs: Some irregular verbs have alternate forms ending in -u instead of -ə. Those that have occurred so far are:

ඉන්නවා	උන්න	or	උන්නු
ගන්නවා	ගත්ත	or	ගත්තු
ගෙවදිනවා	ගෙවදුන	or	ගෙවදුනු
තියෙනවා	තිඋන	or	තිඋනු
දෙනවා	දුන්න	or	දුන්නු
නවතිනවා	නැවතුන	or	නැවතුනු
පේනවා	පෙනුන	or	පෙනුනු
වෙනවා	උන	or	උනු

9. PAST PARTICIPLE

A past participle, when used in a subordinate clause, may have as subject either the subject of the main verb or a different subject. In the latter construction, the subject of the past participle is in the case required by the verb that is used as past participle:

මහත්තයා ගිහිල්ලා මට මොකුත් කරන්න බැරි උනා.	With the master gone, I couldn't do a thing.
ගෙදර වැඩට උන්නු ගැනි ගිහිල්ලා දැන් ගෙදර සේරම වැඩ කරන්නෙ එයා.	With the woman who did the housework gone, she does all the work in the house herself.
බංඩාට සල්ලි හම්බ වෙලා මිනිහා අද කොළඹ ගියා.	Having gotten his money, Banda went to Colombo today.

10. 'TAKE, BRING'

The verbs එක්ක යනවා 'take along' and එක්ක එනවා 'bring along' (21, 12) are used only with a person as object, and the object is in the direct case:

මම පුතා එක්ක එන්න කොළඹට යනවා.	I'm going to Colombo to bring (my) son (home).
සීගිරියට යන කොට නෝනා එක්ක යනවා.	When I go to Sigiriya, I'm taking my wife.

The verbs අරන් යනවා 'take' and අරන් එනවා 'bring' are used with animals or things as direct object and are alternatives to the verbs ගෙනියනවා 'take' and ගේනවා 'bring'. All of these also take objects in the direct case:

මම හෙට පොතක් ගේන්නම්. මම හෙට පොතක් අරන් එන්නම්.	I'll bring a book tomorrow.
මම හෙට පොතක් ගෙනියන්නම්. මම හෙට පොතක් අරන් යන්නම්.	I'll take a book tomorrow.

11. එක්ක

The postposition එක්ක may be used with a noun or pronoun in the dative case meaning 'also for'. It may be used either with or without -ත් added to the dependent noun or pronoun (compare the use of එක්ක with a noun or pronoun in the direct case meaning 'with' (11, 5):

මට එක්ක කෑම හදන්න. මටත් එක්ක කෑම හදන්න.	Prepare food for me, too.
මහත්තයා මටත් එක්ක බඩු ගත්තා ද?	Did he buy goods for me, too?
මම දූවටත් එක්ක ඇඳුම් ගන්න ඕන.	I must buy clothes for the daughter as well.

12. ම

The emphatic particle ම may be used in sentences with the negative නෑ , or with එපා as the negative of an imperative, equating with the English 'not at all':

මහත්තයා යන්නෙ ම නෑ.	He doesn't go at all.
ඔහේ යන්න ම එපා.	You don't go at all.
උන්නැහේ වැඩක් කරන්නෙ ම නෑ.	He doesn't do any work at all.

13. අපේ

The form අපේ , which usually equates with English 'our', is sometimes used in Sinhalese where English uses 'my'. It is very common when speaking of relations or family property:

අපේ පුතාට ටිකක් අසනීපයි.	My son is a little sick.
අපේ වත්ත දැක්කා ද?	Did you see my estate?

14. හිටිනවා

The verb හිටිනවා 'to be' (animate) will replace the verb ඉන්නවා (but not තියෙනවා) in some constructions. Since the verb ඉන්නවා may be used wherever හිටිනවා may be, the student should avoid හිටිනවා but be prepared to recognize it when it occurs:

උන්නැහේට දුවෙක් හිටියා, නේ ද? උන්නැහේට දුවෙක් උන්නා, නේ ද?	He had a daughter, didn't he?
මේ කඩේ හිටිය ළමයා කෝ? මේ කඩේ උන්න ළමයා කෝ?	Where is the boy who was in this shop?

15. SIMPLE PAST

There are a small number of Class 2 verbs which, instead of forming the simple past and the past tense verbal adjective by doubling the final consonant of the stem, form it by adding -y- to the stem, with the usual vowel change where possible. Of these, two are worth nothing:

Verb		Simple Past	Past Tense Verbal Adjective
හිටිනවා	'to be'	හිටියා	හිටිය
අරිනවා	'to open, send'	ඇරියා	ඇරිය

The past participles of these are like other Class 2 verbs: හිටලා, ඇරලා.

Exercises

A. Substitute orally:

1. අපේ මාමා ....

   might stay in the office
   might not go
   might go for a walk
   might not be in the garage
   is in the garage
   might not go anywhere
   must be going to the shop
   might start a wholesale trade

2. අපි දැන් ....

   have started a business
   have started the vacation
   have started a shop
   have entered public service
   have found a servant
   have started work in the estate
   have prepared food
   have made a pickle

3. ළමයාට .... බැ.

   must eat food
   mustn't eat food
   mustn't go home
   must see the picture
   mustn't drink food
   mustn't go to the shop
   mustn't go to their house
   must come frequently

4. .... මට දෙන්න.

   the book you bought
   the pickles you ate
   the money you got
   the food you prepared
   the fruit that fell yesterday
   the book you understood

5 .... මට එන්න විදියක් නෑ.

with the master gone
with my wife gone shopping
with my children gone to school
with my driver gone to the hospital
with my servant gone
with his office given over to me

6. කොලඹ යන කොට ....

I'll take my wife
I'll take my cattle
I'll take my books
I'll take my two sons
I'll take the little fellow
I'll take my watchman
I'll take some vegetables
I'll take the money

7. ඒ දරුවා ....
doesn't work at all
doesn't read books at all
doesn't go to school at all
doesn't eat at all
doesn't smoke at all
doesn't write (letters) to me at all
doesn't prepare food at all

B. Transform into negative, according to the model:

මට කෑම කාලා බෑ.....මට කෑම නොකා බෑ.

1. උන්නැහේට වැඩ කරලා බෑ.
2. පුතාට ඉස්කෝලෙ ගිහිල්ලා බෑ.
3. ලමයාට පොල් කඩලා පුලුවන් ද?
4. මුල් ගුරුවරයාට ඉස්කෝලෙ නැවතිලා පුලුවන් ද?
5. බෑනාට සාප්පුවෙ වැඩ බාර දීලා බෑ.
6. මිස්ට පෙරේරාට වත්ත විකුනලා පුලුවන් ද?
7. මට හවසට ඇවිදින්න පුලුවන් ද?

C. Transform into 'feel like' sentences, according to the model:

මම වැඩ කරන්න ආසායි.....මට වැඩ කරන්න ආසායි.

1. උන්නැහේ වැඩ කරන්න ආසා ලු.
2. මුරකාරයා වත්ත බලන්න ආසා ලු.
3. ළමයා කඩේට යන්න ආසායි කිව්වා.
4. දරුවා ඉස්කෝලෙ යන්න කම්මැලියි කිව්වා.
5. මම පොත් ලියන්න කම්මැලියි.
6. මම කාර් එක පාරෙ නවත්තන්න කම්මැලියි.
7. මෙහේ මිනිස්සු නරක නිසා මම මේ පැත්තෙ වැඩ කරන්න කම්මැලියි.

D. Say in Sinhalese:

1. The master doesn't come to eat at all.
2. Therefore generally I don't prepare food for him.
3. I prepare something for myself.
4. I go to a restaurant for lunch.
5. I think the master must eat with his friends in the office.
6. Mr. Perera works in the same office, too.
7. Mr. Perera doesn't take his car these days. He goes with our master.
8. When the master goes to work the little fellow goes to the adjoining house to play.
9. Because my son is sick I'm mostly at home.
10. If the son is ill, I don't feel like going anywhere.

11. It's been a long time!
12. Where were you all these days?
13. Because of the election I'm going from house to house in order to ask for votes.
14. Do you think you will be able to win?
15. I think so. But this is a very bothersome job.
16. I have no peace at all.
17. That's not something new.
18. Everybody who came forward for elections goes from house to house worriedly.
19. One must go like that. Otherwise one can't get any votes.

LESSON 31

Conversation: An Automobile Accident

Gunapala goes to see Jinasena, but finds out from his wife Sita that he has been taken to the hospital after an automobile accident.

GUNAPALA

කෝ, ජිනසේන ගෙදර ද?	Is Jinasena at home?

SITA

ඉස්පිරිතාලෙ.	(He's) in the hospital.
හැන්දෑව	evening
ඇක්සිඩන්ට් එක	accident
ඊයෙ හැන්දෑවෙ ඇක්සිඩන්ට් එකක් වෙලා ඉස්පිරිතාලෙට යන්න උනා.	Yesterday evening he met with an accident, and had to go to the hospital.

GUNAPALA

කොහේදි ද?	Where?
හුඟක් අමාරු ද?	Is he very ill?

SITA

ඒ තරම් ම	that much
නෑ. ඒ තරම් ම අමාරු නෑ.	No. He isn't that ill.
ඊයෙ කොළඹ යන කොට.	(It happened) when he was going to Colombo yesterday.
හතට කාලක් තියා	at quarter to seven

ඊයෙ හවස හතට කාලක් තියා එයාට කොලඹ ඉන්න තිඋනා.	Yesterday he was supposed to be in Colombo at 6:45 p.m.
මෙහෙන් යන කොට පහට විතර ඇති.	It must have been about five when he left here.
හයියෙන්	fast
පරක්කු නිසා ටිකක් හයියෙන් ගිහිල්ලා තියෙනවා.	Because it was late, he went a little fast.

GUNAPALA

කවදත්	every day, generally
එයා කවදත් ටිකක් හයියෙන් එලවනවා, නේ ද?	He generally drives a little too fast, doesn't he?

SITA

ඒක හැබැව.	That's true.
පරිස්සමෙන්	carefully
ඒ උනත් එයා බොහොම පරිස්සමෙන් එලවනවා.	But he drives very carefully.
කලබලේ	the haste, hurry, confusion
ඊයෙ නම් යන්න ඇත්තෙ ටිකක් කලබලෙන්.	Yesterday, of course, he must have gone somewhat hurriedly.
පනහට විතර යන්න ඇති මං හිතන්නෙ.	I suppose he must have gone at about fifty.
කඩුගන්නාව	Kadugannawa
කන්ද	the hill
කන්ද බහිනවා	go down hill
වංගුව	the curve
ඉස්සරහින්	in front
හැපෙනවා	collide, smash
කඩුගන්නාව කන්ද බැහැලා වංගුව ගන්න කොට ඉස්සරහින් කාර් එකක් ඇවිල්ලා හැපුනා ලු.	It seems that when he was taking the curve after going down Kadugannawa hill, a car came and collided (with him).

GUNAPALA

තුවාල	injured
කොච්චර තුවාල ද?	How badly hurt (is he)?

SITA

ඒ තරම් තුවාල නෑ.	He isn't that much injured.
ඔලුව	head
පැලෙනවා	get split, cracked
ඔලුව පැලිලා තියෙනවා.	(His) head is injured.
අත	hand, arm
අතක් ටිකක් තුවාලයි.	An arm is a little injured.
සීරෙනවා	get scratched, bruised
ඇඟ කීප පලක් සීරිලා තියෙනවා.	(His) body is bruised in several places.
ටිකැට් කපනවා	discharge (from the hospital)
හෙට විතර ටිකැට් කපාවි.	He will be discharged from the hospital about tomorrow.

GUNAPALA

කාර් එකට හුඟක් තුවාල ද?	Is the car damaged much?

SITA

ගන්න දෙයක් නෑ	totally damaged
කාර් එකෙන් නම් ගන්න දෙයක් නෑ.	The car is completely damaged.
පොඩි වෙනවා	get crushed, smashed
ඉස්සරහ සේරම පොඩි වෙලා.	The front is completely smashed.
වීදුරුව	the glass
බිඳෙනවා	get broken
වීදුරු බිඳිලා.	The glass is broken.

තාමත්	still
තාමත් කාර් එක එතන.	Still the car is there.
	GUNAPALA
අනිත් කාර් එකටත් හුඟක් තුවාල ද දන්නෙ නෑ.	I wonder if the other car is also damaged very much.
	SITA
ඒකට නම් එච්චර තුවාල නෑ.	That is not so damaged.
ඒකෙ හිටපු මහත්තයාට නම් හුඟක් තුවාල වෙලා තියෙනවා.	The gentleman who was in it was seriously injured.
තැලෙනවා	get dented, banged
කාර් එකේ දොර තැලිලා තියෙනවා.	The door of the car has got dented.
එයා කොලඹ ගෙනිච්චා ලු.	It seems he was taken to Colombo.
වැඩි තුවාලයක් නැති නිසා මෙයා නුවර ගෙනැත් තියෙනවා.	Because he isn't too badly hurt, this one (i.e., Jinasena) has been brought to Kandy.
	GUNAPALA
වරද	the mistake, fault
කාගෙ ද වරද?	Whose mistake is it?
	SITA
කියන්න බෑ.	It is hard to say.
නඩු දානවා	file an action
පොලීසිය	the police
පොලීසියෙන් නඩු දාවි.	The police will file an action.
ආරංචි	heard
මට ආරංචියි වරද අනිත් මහත්තයාගෙයි කියලා.	I heard that the other man was at fault.

ඒත් බලන්න ඕන කොහොම ද කියලා.	But we must see how it is.

GUNAPALA

ඉන්ෂුවර් කරනවා	insure
කාර් එක ඉන්ෂුවර් කරලා, නේ?	The car is insured, isn't it?

SITA

දන්නනවා	inform
කොම්පැනිය	the company
ඔව්. මම ඉන්ෂුවර් කොම්පැනියට දැන්නුවා.	Yes. I informed the insurance company.

GUNAPALA

ටයර් එක	tire
බ්‍රේක් එක	brake
එහෙම	et cetera
ටයර්, බ්‍රේක් එහෙම හොඳයි, නේ?	Tires, brakes, etc., are good, aren't they?

SITA

ඔව්.	Yes.

GUNAPALA

මම ආවෙ ජිනසේන හම්බවෙන්න හිතාගන.	I came with the idea of seeing Jinasena.
ඉස්පිරිතාලෙ ලෙඩ්ඩු බලන්නෙ කීයට ද?	At what time are the patients visited in the hospital?

SITA

ඕන වෙලාවක බලන්න පුලුවනි.	You can visit any time.
එයා ඉන්නෙ ගෙවන වාට්ටුවක.	He is in a paying ward.

GUNAPALA

එහෙනම් මම යන්න ඕන එයා බලන්න.	Then I must go to see him.

SITA

මාත් මේ යන්නයි හදන්නෙ.	I'm getting ready to go myself.
පොඩ්ඩක්	a bit
පොඩ්ඩක් ඉන්න.	Wait a bit.
මාත් එන්නම්.	I'll come, too.

Grammar

1. NEW NOUNS

Class 1

ඇක්සිඩන්ට් එක	'accident'
ටයර් එක	'tire'
බ්‍රේක් එක	'brake'

Class 2

ඔලුව	'the head'; gen. ඔලුවෙ ; pl. ඔලු
කන්ද	'the hill'; gen. කන්දෙ ; pl. කඳු
කඩුගන්නාව	'Kadugannawa'; gen. කඩුගන්නාවෙ ; no pl.
කොම්පැනිය	'the company'; gen. කොම්පැනියෙ ; pl. කොම්පැනි
පොලීසිය	'the police'; gen. පොලීසියෙ ; pl. පොලීසි
වංගුව	'the curve'; gen. වංගුවෙ ; pl. වංගු
වරද	'the mistake'; gen. වරදෙ ; pl. වරදවල්
වීදුරුව	'the glass'; gen. වීදුරුවෙ ; pl. වීදුරු
හැන්දෑව	'the evening'; gen. හැන්දෑවෙ ;
අත	'the hand, arm'; gen. අතේ ; pl. අත්
	අත has the irregular instrumental අතින්
පරිස්සම	'the care, caution'; gen. පරිස්සමේ ; no pl.

Class 4

කලබලේ	'haste, trouble'; pl. කලබල
තුවාලෙ	'wound, injury'; pl. තුවාල

2. NEW VERBS

Class 1

ඉන්ෂුවර් කරනවා	'insure'
ටිකැට් කපනවා	'discharge from hospital'
	'care, caution'; gen. ; no pl.

Class 2

කන්ද බහිනවා	'go down hill'

Class 3

හැපෙනවා	'collide'
පැලෙනවා	'get split, cracked'
සීරෙනවා	'get bruised'
බිඳෙනවා	'get smashed, shattered (of glass)'
තැලෙනවා	'get dented'

Irregular

නඩු දානවා	'file action'
පොඩි වෙනවා	'get smashed'

3. DATIVE CASE

3.1 අමාරු has the meaning 'difficult' when used with a subject in the direct case, but the meaning 'very ill' when used with a subject in the dative case:

මේ පොත අමාරුයි.	This book is difficult.
මහත්තයාට අමාරුයි.	The master is very ill.

තුවාල means that someone or something is injured when the subject is in the dative case. It means that a part of something is injured with a subject in the direct case:

මහත්තයාට තුවාලයි.	He is injured.
කාර් එකට තුවාලයි.	The car is damaged.
අතක් තුවාලයි.	A hand (i.e., one of his hands) was injured.
දොරක් තුවාලයි.	A door was damaged.

3.2 In many sentences with adjectives like the following referring to health or feelings, the subject is in the dative case:

මට මහන්සියි.	I'm tired.
මට සීතලයි.	I'm cold.
මට නිදිමතයි.	I'm sleepy.
මට බඩගිනියි.	I'm hungry.
මට වතුර තිබහයි.	I'm thirsty.

3.3 The same construction is used with nouns like the following referring to physical conditions:

මට හෙම්බිරිස්සාව.	I have a cold.
මට ඉසරදේ.	I have a headache.
මට මැලේරියාව.	I have malaria.

3.4 Getting an Illness

The names of illnesses (nouns) may occur with the Class 3 verb හැදෙනවා 'get (an illness)' and a subject in the dative case. When the verb is in the simple present, the sense is future; when it is in any past tense form, the sense is past:

දැන් ඇවිදින්න එපා, හෙම්බිරිස්සාව හැදෙනවා.	Don't go walking now, you'll get a cold.
මහත්තයාට හෙම්බිරිස්සාවක් හැදිලා.	The master has caught a cold.
මට ගිය සුමානෙ උන හැදුනා.	Last week I got a fever.
මහත්තයාට හැදුනෙ මැලේරියාව ලු.	It seems that it was malaria that the master got.

3.5 'Getting Ill'

The constructions in 3.1 and 3.2 with adjectives referring to bodily states or feelings and a subject in the dative case may occur with වෙනවා in the sense of 'to get, become'. Here, too, the simple present implies future:

මහත්තයාට හුඟක් අමාරු උනා.	The master became very ill.

දැන් බීර බිව්වොත් නිදිමත වෙනවා.	If I drink beer now, I'll get sleepy.
ළමයාට හුඟක් තුවාල වෙලා ද?	Has the boy been badly injured?

3.6 'To Have an Accident'

'To have an accident' is expressed by the verbal phrase ඇක්සිඩන්ට් වෙනවා . If the subject is stated, it is in the dative case:

මහත්තයාට ඇක්සිඩන්ට් එකක් උනා.	The master had an accident.
හයියෙන් එලවන්න එපා; ඇක්සිඩන්ට් වෙනවා.	Don't go fast, you'll have an accident.

4. TELLING TIME

So far, a number of expressions for asking and telling time have occurred. They are summarized below and some new expressions are added:

4.1 'What time is it?' is expressed by වෙලාව කීය ද? etc. (12,8).

4.11. The answer to the question 'What time is it?' is expressed as follows:

4.12. Even hours are expressed by a numeral in the direct case with the assertion marker added:

දෙකයි.	two (o'clock)
හතරයි.	four (o'clock)
දොළහයි.	twelve (o'clock)

4.13. The half hours may be expressed in either one of two ways. First, it may be expressed in a manner similar to English 'one thirty', with the assertion marker added to both numerals:

එකයි තිහයි.	one thirty
පහයි තිහයි.	five thirty

Second, the half hour may be expressed in a manner similar to the English 'half past one', using the form හමාර half' following the numeral. The numeral is in the definite form, and හමාර has the assertion marker added:

එක හමාරයි.	half past one
හය හමාරයි.	half past six
පහමාරයි.	half past five
දොලහමාරයි.	half past twelve
එකොලහමාරයි.	half past eleven

Note that in the last three examples, where the numeral ends in -ha, this -ha is dropped before the ha- of හමාරයි.

4.14 The quarter hour may also be expressed in two ways. The first is similar to the English 'two fifteen':

දෙකයි පාලහයි.	two fifteen
හයයි පාලහයි.	six fifteen

The second way is to use the form කාල 'quarter' following the numeral. Both the numeral and කාල take the assertion marker:

දෙකයි කාලයි.	quarter past two
හයයි කාලයි.	quarter past six

4.15 The three-quarter hour may also be expressed in two ways. First, it may be expressed like the English 'three forty-five':

තුනයි හතලිස් පහයි.	three forty-five
හතයි හතලිස් පහයි.	seven forty-five

Secondly, it may be expressed in a manner similar to the English 'quarter to seven' with the numeral in the dative case and the assertion market on කාල :

එකට කාලයි.	quarter to one
හතට කාලයි.	quarter to seven

4.16 For time after the hour, other than those mentioned above, there is only one way of stating the time. The expression used is similar to those above like 'one thirty':

දෙකයි පහයි.	2:05
එකොලහයි දහයයි.	11:10
තුනයි තිස් පහයි.	3:35

4.17. Odd times after the half hour may be expressed in a manner similar to English 'five to six'. As with 'quarter to', the first numeral is in the dative case and the second has the assertion marker:

හයට පහයි.	five (minutes) to six
දොලහට විසි පහයි.	twenty-five (minutes) to twelve

4.2 'At what time?' is expressed as follows:

කීයට ද?

4.21. In answering this question, if the time is a time to the following hour (that is, those expressions in which the first numeral is in the dative) the expression is similar to the one mentioned in the preceding section, except that the last form is in the indefinite and is followed by the word තියා.

එකට පහක් තියා.	at five to one
තුනට කාලක් තියා.	at quarter to three
හතරට විසි පහක් තියා.	at twenty-five to four

4.22. All other answers to the question 'at what time?' are similar to those mentioned in section 4.1 except that the last form is in the dative:

දෙකට.	at two
එකයි තිහට.	at 1:30
දෙකයි පහට.	at 2:05
එකයි කාලට.	at quarter past one
තුනයි කාලට.	at quarter past three
එක හමාරට.	at half past one
තුන හමාරට.	at half past three

Note that it is only with the form හමාර that the numeral preceding is in the definite form without the assertion marker.

4.3. When the time is stated vaguely, as an equivalent of the English 'about', the Sinhalese expression uses විතර for 'about'. To express 'at about a time', විතර is added to the expressions for 'at a time', with no other change in the expression:

එකට පහක් තියා විතර.	at about five to one
දෙකට විතර.	at about two
එකයි තිහට විතර.	at about 1:30
දෙකට පහට විතර.	at about 2:05
තුනයි කාලට විතර.	at quarter past three
එක හමාරට.	at half past one

To express 'It is about such and such a time (now)', විතර ඇති is added to the expressions for times given above. However, when විතර is added the numeral preceding is in the dative case, with one exception. This exception is the situation where time to a certain hour is involved. In this case, the numeral preceding විතර is in the indefinite:

එකට විතර ඇති.	It's about one.
එකයි කාලට විතර ඇති.	It's about quarter past one.
දෙක හමාරට විතර ඇති.	It's about half past two.

but

එකට පහක් විතර ඇති.	It's about five to one.
දෙකට කාලක් විතර ඇති.	It's about quarter to two.

The expression for 'at about what time?' is කීයට විතර ද? The expression for 'about what time is it?' is කීයට විතර ඇද්ද?

5. 'MUST HAVE'

'Must have' is expressed in Sinhalese by ඇති plus a dependent infinitive and a subject in the direct case:

ජිනසේන පනහට විතර යන්න ඇති.	Jinasena must have been going about 50.
ඊයෙ නම් යන්න ඇත්තෙ ටිකක් කලබලෙන්.	Yesterday, of course, he must have been going a little fast.

6. 'COMPLETELY RUINED'

The expression ගන්න දෙයක් නෑ means 'completely ruined', 'no good at all'. The item so described is usually in the genitive case, but may be in the instrumental:

කාර් එකේ නම් ගන්න දෙයක් නෑ.	The car, of course, was completely ruined.
මේ පොතේ ගන්න දෙයක් නෑ. මේ පොතෙන් ගන්න දෙයක් නෑ.	This book is no good at all.

7. හදනවා

The verb හදනවා used with a dependent infinitive has the meaning 'get ready to', 'try to', 'pretend to'. The present form is likely to have the meaning 'get ready to', the past 'to try to', and the future 'to pretend to':

මාත් මේ යන්නයි හදන්නෙ.	(Here) I am ready to go.
මහත්තයා වැඩ කරන්න හැදුවා.	He tried to work.
මහත්තයා යන්න හදාවි.	He might pretend to go.

8. ආරංචි

ආරංචි, which takes the assertion marker in simple sentences, means 'hear, get to know'. It is used with a subject in the dative case and with an object that is either a noun or pronoun in the direct case or a clause with (-යි) කියලා:

මට ආරංචියි වරද අනිත් මහත්තයාගෙයි කියලා.	I hear that the fault was the other man's.
ඒ කතාව මට ආරංචි උනා .	I heard that story.

Note that, as in the last example, ආරංචි may occur with උනා and past meaning.

Exercises

A. Substitute orally:

1. .... තුවාලයි.

the car
the bus
the gentleman
his hand
his head
this lady's son

2. පුතාට ....

tired
cold
sleepy
hungry
thirsty

injured
very ill
has fever
has malaria
has a headache

3. මහත්තයාට ....

has a cold
will catch a cold
has caught a cold

got a fever
got malaria
got a disease

B. Say in Sinhalese:

1. one o'clock
one thirty
five twenty-five
quarter past twelve
half past one

half past five
half past twelve
quarter past two
three forty-five
five thirty

2. quarter to one
seven (minutes) to five
twenty to six
five to nine

ten to seven
quarter to twelve
twenty-three minutes to eleven
four minutes to three

3. at five to one
at quarter to nine
at twenty to three
at five ten
at five past two

at two thirty
at half past ten
at five to six
at quarter to twelve
at ten to five

4. at about ten to five in the evening
at about quarter to twelve tomorrow
at about five to six
at about half past ten
at about two thirty yesterday

5. It's about one.
It's about three.
It's about eleven.
It's about nine.
It's about twelve.
It's about half past two.
It's about quarter past three.
It's about three ten.
It's about five to one.
It's about ten to three.

C. Transform into emphatic sentences, according to the model:

මහත්තයා ගෙදර ඇති.....මහත්තයා ඇත්තෙ ගෙදර.

1. උන්නැහේ කොළඹ යනවා ඇති.
2. මුරකාරයා වත්තට යනවා ඇති.
3. ඩ්‍රයිවර් හයියෙන් යනවා ඇති.
4. ළමයා පොත කියවනවා ඇති.
5. පුතා වැඩ කරනවා ඇති.
6. පෙරේරා මේ වත්ත ගන්නවා ඇති.
7. මේ දවස්වල පත්තරේ හොඳට විකිනෙනවා ඇති.

D. Transform into 'must have' sentences, according to the model:

උන්නැහේ කොළඹ යනවා ඇති.....උන්නැහේ කොළඹ යන්න ඇති.

1. මුරකාරයා වත්තට යනවා ඇති.
2. ඩ්‍රයිවර් හයියෙන් යනවා ඇති.
3. ළමයා පොත කියවනවා ඇති.
4. පුතා වැඩ කරනවා ඇති.
5. පෙරේරා මේ වත්ත ගන්නවා ඇති.
6. ඒ පත්තරේ හොඳට විකිනෙනවා ඇති.
7. ළමයා ඉස්කෝලෙ යනවා ඇති.

LESSON 32

Conversation: Toddy Tapping

Gunapala is giving John a description of toddy tapping.

GUNAPALA

රා	toddy
මදිනවා	tap
මහත්තයා දන්නෙ නැද්ද රා මදින හැටි?	Don't you know how toddy is tapped?
මූදුබඩ	coastal
දන්නෙ නැත්තං මූදුබඩ පලාත්වල පොල් ගස් මදින හැටි බලන්න දවසක යමු.	If you don't know, let's go one day to see how coconut palms are tapped in the coastal areas.

JOHN

නෑ. මම දැකලා නෑ.	No. I haven't seen.

GUNAPALA

අපි දවසක ගිහිල්ලා බලමු.	Let's go and see some day.
මෙහේ රා ජාති දෙකක් තියෙනවා.	Here there are two kinds of toddy.
පොල් රා	coconut toddy
කිතුල් රා	kitul toddy
පොල් රායි කිතුල් රායි.	Coconut toddy and kitul toddy.
තරමක් දුරට	somewhat, to some extent
සමාන	similar

රා තරමක් දුරට බීරවලට සමානයි.	Toddy is somewhat like beer.
විටමින්	vitamins
රාවල බී විටමින් හුඟක් තියෙනවායි කියලා බොහොම දෙනා කියනවා මම අහලා තියෙනවා.	I have heard many people say that toddy contains a lot of vitamin B.
බොරුව	the lie
ඇත්ත ද බොරු ද මම දන්නෙ නෑ.	I don't know if it is true or not.

JOHN

ගස්වලින් රා ගන්නෙ කොහොම ද?	How is toddy obtained from trees?

GUNAPALA

මල	the flower
ගස්වල මල්වලින්.	From the flowers of the trees.
මුට්ටිය	the pot
එල්ලනවා	hang
දෙසැරයක්	twice
දවසට දෙසැරයක් මදින මිනිහා ගහට නැගලා මල අග ටිකක් කපලා මුට්ටියක් එල්ලනවා.	The tapper climbs the tree twice a day, cuts the end of the flower a little and hangs a pot.
තෙලිජ්ජ	telijja
වෑහෙනවා	drip
ඒ මුට්ටියට මලෙන් තෙලිජ්ජ වෑහෙනවා.	The sap drips from the flower into that pot.
යුස	juice
පොල් මලෙනුයි කිතුල් මලෙනුයි වෑහෙන යුසවලට කියන්නෙ තෙලිජ්ජ.	The juice dropping from the coconut flower and kitul flower is called "telijja."
මංඩි	sediment (yeast-like)

පැහෙනවා	ferment
තියනවා	put, place, leave
තෙලිජ්ජවලට මංඩී දාලා පැහෙන්න තියනවා.	(They) add sediment to the sap and leave it to ferment.
දවසකින් දෙකකින් ඒක හොඳ ගානට පැහෙනවා.	In a day or two it ferments properly.
පැහුනාම ඒකට රා කියලා කියනවා.	When fermented it is called toddy.
සමහරු	some people
පැනි	syrup, treacle
සමහරු තෙලිජ්ජවලින් රා හදන්නෙ නැතුව පැනි හදනවා.	Some people don't make toddy out of sap, but make syrup.
මහත්තයා පැනි කාලා තියෙනවා ද?	Have you eaten syrup?

JOHN

මුදවනවා	freeze, solidify
කිරි	milk
මුදවාපු කිරි	yoghurt, curds
ඔව්. මම දවසක් මුදවාපු කිරිත් එක්ක පැනි කැවා.	Yes. One day I ate syrup with yoghurt.
ඒක හුඟක් රසයි.	It's very tasty.
ගස්වලට නගින්නෙ කොහොම ද?	How do they climb trees?

GUNAPALA

හැර ගහනවා	make a temporary ladder
මදින කොට ගස් හැර ගහනවා.	When tapping, temporary ladders are built on the trees.
ඉනිමග	the ladder
හැර ගැහුවාම ඉනිමගක් දිගේ වගේ යන්න පුලුවනි.	When temporary ladders are built one can climb as if along a (regular) ladder.

කඹේ	the rope
ගස් පුහක් මදින්න තියෙනවා නම් ගහින් ගහට කඹ දානවා.	If there are many trees to tap they put ropes from tree to tree.
කෙලවර	the end
ඊ ලඟ	next
ඔය වීදියට	in that way
කෙලවරේ එක ගහකට නැග්ගාම ඒ ගහේ ඉඳලා ඊලඟ ගහටයි ඒකෙ ඉඳලා ඊලඟ ගහටයි ඔය වීදියට කඹ දිගේ යන්න පුලුවනි.	When one climbs a tree at one end (of the grove) he can go to the next tree, from that to the next, and so on.
සේරම ගස් මැදලා ඉවර කරලා අනිත් කෙලවරේ ගහෙන් බහිනවා.	Having finished tapping all the trees one comes down from the tree at the other end.
ඒ ගහත් බහින්න පහසු වෙන්න හැර ගහනවා.	In order to facilitate coming down, a temporary ladder is built on that tree, too.

JOHN

බය	the fear
පුරුදු වෙනවා	get practice
එහෙනම් මදින මීනිහා බය නැතුව කඹ දිගේ යන්න පුරුදු වෙන්න ඕන ඇති, නේ?	Then the tapper must get used to walking along ropes without fear.
ඉඳලා හිටලා	occasionally
ඉඳලා හිටලා මීනිස්සු කඹෙන් වැටෙනවා අහන්නත් හම්බවෙනවා ඇති.	Now and then you might hear that people fall from the ropes.
බේරුවල	Beruwala
මීගමුව	Negombo
අපි දවසක බේරුවල හරි මීගමු හරි ගිහිල්ලා ගස් මදින හැටි බලමු.	Let's go one day to Beruwala or Negombo and see how trees are tapped.

GUNAPALA

හොඳයි. ඕන දවසක කියන්න.	Good. Tell me when you want me.
මට එන්න පුළුවනි.	I can come.
ආ	oh
අමතක වෙනවා	forget
ආ, මට එකක් කියන්න අමතක උනා.	Oh, I forgot to say one thing.
හකුරු	hakuru, jaggery
මහත්තයා හකුරු කාලා නෑ, නේ ද?	You haven't eaten hakuru, have you?
ඒ නිසා අපි පිටිසර පලාතට යමු.	So let's go to the countryside.
එතකොට අපිට හකුරු හදනවාත් බලන්න පුළුවනි.	Then we can also see them make hakuru.

Grammar

1. NEW NOUNS

Class 2

බොරුව	'the lie'; gen. බොරුවෙ ; pl. බොරු
මල	'the flower'; gen. මලේ ; pl. මල්
මුට්ටිය	'the pot'; gen. මුට්ටියෙ ; pl. මුට්ටි
කෙලවර	'the end'; gen. කෙලවරේ ; pl. කෙලවරවල්

Singular only:

බය	'the fear'; gen. බයේ
මීගමුව	'Negombo'; gen. මීගමුවේ

Class 3

බේරුවල	'Beruwala'; no pl.

Class 4

කඹේ	'the rope'; pl. කඹ
සැරේ	'time, instance'; no pl.

Class 5

සමහරු	'some people'; pl. only

Other Nouns

Plural only:

රා	'toddy'
ගෙලිපීර	'sap'
යුෂ	'juice'
මංඩි	'sediment'
පැණි	'syrup'
මුදවාපු කිරි	'yoghurt'
හකුරු	'hakuru'

2. NEW VERBS

Class 1

එල්ලනවා	'hang'
කැර ගහනවා	'make a temporary ladder attached to a tree'
තියනවා	'put, place, leave'

Class 2

මදිනවා	'tap'

Class 3

වැහෙනවා	'drip'
පැහෙනවා	'ferment'

Irregular

අමතක වෙනවා	'forget'

3. PAST PARTICIPIAL CLAUSES

More than one past participial clause may occur with a single main verb. Usually a sequence of actions is involved, and common English equivalents are such sentences as 'I go home, eat dinner and go to bed' or 'after going home and eating dinner, I'll go to bed'.

මදින මිනිහා ගහට නැගලා මල අග ටිකක් කපලා මුට්ටියක් එල්ලනවා.	The man who is tapping climbs the tree, cuts the flower, and hangs a pot.

මම ගෙදර ගිහිල්ලා කෑම කාලා ආපහු එන්නම්.	I'll come back after going home and eating dinner.
බංඩා වත්තට ගිහිල්ලා පොල් කඩලා වැටක් බැඳලා ගෙදර ගියා.	Banda went to the estate, picked coconuts, built a fence, and went home.

4. NUMERAL EXPRESSIONS

4.1 සැරේ and පාර are synonyms meaning 'time, occasion, instance'. They both occur in the construction "Numeral stem plus indefinite noun" (27, 6) to express 'two times', 'three times', etc.

දවසට දෙසැරයක් හැම ගහකටම නගින්න ඕන. දවසට දෙපාරක් හැම ගහකටම නගින්න ඕන.	Twice a day you have to climb each tree.
මේ බේත දවසට තුන් සැරයක් කෑමට පස්සෙ බොන්න. මේ බේත දවසට තුන් පාරක් කෑමට පස්සෙ බොන්න.	Take this medicine three times a day after meals.

4.2 Although only a limited number of nouns may occur in the construction "Numeral stem plus indefinite noun," as pointed out in Lesson 27, almost all nouns can occur in a similar construction with the numeral 1, එක , and an indefinite noun. Note that the indefinite noun මිනිහෙක් means 'a man' and when used with එක , that is එක මිනිහෙක් , means 'one man':

එක මිනිහෙක්	one man
එක ගහක්	one tree
එක පාරක්	one time, one instance

In emphatic sentences, when the indefinite noun with or without එක is emphasized, the assertion marker replaces the indefinite ending and the meaning is 'only':

මට ඕන රුපියලයි.	I want (only) a rupee.
මට ඕන එක රුපියලයි.	I want only one rupee.

5. 'SIMILAR TO'

සමාන is used as a postposition with a dependent noun in the dative case meaning 'similar to, like'. The phrases formed in this way act as adjectives:

රා බීරවලට සමානයි.	Toddy is similar to beer.
මේ ගෑනි අපේ අම්මාට සමානයි.	This woman is like my mother.
අරකට සමාන පොතක් ඕන.	I want a book similar to that one.
මට අපේ මාමාට සමාන මහත්තයෙක් හම්බ උනා.	I met a gentleman like my uncle.

The phrase එක , like එක වගේ means the same as 'identical,' 'alike'. Both phrases may act as adjectives:

මේ ළමයි දෙන්නා එක සමානයි. මේ ළමයි දෙන්නා එක වගෙයි.	These two boys are alike.
ඇමෙරිකාවෙ මිනිස්සුයි ඉංගිරිසි මිනිස්සුයි එක සමානයි. ඇමෙරිකාවෙ මිනිස්සුයි ඉංගිරිසි මිනිස්සුයි එක වගෙයි.	Americans and Englishmen are alike.

However, only එක වගේ , not එක සමාන may be used with a verb:

මේ පොත් දෙක මට පේන්නෙ එක වගෙයි.	These two books look alike to me.
මේ ළමයි දෙන්නාට එක වගේ වැඩ කරන්න බෑ.	These two boys can't work alike.

6. ඊ, මී

When මේ 'this' and ඒ 'that' occur before the postposition ළඟ 'near', they take the forms ඊ and මී respectively. These phrases have the meaning 'next to this', 'next to that':

මී ළඟ සුමානෙ මම පවුල බලන්න යන්නම්.	Next week I'm going to see my family.
මී ළඟ හෝටලේට යන්න.	Go to the hotel next to this one.

මාමාගෙ කඩේට යන්න එපා. ඊ ළඟ කඩේට යන්න.	Don't go to (your) uncle's shop. Go to the one next to it.

In the dative case, these expressions are used as adverbs meaning 'next' (after this, after that).

ඊ ළඟට මම ගෙදර ගියා.	Next (after that) I went home.
මී ළඟට පස්වෙනි පාඩම කියවමු.	Next (after this) let's read the fifth lesson.

7. 'GET A CHANCE TO'

හම්බ වෙනවා 'meet', with a dependent infinitive and a subject in the dative case, has the usual English equivalent 'get a chance to', 'have the opportunity to':

මට මේ සුමානෙ කොහේවත් යන්න හම්බ වෙන්නෙ නෑ.	This week I won't get a chance to go anywhere.
ඔහේට පැණි කන්න හම්බ උනා, නේ?	You have had a chance to eat treacle, haven't you?

8. 'CLIMB, DESCEND'

නගිනවා 'climb up', 'ascend', and බහිනවා 'climb down', 'descend' frequently imply a point to which or from which and hence usually occur with a noun or pronoun in either the dative or instrumental case:

ඔහේ ගහෙන් බහින්න.	You come down from the tree!
ඔහේ මෙහෙන්ට බහින්න.	Come down here!
ඔහේ බස් එකට නගින්න.	You get into the bus.
මෙතනින් නගින්න පටන්ගන්න.	Begin climbing from here.

9. බලනවා

බලනවා 'to see' may have as object a clause with the verb in the simple form:

මම බංඩා වැටක් බඳිනවා බැලුවා.	I saw Banda build a fence.
එතකොට හකුරු හදනවාත් බලන්න පුලුවනි.	Then you can watch them make hakuru, too.

10. 'SEE'

The present tense simple and emphatic forms of the verb දකිනවා 'to see' are used only in a few fixed idiomatic expressions. Instead, Sinhalese uses the verb පේනවා to express 'to see' in the present tense. In forms other than the present simple and present emphatic, either දකිනවා or පේනවා may be used with no difference in meaning. Note that පේනවා always takes a dative case and දකිනවා a direct case subject; but either verb may take a direct case noun or pronoun or a simple verb clause as object:

මට මිනිහෙක් එනවා පේනවා.	I see a man coming.
ඔහේට පේන්නෙ කොයි පන්සල ද?	Which temple do you see?
මම හකුරු හදනවා දැක්කා. මට හකුරු හදනවා පෙනුනා.	I saw hakuru being made.

11. 'FALSE'

The noun බොරුව means 'the lie'. However, Sinhalese commonly uses the plural බොරු in situations where English would use the adjective 'false', as in the idiom ඇත්තද, බොරු ද ? 'true or false?'; literally 'the truth or lies?':

ඒ කතාව බොරු.	That story is false.
ඒක බොරු කතාවක්.	That is a false story.

Exercises

A. Substitute orally:

1. ඔහේ දන්නවා ද ....?

how trees are tapped
how the estate is cleaned
how the car is serviced
how beer is made
how hakuru is eaten
how trees are climbed
how coconuts are picked
how money is paid

2. මහත්තයා .... ආපහු ගියා.

kept the car in the garage and
ate good and
drank beer and
told lies and
came to my house and
saw how coconut trees are tapped and
bought coconut toddy and
ate syrup with yoghurt and

3. මම .... ගහට නගිනවා.

twice a day
once a day
three times a day
four times a day
five times a day
six times a day
eight times a day
twelve times a week

4. .... මටත් තියෙනවා.

a cook similar to yours
a dress similar to your son's
an estate similar to my uncle's
a shop like yours
a building like that hotel
a fence similar to this

5. මහත්තයාට .... බලන්න පුලුවනි.

Banda building a fence
them make toddy
the bus being stopped
the train arriving at the station
the gentleman reading the paper
the car being serviced
one driving the train
trees being tapped

B. Transform according to the model, combining the given sentences with past participles

මම ගමට ගියා. වැඩ කෙරුවා.....මම ගමට ගිහිල්ලා වැඩ කෙරුවා.

1. බන්ඩා වැට බැන්දා. පොල් කැඩුවා. කාර් එක සේදුවා.
2. මිනිහා ගහට නැග්ගා. මල කැපුවා. මුට්ටියක් එල්ලුවා.
3. මහත්තයා කෑම කනවා. නිදාගන්නවා.
4. ගුණපාල කොළඹ යනවා. කඩේට බඩු ගේනවා. ලාභෙට විකුණනවා.
5. අපි කිරි මුදවනවා. පැණිත් එක්ක කනවා.
6. උන්නැහේ බේරුවල යාවි. ගේ මදින හැටි බලාවි.
7. මම ඊකට සමාන පොතක් ගත්තා. ඒක ඉස්කෝලෙට ගෙනිච්චා.

C. Conversations:

1. Explain to someone in Sinhalese how coconut trees are tapped in coastal areas.

2. Say in Sinhalese how a cup of tea is made.

3. Imagine that you saw an automobile accident and describe it in Sinhalese.

Review 8

A. Substitute orally:

1. මගේට කරන ද......................?

if you go to a job
if you thatch this roof with coconut leaves
if you come by bus every day
if you think of writing a new book
if you start work in the office
if you treat this patient if you have a possibility
if you see a good doctor in Colombo
if you come to dinner with us today

2. මම .... කොලඹ යනවා.

once a month
frequently
twice a week
every day
occasionally
every month
every week
the whole week
every morning
every day at 5:15 p.m.

3. ළමයාට ....

is injured
is sick
is cold
is sleepy
is tired
is hungry
might get sick
might get a fever
caught a cold
might get injured
became very ill
got badly hurt

4. ....මහත්තයා දන්නෙ නැද්ද?

how toddy is tapped
how doctors work in the hospital
how roofs are thatched in villages
how poor people live in this area
how people drink beer in America
how curry is made with red pepper
how the toddy tapper climbs the tree and hangs a pot
how Jinasena drives the estate truck

5. මීගමු යන කොට ....

we saw them making hakuru
we saw the Vesak decorations that were made in competition
the child might see the men climbing trees and tapping toddy
we can see them cutting the flowers and hanging pots
we might get to see a Perahera
we might get a chance to stop at that famous temple a bit
we might get to see how the people in the seacoast area work
father might get to drive the big boss's Austin

B. Transform to 'not only . . . but also . . . sentences, according to the model:

මේවා ගඩොලෙනුත් බඳිනවා, කලු ගලෙනුත් බඳිනවා.....මේවා ගඩොලෙන් විතරක් නෙවි, කලු ගලෙනුත් බඳිනවා.

1. මහත්තයා කාර් එකත් එලවනවා, කන්තෝරුවෙ වැඩත් කරනවා.
2. උන්නැහේ වත්තත් බලාගන්නවා, ගෙදර වැඩත් බලාගන්නවා.
3. ගුනසිංහ පොතුත් ලියනවා, ඉගැන්වීමත් කරනවා.
4. මට වැඩකාරයෙකුත් නෑ, උයන්න කෙනෙකුත් නෑ.
5. මගේ කාර් එකත් කැඩිලා, උන්නැහේගෙ කාර් එකත් කැඩිලා.
6. පයින් ගියොත් රස්තියාදු වෙන්නත් වෙනවා, මහන්සි වෙන්නත් වෙනවා.
7. ඉස්පිරිතාලෙට නොගියොත් දොස්තර හම්බ වෙන්නත් බෑ, බේත් ගන්නත් බෑ.

C. Transform to 'too' sentences, according to the model:

මට සිංහල කෑම විතරක් නෙවි, ඉන්දියාවෙ කෑමත් කන්න පුලුවනි.....
මට සිංහල කෑමත් කන්න පුලුවනි, ඉන්දියාවෙ කෑමත් කන්න පුලුවනි.

1. මෙහේ ගෙවල්වල පොල් අතු විතරක් නෙවි උලුත් හෙවිලි කරනවා.
2. ගුනසිංහට විතරක් නෙවි මටත් පොත් ලියන්න පුලුවනි.
3. මගේ පුතාට විතරක් නෙවි දුවටත් අවුරුදු විස්සක් විතර වෙනවා.
4. ඒ ලමයා විතරක් නෙවි එයාගෙ යාලුවොත් ගමත් ගානෙ ඇවිදිනවා.
5. ඉඩ තියෙනවා නම් තේ වලට විතරක් නෙවි කෑමටත් එන්න.
6. පුලුවන්කමක් නැත්තං මේ වැඩේ විතරක් නෙවි අනිත් වැඩත් කරන්න එපා.
7. ඕන කමක් තියෙනවා නම් මේ වැඩේ විතරක් නෙවි මීට වැඩියෙ ලොකු වැඩත් කරන්න පුලුවනි.

D. Transform to 'get ready' sentences, according to the model:

මම දැන් කොලඹට යනවා.....මම දැන් කොලඹට යන්න හදනවා.

1. ලමයා ඉස්කෝලෙ වැඩ කරනවා.
2. මදින මිනිහා ගහට නගිනවා.
3. දොස්තර උන්නැහේ ලෙඩ්ඩු බලනවා.
4. අර මිනිස්සු හකුරු හදනවා.
5. අම්මා ගෙදර වැඩ කරනවා.
6. වීරසිංහ කතාවක් කියනවා.

E. Transform to 'must have' sentences, according to the model:

ජිනසේන පනහට විතර ගියා.....ජිනසේන පනහට විතර යන්න ඇති.

1. මහත්තයා වත්තෙ වැඩ ඉවර කෙරුවා.
2. අම්මා මේ බඩු නයට ගත්තා.
3. එයා අලුත් නවකතා පොතක් ලිව්වා.
4. බංඩා අද උදේ රා මැද්දා.
5. මිනිහා රා සේරම බිව්වා.
6. මේ ලී වේයො කැවා.
7. බාප්පා ඒ වැඩපල හෙවිලි කෙරුවා.
8. මහත්තයා වන්දෙ දිනුවා.

F. Conversations:

1. X wants to run for office in the forthcoming village council elections. Y dislikes politics and tries to dissuade him from doing so. X says that he has the interest of the people at heart, and gives it as the reason for his decision. But Y challenges X's knowledge of politics.

2. X wants to see a doctor about an ailment of his. Y gives him all the information on a couple of good doctors in the city, but persuades him to enter the hospital. Hospital service is free, and the medicine and care are as good as in private nursing homes. X, however, decides to see a doctor privately and enter a private nursing home for treatment.

3. X visits Y. Y and his wife give him tea. X stays to lunch, and leaves at about 2:30 in the afternoon to catch a bus to Kandy. He has some relatives in Kandy. They discuss their business and children's education.

4. X is in need of a cook. He interviews several people and finally chooses one who seems good at making Sinhalese food.

5. Someone comes to see Mr. Perera at his house. He has an appointment to see him, but Perera is away and won't be back before lunch. Perhaps he might even stay out to lunch. He must have forgotten about the appointment. Mrs. Perera gets all this information from the stranger and fixes a new appointment.

6. John has never seen the coastal area. Gunasinha is writing a book about that area and now lives there, so he knows all about it. He will take John there and show him about. John can stay at his house. He tells John about toddy tapping and the other activities that they will see there.

7. Weerasinghe tries to explain to a policeman how the accident happened.

LESSON 33

Conversation: The Government of Ceylon

John asks his friend Gunapala about the system of government in Ceylon.

JOHN

මන්ත්‍රීවරයා	Member of Parliament
ලංකාවෙ පාර්ලිමේන්තුවෙ මන්ත්‍රීවරු කීදෙනෙක් ඉන්නවා ද?	How many representatives are there in the Ceylon Parliament?

GUNAPALA

එකසිය පනස් එක් දෙනෙක් ඉන්නවා.	There are 151.
මහජන	public (adj.)
තෝරනවා	choose, select
එයින් එකසිය හතලිස්පස් දෙනෙක් මහජන චන්දෙන් තෝරන මන්ත්‍රීවරු.	Of these 145 are representatives chosen by public election
අගමැතිතුමා	Prime Minister
කැමැත්ත	wish, desire
අග්‍රාංඩුකාරතුමා	Governor General
පත්කරනවා	appoint
අනිත් හයදෙනා අගමැතිතුමාගෙ කැමැත්තෙ හැටියට අග්‍රාංඩුකාරතුමා පත්කරන මන්ත්‍රීවරු.	The other six are representatives appointed by the Governor General according to the desire of the Prime Minister.

JOHN

පාර්ලිමේන්තු	Parliament (stem)
කොට්ඨාසෙ	district, constituency
එහෙනම් ලංකාවෙ පාර්ලිමේන්තු කොට්ඨාස එකසිය හතලිස්පහක් තියෙනවා?	Then there are 145 Parliamentary districts in Ceylon?

GUNAPALA

මන්ත්‍රී	Member of Parliament (stem)
දෙතුන් දෙනෙක්	two or three (animate)
නෑ. නෑ. සමහර මන්ත්‍රී කොට්ඨාසවල මන්ත්‍රීවරු දෙතුන් දෙනෙක් තෝරනවා.	No. There are two or three M.P.'s chosen for some representative districts.
ගනන, ගාන	number, quantity
ඒක නිසා කොට්ඨාස ගනන ඊට ටිකක් අඩුයි.	Therefore the number of districts is somewhat less than that.

JOHN

ඇරෙන්න	besides
ඇමතිවරයා	minister
අගමැතිතුමා ඇරෙන්න තව ඇමතිවරු කීදෙනෙක් ඉන්නවා ද?	Besides the Prime Minister, how many more ministers are there?

GUNAPALA

නියම	fixed
නියමයක් නෑ	not fixed
ඒ ගාන නියමයක් නෑ. සාමාන්‍යයෙන් දොලොස් දෙනෙක් දහතුන් දෙනෙක් විතර පත්කරනවා.	That number is not fixed. Generally about twelve or thirteen are appointed.

JOHN

ඔක්කොම	all

ඒ ඔක්කොම තෝරන්නෙ අගමැතිතුමා වෙන්න ඇති.	Probably they are all chosen by the Prime Minister, eh?

GUNAPALA

තමන්ගෙ	one's own
පක්සෙ	party
ඔව්. අගමැතිතුමා තමන්ගෙ පක්සෙට අයිති මන්ත්‍රීවරුන්ගෙන් තමයි ඇමතිවරු තෝරාගන්නෙ.	Yes. The Prime Minister chooses ministers from members of Parliament belonging to his own party.

JOHN

අගමැතිතුමා තෝරන්නෙ කවුද?	Who chooses the Prime Minister?

GUNAPALA

අග්‍රාංඩුකාරතුමා	The Governor General
නායකයා	leader
උන්නැහේ වැඩි මන්ත්‍රීවරු ගනනක් ඉන්න පක්සෙ නායකයා අගමැති හැටියට පත්කරනවා.	He appoints the leader of the party with the most M.P.'s Prime Minister.

JOHN

අග්‍රාංඩුකාරතුමා පත්කරන්නෙත් මහජන චන්දෙන් ද?	Is the Governor General chosen by public election, too?

GUNAPALA

මහරැජින	queen
නෑ. අග්‍රාංඩුකාරතුමා පත්කරන්නෙ මහරැජින.	No. It's the Queen who appoints the Governor General.
උපදෙස්	advice, counsel
මහරැජිනට ඒකට උපදෙස් දෙන්නෙ අගමැතිතුමා.	The Prime Minister advises the queen on that.
නියෝජිතයා	representative

අග්‍රාංඩුකාරතුමා මහරැජිනගෙ නියෝජිතයා.	The Governor General is the queen's representative.
වෙනුවෙන්	on behalf of
මහරැජින වෙනුවෙන් කටයුතු කරන්නෙ අග්‍රාංඩුකාරතුමා තමයි.	It is the Governor who carries out duties on behalf of the queen.

JOHN

මොකටද	why, what for
අග්‍රාංඩුකාරතුමා මන්ත්‍රීවරු හයදෙනෙක් තෝරන්නෙ මොකට ද?	Why does the Governor General choose six representatives?

GUNAPALA

සුළුජාතිය	minority community
ඒ තෝරන්නෙ සුළුජාතිවලට අයිති මිනිස්සුන්ගෙ නියෝජිතයො හැටියට.	They are chosen as representatives of the people belonging to minority communities.
ලංකාවෙ සුළුජාති කීපෙක මිනිස්සු ඉන්නවා.	There are people of several minority communities in Ceylon.
ලංසි	Burghers
මැලේ	Malays
වෙනම	separately
ලංසි මැලේ වගේ ජාතිවල මිනිස්සුන්ට වෙනම ආසන නෑ.	There aren't seats separately for people of communities such as Burghers and Malays.
ඒක නිසා, ඒ අයට මන්ත්‍රීවරු චන්දෙන් පත්කරන්න විදියක් නෑ.	Therefore those people have no way of electing their own representatives.

JOHN

සැනේට්	Senate (stem)
සැනේට් මන්ත්‍රීවරුන්ව පත්කරන්නෙ කවුද?	Who chooses the members of the Senate?

GUNAPALA

සැනේට් සබාව	the Senate
සැනේට් සබාවෙ මන්ත්‍රීවරු තිස්දෙනෙක් ඉන්නවා.	In the Senate there are thirty members.
එයින් පාලොස්දෙනෙක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙ චන්දෙන් පත්කරන අය.	Of those fifteen are people chosen by vote of the M.P.'s.
අනිත් පාලොස්දෙනාව පත්කරන්නෙ අග්‍රාණ්ඩුකාරතුමා.	The other fifteen are appointed by the Governor General.

JOHN

මට ආසයි මෙහේ පාර්ලිමේන්තු රැස්වීමක් බලන්න.	I'd like to see a meeting of the Parliament here.

GUNAPALA

විවෘත කරනවා	declare open
මහත්තයා තව මාස දෙකක් විතර ඉන්නවා නම් පාර්ලිමේන්තුව විවෘතකරන උත්සවේ බලන්න යන්න පුලුවනි.	If you are going to be here for about two more months you can go to see the ceremony of the opening of Parliament.

JOHN

අදහස් කරනවා	intend
මම තව මාස හතරක් පහක් ම මෙහේ ඉන්න අදහස් කරනවා. ඒක නිසා බලන්න පුලුවනි.	I intend to be here as many as four or five more months. Therefore I can see it.

GUNAPALA

එහෙනම් මහත්තයාට නිදහස් උත්සවෙත් බලන්න පුලුවනි.	Then you can see the independence celebrations also.
ජයට	in a grand manner
පවත්තනවා	hold, conduct

මේ පාර නිදහස් උත්සවේ බොහොම ජයට පවත්තන්න යනවා ලු.	It seems that they are going to hold this year's independence celebrations on a grand scale.

Grammar

1. NEW NOUNS

Class 2

අයිතිවාසිකම	right; gen. අයිතිවාසිකමේ pl. අයිතිවාසිකම්
කැමැත්ත	wish; gen. කැමැත්තෙ pl. කැමති
ගනන	number; gen. ගනනෙ pl. ගනන්
සැනේට් සබාව	the Senate; gen. සැනේට් සබාවෙ pl. සැනේට් සබා
සුලුජාතිය	minority community; gen. සුලුජාතියෙ pl. සුලුජාති

Class 4

කොට්ඨාසෙ	district, constituency; pl. කොට්ඨාස
පක්සෙ	party; pl. පක්ස

Class 5

අගමැතිතුමා	Prime Minister; pl. අගමැතිතුමාලා, අගමැතිවරු
අග්‍රාණ්ඩුකාරතුමා	Governor General; pl. අග්‍රාණ්ඩුකාරතුමාලා
ඇමතිවරයා	Minister; pl. ඇමතිවරු
නායකයා	leader; pl. නායකයො
නියෝජිතයා	representative; pl. නියෝජිතයො
මන්ත්‍රීවරයා	member (of Parliament); pl. මන්ත්‍රීවරු
මහරැජින	Queen; pl. මහරැජිනියො
උපදෙස්	advice (plural only)

2. NEW VERBS

Class 1

අදහස් කරනවා	intend
තෝරනවා	select
පත්කරනවා	appoint
පවත්තනවා	hold, conduct
විවෘත කරනවා	declare open

3. THE OBJECT MARKER -ව

The direct object of a verb in Colloquial Sinhalese is generally in the direct case. However, if the direct object is an animate noun or pronoun, some speakers may mark it by adding a form -ව . In the singular, -ව is added to the direct case form, and in the plural it is usually added to the stem with -න් that precedes case endings.

Singular Object		Plural Object
මිනිහාව	man	මිනිස්සුන්ව
හරකාව	one head of cattle	හරකුන්ව
ගුරුවරයාව	teacher	ගුරුවරුන්ව

When -ව is added to the first person pronouns මම and අපි, the results are මාව and අපව.

Some speakers use -ව more frequently than others. It is always an alternate for the direct case form, but only in the direct object position, and only with animate forms:

මම මිනිහාව දැක්කා.	I saw the fellow.
මිනිහා මාව දැක්කා.	The fellow saw me.

4. 'TWO OR THREE'

In Lesson 21 expressions for 'two or three,' 'three or four,' etc., were introduced. These were formed with both numerals in the indefinite form and could be made with either inanimate or animate numerals:

එකක් දෙකක්
එක්කෙනෙක් දෙන්නෙක්

For these expressions there are alternatives which occur for certain numerals as follows:

1. For inanimate numerals there is an alternative with the first numeral in the definite form and the second numeral either definite or indefinite depending on sense. This alternative is for the most part limited to the following numeral combinations:

දෙක තුන	two or three	දෙක තුනක්	(a) two or three
තුන හතර	three or four	තුන හතරක්	(a) three or four
හත අට	seven or eight	හත අටක්	(a) seven or eight

මේ පොත් තුන හතර කඩේ තියන්න.
Put these three or four books in the shop.

මට සිගරැට් තුන හතරක් ගන්න ඕන.

I want to get three or four cigarettes.

2. For animate numerals there is an alternative with the first numeral in the stem form and the second numeral either definite or indefinite depending on sense. This alternative is largely limited to the following combinations:

දෙ තුන් දෙනා	two or three	දෙ තුන් දෙනෙක්	(a) two or three
තුන් හතර දෙනා	three or four	තුන් හතර දෙනෙක්	(a) three or four
හතර පස් දෙනා	four or five	හතර පස් දෙනෙක්	(a) four or five
හත් අට දෙනා	seven or eight	හත් අට දෙනෙක්	(a) seven or eight
දහ දොලොස්දෙනා	ten or twelve	දහ දොලොස් දෙනෙක්	(a) ten or twelve
විසි තිස් දෙනා	twenty or thirty	විසි තිස් දෙනෙක්	(a) twenty or thirty

මේ ලමයි දෙ තුන් දෙනාට වඩුවැඩ උගන්නන්න.
Teach these two or three boys carpentry.

මිනිස්සු දෙ තුන් දෙනෙකුට වැඩියෙ යවන්න එපා.

Don't send more than two or three men.

5. OTHER

In positive statements the form තව when used with a singular indefinite noun, equates with English 'another (an additional one)' and වෙන equates with English 'another (a different one)'. These forms may be used with plural nouns with the same distinction in meaning; that is 'other (additional)' and 'other (different)'.

මට තව පොතක් දෙන්න.
Give me another book (This one isn't enough).

මෙහෙ තව පොත් තියෙනවා ද?
Are there other (i.e., more) books here?

මට වෙන පොතක් දෙන්න.
Give me another book (I don't like this one).

මෙහෙ වෙන පොත් තියෙනවා ද?
Are there other books here? (These won't do.)

In negative sentences only වෙන is used, and it may have either meaning:

මට වෙන පොතක් එපා.

I don't want another book (either one more or one instead of this one!).

මෙහෙ වෙන පොත් නැද්ද?

Aren't there other books here? (Either any more or others to replace these.)

The form අයිති equates with the English 'the other' either singular or plural:

මට අනිත් පොත දෙන්න.
Give me the other book.

අනිත් බඩු ගෙනාවෙ නැද්ද?
Didn't you bring the other goods?

The emphatic particle ම when added to වෙන 'other' produces an adverbial expression equating with English 'separately':

මම වෙනම වැඩ කරන්නම්.
I'll work separately.

ඒ මිනිස්සුන්ට වෙනම ආසනයක් නෑ.
Those people don't have a separate representative (lit. They don't have a seat separately).

6. COMPARATIVE DEGREE

It has already been noted that there is a comparative construction with the form වැඩියෙ plus a dependent noun in the dative case:

මේ පොත අරකට වැඩියෙ හොඳයි.
This book is better than that one.

For many adjectives the වැඩියෙ may be omitted with no change in meaning. The student should note these when he meets them. Thus:

මේ පොත අරකට වැඩියෙ ලොකුයි. or මේ පොත අරකට ලොකුයි.
This book is bigger than that one.

මේ පොත අරකට වැඩියෙ පොඩියි. or මේ පොත අරකට පොඩියි.
This book is smaller than that one.

Other examples are:

කොට්ඨාස ගාන ඊට අඩුයි.
The number of districts is smaller than that.

මගේ චන්ද ගාන ඊට වැඩියි.
The number of votes I got is greater than that.

7. 'EXCEPT'

The form ඇරෙන්න 'except,' 'with the exception of,' 'besides,' is used with a dependent noun, the case of which depends on the construction:

මහත්තයා ඇරෙන්න තව හයදෙනෙක් ඉන්නවා.

There are six besides the master.

මට ඇරෙන්න වෙන කාටවත් සිංහල බෑ.

No one knows Sinhalese except me.

8. REFLEXIVE PRONOUN

The reflexive pronoun in Sinhalese is තමන් (with an alternate form තමුන්). It is usually used in the third person; 'he himself,' 'they themselves,' etc. It is occasionally used in the first or second person, but the student should avoid this, since it is so used only in special circumstances. තමන් (තමුන්) has the usual case forms:

DIRECT	තමන්	(or තමුන්)
DATIVE	තමන්ට	(or තමුන්ට)
GENITIVE	තමන්ගෙ	(or තමුන්ගෙ)
INSTRUMENTAL	තමන්ගෙන්	(or තමුන්ගෙන්)

It may be used as a pronoun referring to the same person as the subject, but it is not obligatory:

ඒ මිනිස්සු එයාලාගෙ කාර්වලින් යාවි.

ඒ මිනිස්සු තමන්ගෙ (තමුන්ගෙ) කාර්වලින් යාවි.

Those men will go in their (own) cars.

ඔය ලමයි ඔය ලමයින්ට ඕන පොත් අර සාප්පුවෙන් ගන්න.

ඔය ලමයි තමන්ට (තමුන්ට) ඕන පොත් අර සාප්පුවෙන් ගන්න.

You (boys) get the books you want from that shop.

9. වෙනුවෙන්

The form වෙනුවෙන් is used with a dependent noun in the direct case and means 'for, on behalf of.' The form වෙනුවට is also used with a dependent noun in the direct case and means 'for, in place of.'

මම මහත්තයා වෙනුවෙන් රැස්වීමට යනවා.
I will go to the meeting for the master.

අම්මා සල්ලි වෙනුවට පොල් දුන්නා.
Mother gave coconuts in place of money.

10. 'WHAT FOR'

The form මොකටද means 'what for?,' 'for what purpose?'

මම ඒ පල් කතාව අහන්නෙ මොකට ද?
What should I listen to that dry talk for?

11. අය

අය 'they,' 'those people' is used only with some preceding form qualifying it:

මේ අය	these people
වැඩ කරන අය	working people
හුගක් අය	many people

12. 'INTEND'

The verb අදහස්කරනවා 'intend to' takes a subject in the direct case and a dependent infinitive.

ඒ අය සිංහල ඉගනගන්න අදහස් කරනවා.
Those people intend to learn Sinhalese.

මම ලබන සුමානෙ මේක ඉවර කරන්න අදහස් කරනවා.
I intend to finish this one next week.

13. 'ALL'

The form ඔක්කොම 'all,' 'everybody' may be used as an alternative for සේරම . Like සේරම , ඔක්කොම may go either before or after the plural noun that it qualifies:

මේ ඔක්කොම පොත් අලුත්.
මේ සේරම පොත් අලුත්.
All of these books are new.

මට මේ පොත් ඔක්කොම ඕන උනා.
මට මේ පොත් සේරම ඕන උනා.

I needed all of these books.

14. TERMS OF RESPECT

To form terms of respect for people in high ranking positions, the forms වරයා or තුමා are added to noun stems. The plurals are වරු and තුමාලා:

ඇමතිතුමා	or	ඇමතිවරයා	the minister
ඇමතිතුමාලා	or	ඇමතිවරු	the ministers

ඇමතිතුමාලාත් රැස්වීමට එනවා ද?
ඇමතිවරුත් රැස්වීමට එනවා ද?
Are the ministers coming to the meeting, too?

15. ADJECTIVES

Adjectives may have an indefinite form. This form, like the indefinite of nouns, shows certain stem variations:

Adjective		Indefinite Form
හොඳ	good	හොඳක්
නරක	bad	නරකක්
නියම	fixed	නියමයක්
ලොකු	big	ලොකුවක්
පොඩි	small	පොඩියක්
අලුත්	new	අලුතක්
කැමති	like	කැමැත්තක්

The indefinite form is used in negative construction like the following, implying 'not particularly.'

ඒක හොඳක් නෑ.
That isn't very good.

ඒ ගාන නියමයක් නෑ.
That number isn't particularly fixed.

Exercises

A. Substitute orally.

1. .... මන්ත්‍රීවරු කීදෙනෙක් ඉන්නවා ද?

In Ceylon Parliament
In the Ceylon government
In Ceylon
In the Indian Parliament
In our parliament
In your country
In this parliamentary district
In your representative district

2. මේ අය .... පත්කරන මන්ත්‍රීවරු.

by the Governor General
by the Prime Minister
by the Parliament
by public vote
by the public
from minority communities
from the Senate
from the Malay people
from our party
from the Prime Minister's party

3. අද වැඩට ලමයි .... එවන්න.

two or three
three or four
seven or eight
four or five
ten or twelve
one or two

4. මට .... දෙන්න.

another book (in addition to this)
some other book
the other book
100 bricks more
the other 200 rupees
another five or six books (in addition)

5. මේ වත්ත ....

better than that
bigger than that
newer than my estate
more expensive than Mr. Perera's estate
smaller than the other estates
like the M.P.'s estate
like a coconut estate
not good enough
not as good as my estate

6. .... කාටවත් කියන්න එපා.

except the master
except Mr. Perera
except the doctor
except him
except the driver
except the M.P.
except Governor General
except the Prime Minister
except the Sinhalese people

7. .... කවුරුවත් යන්නෙ නෑ.

except the master
except Mr. Perera
except the doctor
except him
except the driver
except the M.P.
except the Governor General
except the Prime Minister
except the Sinhalese people

8. .... කාගෙන්වත් සල්ලි ගන්න එපා.

except the master
except Mr. Perera
except the doctor
except him
except the Sinhalese people
except the dancers
except the M.P.'s
except the driver

9. උන්නැහෙ .... රැස්වීමට ගියා ලු.

on behalf of the big boss
on behalf of the Prime Minister
on behalf of the Governor General
on behalf of the ministers
on behalf of the M.P. of this area
on behalf of the Head Teacher
on behalf of his father
on behalf of the teachers

10. අපි .... එලෝලු ගත්තා.

in place of money
in place of rice
in place of meat
in place of fruit
in place of tea
in place of milk

B. Transform according to the model by changing the numeral phrase to the indefinite:

ළමයාට මේ පොත් දෙක තුන දෙන්න...ළමයාට මේ පොත් දෙක තුනක් දෙන්න.

1. මිනිස්සු දෙතුන් දෙනා වැඩට ගියා.
2. සිගරැට් හතර පහ මේසෙ උඩින් තියන්න.
3. පොත් හත අට ළමයාට දුන්නා.
4. පොල් ගෙඩි දහේ දොළහ වත්තට දාන්න.
5. රෑ කෑමට මිනිස්සු හතර පස් දෙනා තානායමට ගියා ලු.

C. Transform according to the model by using the indefinite form of the adjective to mean 'not particularly . . . .'

ඒක හොඳ නෑ...ඒක හොඳක් නෑ.

1. ඒ ගාන නියම නෑ.
2. ළමයා ලොකු නෑ.
3. මේ කෑම නරක නෑ.
4. වත්ත පොඩි නෑ.
5. උන්නැහෙගෙ කාර් එක අලුත් නෑ.
6. ඒ පොත අමාරු නෑ.
7. උන්නැහෙ සිංහල කෑමට කැමති නෑ.

D. Conversations

1. X and Y discuss the structure of the Ceylon Government. X knows that Ceylon has a parliamentary system of government, with a Governor General to represent the queen, but he doesn't know the exact number of M.P.'s and Ministers. Y, who knows facts and figures accurately, corrects X's statements.

2. X is a visitor to Ceylon. Y gives him some information about the public holidays in Ceylon and the significance of some of them, such as the Sinhalese New Year, the Vesak Festival, the Independence Celebrations, etc. He also describes the Kandy Perahera in which many elephants and dancers participate.

LESSON 34

Conversation: Going to a Movie

Since it is so hot, Gunapala and Jinasena decide to go to the movies.

GUNAPALA

අව්ව	sunshine
හින්දා	because, since
චිත්‍රපටිය	the movie
අව්ව සැර හින්දා අපි චිත්‍රපටියක් බලන්න යමු.	Since the sunshine is so strong, let's go and see a movie.
මේ අව්වෙ ඇව්දින එක හරි අමාරුයි.	It's really hard to walk in this sun.
ඉක්මන් කරනවා	hurry
ෂෝ එක	the show
ඇතුල් වෙනවා	enter
ඉක්මන් කලොත් තුනේ ෂෝ එක බලන්න ඇතුල් වෙන්න පුලුවනි.	If we hurry, we can get in to see the three o'clock show.

JINASENA

ගින්දර	the fire
ඒක හොඳයි. අව්ව ගින්දර වගෙයි නේද?	That's fine. The sunshine is like fire, isn't it?
පායනවා	clear up, become hot and dry
පායන කොට දිගටම පායනවා.	When it gets hot and dry it keeps right on.

වහින්න ගන්නවා	start to rain
වහින්න පටන්ගත්තාම දිගටම වහිනවා.	When it starts to rain it keeps right on raining.
දේසගුනේ පුදුම	weather, climate amazing
මේ දවස්වල දේසගුනේ පුදුමයි.	The weather these days is amazing.
fපිල්ම් එක	the film
මොකද්ද බලන්න කැමති පිල්ම් එක?	What film would you like to see?
සිංහල fපිල්ම් එකක් බලමු ද?	Shall we see a Sinhalese film?

GUNAPALA

හින්දි සින්දුව	Hindi the song
හින්දි fපිල්ම් එකකට ගියොත් සින්දු ටිකක් අහන්න පුලුවනි නේද?	If we go to a Hindi film we can hear some songs, can't we?
වෙම්බ්ලි එක	the Wembley
දැන් වෙම්බ්ලි එකේ හොඳ පින්තූරයක් පෙන්නනවා.	They are showing a good picture at the Wembley now.

JINASENA

හෝල් එක රස්නෙ	the hall, theater hot, heat
එහෙනම් ඒක බලමු.	Then let's see that.
හෝල් එකෙත් මේ වගේම රස්නෙද දන්නෙ නෑ.	I wonder if it's as hot in the theater.

GUNAPALA

ඇතුල	inside
නෑ. හෝල් එක ඇතුලෙ රස්නෙ නැතුව ඇති.	It probably isn't as hot inside the theater.

වටේට	around
දැනෙනවා	feel
ඒ වටේට ගස් තියෙන හින්දා රස්නෙ දැනෙනවා අඩුයි.	Since there are trees around it, you feel the heat less.
පික්චර් එක	movie
ඔහේ මීට ඉස්සර හින්දි පික්චර් දැකලා තියෙනවා ද?	Have you seen Hindi movies before?

JINASENA

ගාල්ල	Galle
දැන් මාස හතරකට පහකට විතර ඉස්සර හින්දි පික්චර් එකක් දැක්කා ගාල්ලෙදි.	About four or five months ago I saw a Hindi film in Galle.
එච්චරයි	that's all
එච්චරයි මම දැකලා තියෙන්නෙ.	That's all I've seen.
අල්ලනවා	catch, appeal
ඒක නම් මගෙ හිතට ඇල්ලුවෙ නෑ.	But it didn't appeal to me.
නමුත් වෙම්බ්ලි එකේ තියෙන චිත්‍රපටිය හොඳයි කියලා පත්තරේ තිඋනා.	But it said in the paper that the picture at the Wembley is very good.
තිඋනාත්	even if there are, were
කතාව	story, plot
වැදගැම්මක් නෑ	useless, hopeless
සින්දු තිඋනාත් සමහර පින්තූරවල කතාව වැදගැම්මක් නෑ.	Even if there are songs, the plot of some pictures is hopeless.

GUNAPALA

ඔහේ අකමැති නම් ඉංගිරිසි පිල්ම් එකකට යමු.	If you don't like (Hindi films), we'll go to see an English film.
ආසාව	desire
කූල්ඩ්‍රින්ක් එක	cool drink

ෆිල්ම් එකක් බලන්න ආසාවක් නැත්නම් ඇලිෆන්ට් හවුස් එකට ගිහිල්ලා කූල්ඩ්‍රින්ක් එකක් බොමු.	If you don't feel like seeing a movie, let's go to the Elephant House and have a cool drink.

JINASENA

නෑ. පික්චර් එකකට යමු.	No, let's go to the movie.
හෝල් එකේදි මොකුත් බොන්න පුලුවනි.	We can drink something in the theater.
නතරවෙනවා	stop, tarry
ඇලිෆන්ට් හවුස් එකේ නතර උනොත් පරක්කු වෙනවා.	If we stop at the Elephant House we will be late.
බාගෙ	half
ෆිල්ම් එකට තව තියෙන්නෙ පැය බාගයයි.	There's only a half hour before the film.
හින්දි පින්තූර පැය තුනක් විතර ගන්නවා නේද?	Hindi films take about three hours, don't they?

GUNAPALA

ඔව්.	Yes.

JINASENA

වෙයි	might be, will be
එහෙනම් ඉවර වෙනකොට අව්ව බැහැලා රස්නෙ ටිකක් අඩුවෙයි නේද?	Then by the time it is over the sun will have set and it will be less hot, eh?

Grammar

1. NEW NOUNS

Class 1

කූල්ඩ්‍රින්ක් එක	the cool drink; pl. කූල්ඩ්‍රින්ක්ස්
පික්චර් එක	the picture, movie
වෙම්බ්ලි එක	the Wembley
ෂෝ එක	the show
ෆිල්ම් එක	the film
හෝල් එක	the hall

Class 2

අව්ව	the sunshine; gen. අව්වෙ ; no pl.
ආසාව	the desire; gen. ආසාවෙ ; pl. ආසාවල්
ගින්දර	the fire; gen. ගින්දරේ ; no pl.
ගාල්ල	Galle; gen. ගාල්ලෙ ; no pl.
චිත්‍රපටිය	the movie; gen. චිත්‍රපටියෙ ; pl. චිත්‍රපටි
හිත	the mind; gen. හිතේ ; pl. හිත්
සින්දුව	the song; gen. සින්දුවෙ ; pl. සින්දු

Class 4

දේසගුනේ	the climate; no pl.
රස්නෙ	the heat; no pl.

Other Nouns:

හින්දි	Hindi; no pl.

2. NEW VERBS

අල්ලනවා	catch, appeal to
ඉක්මන් කරනවා	hurry
දැනෙනවා	feel, perceive
නතරවෙනවා	stop, tarry
පායනවා	clear up, become dry and hot
පෙන්නනවා	show
බහිනවා	go down, descend

3. THE PAST CONCESSIVE FORM

Sinhalese has a past concessive form of the verb made by dropping the final ා from the past tense form of the verb and adding -ත් :

Verb		Simple Past	Past Concessive
කපනවා	cut	කැපුවා	කැපුවත්
කරනවා	do, make	කෙරුවා	කෙරුවත්
වෙනවා	be, become	උනා	උනත්
ඉන්නවා	be	උන්නා	උන්නත්
තියෙනවා	be	තිඋනා	තිඋනත්
බදිනවා	fry	බැද්දා	බැද්දත්
වැටෙනවා	fall	වැටුනා	වැටුනත්

The concessive form is used to form clauses which are equivalent to those in English introduced by 'even if,' 'even though':

මහත්තයා ගියත් මට යන්න විදියක් නෑ.
Even if the master goes, I have no way of going.

ටැක්සියකින් ගියත් පරක්කු වේවි.
Even if he goes by taxi he'll be late.

මේ මස් බැද්දත් රස නෑ.
Even if this meat is fried it is not tasty.

A negative concessive clause may be formed by adding නො- before the concessive verb:

ඔහේ නොගියත් මම යනවා.
Even if you don't go, I'll go.

වැඩ නොකෙරුවත් සල්ලි හම්බවෙනවා.
Even if I don't work, I'll get money.

4. 'TO BEGIN'

Besides using පටන් ගන්නවා with a dependent infinitive in the meaning 'to begin' (Lesson 10), the verb ගන්නවා may be used by itself with the same meaning. The verb when used by itself in this construction is likely to imply a certain amount of disapproval or dislike for the action involved:

වහින්න ගත්තාම දිගටම වහිනවා.
When it starts raining, it keeps right on.

මිනිහා එහෙම කතාකරන්න ගත්තාම, කවුරුවත් කට අරින්නෙ නෑ.
When he begins to talk like that, no one else opens his mouth.

5. 'INSIDE' AND 'OUTSIDE'

The form ඇතුල 'inside,' a noun of Class 2, functions as a postposition with a dependent noun in the direct case. Since it is a noun, the form ඇතුල will appear in whatever case is required by the construction in which it appears:

ගේ ඇතුලට යන්න!
Go inside the house!

එයා හොල් එක ඇතුලෙන් පොත් වගයක් ගෙනාවා.
He brought some books out of the hall.

The form පිට 'outside,' a noun of Class 3, also functions as a postposition. Like ඇතුල , පිට will appear in the case required by the construction in which it appears. A noun dependent on පිට is in the instrumental case unless පිට itself is in the instrumental case, in which event the dependent noun will be in the dative case:

හෝල් එකෙන් පිට ඒ මිනිස්සු හූ කිව්වා.
Those people hooted outside the hall.

වත්තට පිටින් ඒ ගොල්ල පාරක් හැදුවා.
Those people built a road along the outside of the estate.

Note that the expressions 'to look inside' or 'to look outside' require ඇතුල and පිට to be in the genitive case:

හෝල් එක ඇතුලෙ බලන්න.
Look inside the hall.

මම ගෙයින් පිට බැලුවා.
I looked outside the house.

6. 'HALF'

With expressions of quantity, but not numerals, the form බාගෙ means 'half.' The noun dependent on බාගෙ is in the plural form:

fපිල්ම් එකට තියෙන්නෙ තව පැය බාගයයි.
There is still a half hour before the film starts.

මේ වැඩ කරන්න තව දවස් බාගයක් ඕන.
We still need a half day to finish this work.

7. 'TO FEEL'

The verb දැනෙනවා 'feel' takes a subject in the dative case and an object in the direct case. In many instances in which English uses an adjective with the verb 'feel,' Sinhalese uses a noun:

මට අද රස්නෙ දැනෙනවා.
I feel the heat today.

8. හින්දා

හින්දා 'because, since' may replace නිසා 'because, since' in any construction in which the latter occurs (15,6).

අව්ව සැර හින්දා අපි චිත්‍රපටියක් බලන්න යමු.
අව්ව සැර නිසා අපි චිත්‍රපටියක් බලන්න යමු.
Since the sun is so hot, let's go see a movie.

පෙරේරා යාපනේට ගිය හින්දා මම කාර් එක මෙහෙට ගෙනාවා.
පෙරේරා යාපනේට ගිය නිසා මම කාර් එක මෙහෙට ගෙනාවා.
Because Perera went to Jaffna, I brought the car here.

වත්තෙ වැඩ නැති හින්දා මම ගමට ආවා.
වත්තෙ වැඩ නැති නිසා මම ගමට ආවා.
Since there is no work in the estate, I came home.

9. THE -යි FORM

The -වි form of the verb (Lesson 10) has an alternate form which may be used in place of it with no difference in meaning. It is formed by substituting -යි for -වි and shortening the preceding vowel:

Verb		-වි Form	-යි Form
කනවා	eat	කාවි	කයි
බලනවා	see	බලාවි	බලයි
ඉන්නවා	be	ඉදිවි	ඉදියි
බදිනවා	fry	බදිවි	බදියි
තේරෙනවා	understand	තේරේවි	තේරෙයි

පහට විතර ගෙදර ඒවි.
පහට විතර ගෙදර එයි.
He will probably come home at about five.

ඒ චිත්‍රපටිය අද පෙන්නාවි.
ඒ චිත්‍රපටිය අද පෙන්නයි.
They might show that picture today.

10. IDIOMS

10.1 වැදගැම්මක් නෑ means 'to be no good, to be useless.'

එයාගෙ කතාව වැදගැම්මක් නෑ.
His talk was useless.

10.2 The expression අව්ව බහිනවා means 'the sunshine is decreasing, it is getting less sunny.'

මේ දවස්වල හය වෙන්න ඉස්සෙල්ලා අව්ව බැස්සා.
These days even before six the sunshine has decreased.

10.3 The expression හිතට අල්ලනවා means 'to appeal to': The person involved is in the genitive case preceding හිතට : That which doesn't appeal may be a noun or a verbal noun.

ඒ චිත්‍රපටිය මගේ හිතට ඇල්ලුවෙ නෑ.

That picture didn't appeal to me.

වැඩ කරන එක බංඩාගේ හිතට අල්ලන්නේ නෑ.

Working doesn't appeal to Banda

11. WRITING SYSTEM

The letter ෂ , like ශ (Lesson 30) represents the sound represented as š and sounded like the sh in English show. The words that these letters occur in must be learned as they occur, and the student may encounter some fluctuation in spelling.

A. Substitute orally:

1. මේ දවස්වල .... මගේ හිතට අල්ලන්නෙ නෑ.

the climate
Hindi film
going to the movies
the movies in Colombo
the movies they are showing at Kandy
the food and drinks in this restaurant
the way the driver speaks
the songs in Hindi movies
walking about in the sun
eating hot foods

2. .... මේ තරම් රස්නෙ දැනෙන්නෙ නෑ.

inside the hall
outside the hall
if it rains now and then
if the sunshine decreases
when it becomes night
near the bathing pool
inside the shrine house
outside the University camp
if we didn't go for a walk
if there were some trees near the house

3. .... කාටවත් මේ වැඩ කරන්න බෑ.

except for me
except for Mr. Perera
except for the Prime Minister
except for people in Hindi movies
except for people who live in villages
except for people who win elections
except for women who like to spend money

4. .... කාටවත් කියන්න එපා

outside the village
while inside the office
while outside this country
inside the hall
before the movie is shown
after you tell Perera
after you meet the headmaster
before you visit that area
if you are buying tickets for that movie
if you are not going to the meeting

5. .... පත්තරේ තිඋනා.

That the new road is good
That the food in that area is tasty
That Hindi films are shown in that theater
That the teacher in this school is good
That he is going to see the opening of Parliament
That he might win the elections this time
That the Prime Minister is a bit sick
That clothing is likely to become scarce

B. Transform according to the model, forming a හින්දා clause from the first sentence and adding it to the second.

මම යනවා. ඒ පැත්තෙ නවතින්න බෑ......
මම යන හින්දා ඒ පැත්තෙ නවතින්න බෑ.

1. අද වහිනවා. පොල් කඩන්න බෑ.
2. අද අව්ව සැරයි. පයින් යන එක අමාරුයි.
3. මහත්තයාට අසනීපයි. අද කන්තෝරුවෙ වැඩ පරක්කුයි.
4. කුස්සි අම්මා ගමට ගියා. මේ දවස්වල කෑම රස මදියි.
5. මේ පැත්තට වැස්ස නෑ. එලෝලු හිඟයි.
6. පාර්ලිමේන්තුව විවුර්ත කරන්නෙ අද. අගමැතිතුමා හම්බවෙන්න බෑ.
7. එයා ඒ හින්දි චිත්‍රපටිය බැලුවා. මේ සින්දු දන්නවා.
8. බංඩා ඊයෙ සල්ලි ගත්තා. අද වැඩට ආවෙ නෑ.

C. Transform according to the model, making a past concessive clause of the first sentence in each pair, and join it to the second clause given.

මහත්තයා ඒ වැඩ කරනවා.   අපිට ප්‍රයෝජනයක් නෑ.
මහත්තයා ඒ වැඩ කෙරුවට අපිට ප්‍රයෝජනයක් නෑ.

1. අපි ඉක්මනට යනවා.   මහත්තයා පරක්කු වෙනවා.
2. පියදාස කාර් එලවනවා.   පාර හරියට දන්නෙ නෑ.
3. අපි සිංහල ඉගනගන්නවා.   පත්තරේ කියවන්න අමාරුයි.
4. මහත්තයා වන්දෙ දිනනවා.   ගමට ඉස්කෝලයක් නෑ.
5. බංඩා දර අදිනවා.   කෑම හදන්න කවුරුවත් නෑ.
6. සිංහල ඉගනගන්න මිනිස්සු ඉන්නවා.   හොඳ පොත් නෑ.
7. මේ හෝටලේ රස කෑම තියෙනවා.   අපි ලඟ සල්ලි නෑ.
8. බංඩා මාලුවට මිරිස් හුඟක් දානවා.   මහත්තයාට කට දනවා මදියි.
9. ඒ මිනිස්සුන්ට සල්ලි දෙනවා.   හරියට වැඩට එන්නෙ නෑ.
10. අව්ව බහිනවා.   රස්නෙ අඩු උනේ නෑ.

D. Say in Sinhalese:

1. Have you seen any Hindi films?
2. Yes. I saw one a few months ago.
3. But I didn't like the songs in that one.
4. I like Sinhalese films better than Hindi ones.
5. There's a new Hindi film coming to the Wembley this week.
6. I read in the paper that there aren't songs in that one.
7. Is that so? I have never seen a Hindi film without songs.

8. It's hot today, isn't it?
9. Yes, let's go to the Galle Face Hotel for a cool drink.
10. No. I can't go now, because I have some work to do in the office.
11. Is that so? Even if you go to the office now, you won't be able to do anything.
12. Why don't you wait until the sunshine decreases?
13. If I do that, I might not be able to finish the work.
14. All right. We can have a drink later.

LESSON 35

Conversation: Planning a Party

Jayapala and Sirisena are planning to invite a few people for a party.

JAYAPALA

ආරාදනා කරනවා	invite
පාටිය	the party
පාටියක් දානවා	throw a party
අපි දහදොලොස් දෙනෙකුට ආරාදනා කරලා ලබන සුමානෙ දවසක පොඩි පාටියක් දාමු.	Let's invite ten or twelve people and throw a party some day next week.

SIRISENA

විනෝදෙට	for fun
ඔව්, හුඟක් කලකින් විනෝදෙට මොකුත් කරන්න බැරි උනා, නේ.	Yes, we haven't been able to do anything for fun for a long time, have we?
කාටද ආරාදනා කරන්න ඕන?	Whom should we invite?

JAYAPALA

විලීලා	Willy "and company"
විලීලාටයි ගුනේලාටයි එන්න කියමු, නේ.	Let's ask Willy, Gune, and company to come, eh?

SIRISENA

නොකියා ඉඳිමු	let's not ask
මේ පාර ගුනේලාට නොකියා ඉඳිමු.	Let's not ask Gune this time.

හපන්කම	the clever deed
කතාකරකර	while talking
වචනෙ	the word
කියන්න දෙනවා	allow to say
ඒ හාදයා ආවොත් එයාගෙ හපන්කං ගැනම කතාකරකර වෙන කෙනෙකුට වචනයක් වත් කියන්න දෙන්නෙ නෑ.	If that fellow comes, he'll just talk about his cleverness and won't give anyone else a chance to say a word.

JAYAPALA

ඒක හැබෑව. මටත් අල්ලන්නෙ නෑ පැත්තකට වෙලා වැඩ ගැනම කතාකරකර ඉන්න පාටි.	That's so. Parties at which (everyone) gets to the side and talks about work don't appeal to me, either.
ඒ උනත් මොනවාද කතා කරන්න පුළුවන්?	Still, what can you talk about?
මුල්ල	the corner
පිරිමියා	the man
මේසෙ	the table
වටකර ගන්නවා	get around, surround
හෙල්ලෙනවා	move, budge
ගැනු සේරම එක මුල්ලකට වෙනවා; පිරිමි බීම මේසෙ වටකර ගෙන එතනින් හෙල්ලෙන්නෙ නෑ.	All the women go to one corner, and the men get around the drink table and don't budge from there.

SIRISENA

ආවාවෙ	let (him) come
හැසිරෙනවා	behave, act
විලී ආවාවෙ. මිනිහා පාටියක හැසිරෙන හැටි දන්නවා.	Let Willy come. He knows how to act at a party.
විහිළුකාරයා	the jokester
විනෝද කරනවා	liven up
අපි සේනටත් එන්න කියමු.	Let's invite Sena, too.
මිනිහා විහිළුකාරයා නිසා මිනිහාට පාටිය විනෝද කරන්න පුළුවනි.	He's a jokester, so he knows how to liven up a party.

JAYAPALA

මේ ගමන	this time
මේ ගමන පිට රටින් ආපු කිපදෙනෙකුටත් එන්න කියමුකෝ.	This time, let's invite a few foreigners, too.

SIRISENA

ඔව්, ඔව්, මොනවාද කෑමට හදන්න හොඳ?	Sure. What's good to make to eat?
ඕඩරේ	the order
සිල්වර් ඩේල් එක	the Silver Dale
සැන්ඩ්විච් එක	the sandwich
පැටිස් එක	the patty
හොඳ වෙන්න	so that it's good
මස්රෝල් එක	the meat roll
හදනවාට ලේසියි හෝටලේකට ඕඩරයක් දුන්නාම.	Giving an order to a hotel is easier than making it.
සිල්වර් ඩේල් එකට කියලා සැන්ඩ්විච් ටිකකුයි පැටිස් ටිකකුයි හොඳ වෙන්න මස්රෝල් පනහක් විතරයි හදවා ගනිමු.	Let's get the Silver Dale to make a few sandwiches, a few patties, and about fifty good meat rolls.

JAYAPALA

තේ දෙන්නද කල්පනාව?	Are you thinking of serving tea?
බෝතලේ	the bottle
හවසට බෝතල කීපයක් ගෙනැල්ලා එළිවෙනකං බීම පාටියක් දාමු.	Let's get a few bottles in the afternoon and throw a drinking party until dawn.
කකා	while eating
මූන	the face
බල බල	while looking
අඩියක් ගහනවා	the drink, shot have a drink

පැටිස් කකා මූන බල බල ඉන්නවාට වැඩිය නරක ද අඩියක් ගහන එක?	Isn't it better to have a drink than (just) eat patties and look at people?

SIRISENA

ඔව්, එහෙනම් පිරිමින්ට විතරක් එන්න කියමු.	Yes. In that case, let's just invite men.
තමුසෙ මිනිස්සුන්ට කියනවා.	You invite the people.
දොලොස් දෙනෙකුට කිව්වාම ඇති.	If you ask twelve, that's enough.
මම බීම ලෑස්ති කරන්නම්.	I'll get the drinks ready.
ඒත් අපි පැටිසුයි මස්රෝලුයි හදවා ගන්න ඕන.	Even then we must get patties and meat rolls made.
අඟහරුවාදා හොඳ ද?	Is Tuesday O.K.?

JAYAPALA

හොඳයි. මිනිස්සුන්ට කියලා බලමුකො.	Fine. Let's ask the people and see.

Grammar

1. NEW NOUNS

Class 1

පැටිස් එක	the patty
සැන්ඩ්විච් එක	the sandwich
මස්රෝල් එක	the meat roll
සිල්වර් ඩේල් එක	the Silver Dale

Class 2

පාටිය	the party; gen. පාටියෙ pl. පාටි
මුල්ල	the corner; gen. මුල්ලෙ pl. මුලු
ගමන	the time, occasion; gen. ගමනෙ ; no pl.
මුන	the face; gen. මුනෙ pl. මූනු
අඩිය	the drink; gen. අඩියෙ pl. අඩි
හපන්කම	the cleverness; gen. හපන්කමේ pl. හපන්කම්

Class 3

පිටරට	the foreign country; pl. පිටරටවල්
බෝතලේ	the bottle; pl. බෝතල

Class 4

විනෝදෙ	the enjoyment, pleasure; pl. විනෝද
වචනෙ	the word; pl. වචන
මේසෙ	the table; pl. මේස
ඕඩරේ	the order; pl. ඕඩර

Class 5

පිරිමියා	the man; pl. පිරිමි
විහිලුකාරයා	the jokester; pl. විහිලුකාරයෝ

2. NEW VERBS

ආරාදනා කරනවා	invite
වටකරනවා	surround, stand around
හෙල්ලෙනවා	move
හැසිරෙනවා	behave
විනෝද කරනවා	liven up, make (others) enjoy

3. THE REDUPLICATED FORM

The reduplicated form of the verb is regularly made by repeating the past participial stem:

	Verb		Past Participle	Reduplicated Form
Class 1	කපනවා	cut	කපලා, කපාලා	කප කප
Class 2	බදිනවා	fry	බැදලා	බැද බැද
Class 3	වැටෙනවා	fall	වැටිලා, වැටීලා	වැටි වැටි

If the verb is one of those Class 1 or Class 3 verbs that has alternate past participle forms with long and short vowels (such as කපනවා and වැටෙනවා above), only the alternative with the short vowel is used in forming the reduplicated form.

Irregular:

කනවා	eat	කාලා	කකා
ගහනවා	hit	ගහලා, ගහාලා	ගගහා
වෙනවා	become	වෙලා	වෙවී
පේනවා	see	පෙනිලා	පෙනි පෙනි
ඉන්නවා	be	ඉඳලා	ඉඳ ඉඳ
දෙනවා	give	දීලා	දිදී
දානවා	put	දාලා	දදා
දනවා	burn	දාලා	දදා

The verbs එනවා 'come,' යනවා 'go' and ගන්නවා 'take' do not have a reduplicated form.

The reduplicated form indicates action which is simultaneous with the action expressed by the main verb. The common English equivalent is a clause or verbal phrase introduced by 'while':

අර මහත්තයා පොතක් බල බල කෑම කනවා.
That gentleman is eating while reading a book.

කෑම කකා කතා කරන්න එපා.
Don't talk while eating!

When the main verb is ඉන්නවා, the construction with the reduplicated verb usually implies that an action is in process or going on. The English equivalent is likely to vary considerably with the situation:

කතා කර කර ඉන්න පාටි මට අල්ලන්නෙ නෑ.
I don't like a party where people just talk.

මහත්තයගෙ වැඩේ සිගරට් බිබී ඉන්න එක.
The master does nothing but smoke. (The master's occupation is smoking.)

අපි එන කොට ඒ ගොල්ල කතා කර කර උන්නා.
When we came they were talking.

4. NEGATIVE PAST PARTICIPLE

When the negative past participle of a verb is used with the main verb ඉන්නවා the implication is that the action is not going on.

එයා කෑම නොකා ඉන්නවා.
He isn't eating.

ඔහේ නොගිහින් ඉන්න.
Don't go.

When this construction is used with the first person imperative form of ඉන්නවා, it serves as a negative imperative of the first person:

අපි ඒ ෂෝ එකට යමු.
Let's go to that show.

අපි ඒ ෂෝ එකට නොගිහින් ඉඳිමු.
Let's not go to that show.

අපි අද බීර බොමු.
Let's have beer today.

අපි අද බීර නොබී ඉඳිමු.
Let's not have beer today.

5. 'TO LET'

5.1 The verb දෙනවා with a dependent infinitive has the meaning 'to allow, permit, let.' The person or thing involved is in the dative case:

එයාට පොත් කියවන්න දෙන්න.
Let him read the book.

ළමයාට ඇවිදින්න යන්න දෙන්න එපා.
Don't allow the boy to go for a walk.

දැන් බස් එකට යන්න දෙන්න.
Now let the bus go.

5.2 The Sinhalese equivalent of English constructions implying 'I don't care, I don't mind,' or 'I can't do anything about it anyway' is expressed with a special form of the verb. This form is made for all verbs by adding -වෙ to the simple past form:

Verb	Simple Past	-වෙ Form
කපනවා	කැපුවා	කැපුවාවෙ
අදිනවා	ඇද්දා	ඇද්දාවෙ
වැටෙනවා	වැටුනා	වැටුනාවෙ
යනවා	ගියා	ගියාවෙ
කරනවා	කෙරුවා	කෙරුවාවෙ

This form of the verb occurs only with the third person subjects either singular or plural.

ඒ ගොල්ල ආවාවෙ.
Let them come (I don't care).

බංඩා වැඩ කෙරුවාවෙ.
Let Banda work, then (It's all right with me).

ළමයාට පෙනුනාවෙ.
Let the boy see (What do I care?).

6. 'DOESN'T APPEAL TO'

The verb අල්ලනවා 'catch' may be used in the negative with the meaning 'not to appeal to.' The person involved is in the dative case:

ඒක මට අල්ලන්නෙ නෑ.
That doesn't appeal to me.

7. වැඩියෙ

7.1 The form වැඩියෙ 'more than' may be used with the simple form of the verb inflected for dative case. This is the equivalent of English 'than' plus a verb in the '-ing' form or the infinitive form. As with other වැඩියෙ constructions, the වැඩියෙ may be dropped.

කෝච්චියෙන් යන එක බස් එකෙන් යනවාට වැඩියෙ අමාරුයි.
Going by train is more difficult than going by bus.

මම යනවාට වැඩියෙ හොඳයි තමුසෙ යන එක.
It's better for you to go than for me.

හදනවාට ලේසියි හෝටලේකට ඕඩරයක් දුන්නාම.
Giving an order to a hotel is easier than making them.

7.2 The expression වැඩියෙ නරක නෑ, literally 'is it worse?', is used in the meaning 'isn't it better?':

පොත් ලියනවාට වැඩියෙ නරක ද උගන්නන එක?
Isn't teaching better than writing books?

8. -ලා 'AND COMPANY'

The animate plural suffix -ලා , in addition to having plural meaning may have the meaning 'and others, and company.' The others are usually a recognizable group such as a family or a group of friends:

ගුනේලාට නොකියා ඉඳිමු.
Let's not invite Gune and his family.

අම්මලා කොලඹට ගියා.
Mother and the rest went to Colombo.

9. කො

Certain people add කො to an imperative to indicate intimacy or friendliness. However, it is not only difficult to state the conditions under which its use is permissible, but it may in some contexts have other connotations such as anger or scorn. Hence the student should be prepared to recognize it, but not attempt to use it himself.

පිටරටින් ආපු කිපදෙනෙකුටත් එන්න කියමුකො.
Let's invite a few people who have come from abroad.

දැන් ඉතින් කැම ටිකක් කමුකො.
So let's eat a little now.

10. වෙන්න

The infinitive of වෙනවා with a dependent adjective may be used adverbially with the meaning 'such that, so that.'

හොඳ වෙන්න මස් කරියක් හදන්න.
Make a good meat curry (such that it may be good).

අකුරු ලොකු වෙන්න ලියන්න.
Write so that the letters are big.

මට සීනි අඩු වෙන්න තේ එකක් හදන්න.
Make me a cup of tea without too much sugar.

11. IDIOMS

11.1 The verb ගහනවා 'hit, strike' is used idiomatically in the expression අඩියක් ගහනවා 'to drink,' 'have a drink.'

11.2 'To invite, ask someone here' may be expressed by ආරාදනා කරනවා with the person or people invited in the dative case, but note that it may also be expressed, where the context is clear, in other ways, such as එන්න කියනවා, or occasionally just කියනවා, also with the person or people invited in the dative case:

අපි දහදොලොස් දෙනෙකුට ආරාදනා කරමු.
Let's invite ten or twelve people.

විලීලාට එන්න කියමු.
Let's ask Willy and company, eh?

මිනිස්සුන්ට කියලා බලමු.
Let's ask people and see.

Exercises

A. Substitute orally:

1. .... මට අල්ලන්නෙ නෑ.

going to parties every evening
the way they make sandwiches in this shop
eating patties and talking to people
how the children behave in this class
how the women dance in that film
getting a few bottles and drinking until dawn
inviting those people to this party
the way those men go to a corner and talk about business

2. .... නරක ද නිකං ඉන්න එක?

rather than going to parties all the time
rather than walking around in this sunshine
rather than going to listen to that dull speech
rather than eating hot food
